# 2026.05.12 දින පඬුවස්නුවර ප්‍රාදේශීය සභාවේ පවත්වන ලද මහා සභාරැස්වීමේ රැස්වීම් වාර්තාව

## රැස්වීම සඳහා සහභාගිවූ ගරු මන්ත්‍රීවරුන්

1. ගරු ප්‍රාදේශීය සභා සභාපති යහලවෙල ගෙදර සංජීව කරුණාසාගර මහතා
2. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි දෙලංකාගේ නිමාලි දිල්හානි මෙනෙවිය
3. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කඩුකාර මුදියන්සේලාගේ නන්දසිරි මහතා
4. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දසනායක ගුණරත්න බස්නායක මුදියන්සේලාගේ චාමින්ද දසනායක මහතා
5. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මහමායාගොඩගේ විරාජ් මලින්ද ඩයස් මහතා
6. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි ඉදිරිප්පුලිගේ සඳනා දිල්හානි ප්‍රනාන්දු මහත්මිය
7. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි මුතුගල නිශාන්ති ගුණතිලක මහත්මිය
8. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පනම්බර මුදියන්සේලාගේ කුමාරසේන ජයලත් මහතා
9. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අගාරේ ගෙදර දූරයාලගේ රංජිත් ප්‍රේමලාල් මහතා
10. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි නිමල්කා කොටඹගේ මහත්මිය
11. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රන්පටිදේවගේ ලාලිත ඉඳුනිල් මහතා
12. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී හේරත් මුදියන්සේලාගේ සමරසිංහ කීර්ති බංඩාර හේරත් මහතා
13. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී විජේන්ද්‍ර ගල්අද්දලාගේ අජිත් ලක්ෂ්මන් මහතා
14. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අකුරන් පේඩි දූරයලාගේ ඉෂාන් මධුශංක පීරිස් මහතා
15. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුසේ හේවගේ මාලක අරුණ කුමාර මහතා
16. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි එදිරිසිංහ ආරච්චිලාගේ ඉරාෂි ප්‍රියදර්ශනී මහත්මිය
17. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බ්‍රහ්මචාරිගේ සුදත් උදය කුමාර මහතා
18. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි සේනානායක මුදියන්සේලාගේ සජිනා සුරංගි මහත්මිය
19. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජයසිංහ මුදියන්සේලාගේ දිලිප් ජයසිංහ මහතා
20. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී විස්කම් නන්දන වඩු ආචාරිගේ රංජිත් නවරත්න මහතා
21. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මාපා අශෝක හේරත් මහතා
22. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී චන්ද්‍රාධිපතියලාගේ රංජිත් අබේපාල මහතා
23. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රන්හොටි හලුවන්නැහැලාගේ රංජිත් උපාලි මහතා
24. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මොහම්මදු තාහීර් මොහමඩ් තස්ලිම් මහතා
25. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රාජගුරු දිසානායක මුදියන්සේලාගේ ජයන්ත දිසානායක මහතා
26. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බන්නැහැක මුදියන්සේලාගේ ශ්‍රියානි මානෙල් බන්නැහැක මහත්මිය
27. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි වීරරත්න තෙන්නකෝන් මුදියන්සේලාගේ චාන්දනී දීපිකා රත්නායක මහත්මිය
28. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි රාජකරුණානායක මුදියන්සේලාගේ නිලන්ති විජේසිංහ මහත්මිය
29. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මොහමඩ් කබීර් රිෆාක් හුසේයින් මහතා
30. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දොලවත්තගේ දොන් සිරන්ත පද්මලාල් මහතා
31. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මල්ලව ආරච්චිලාගේ මංජුල ප්‍රසන්න මල්ලව ආරච්චි මහතා

## රැස්වීම සඳහා සහභාගි නොවූ ගරු මන්ත්‍රීවරුන්

1. ගරු ප්‍රාදේශීය සභා උප සභාපති බන්දුල සමරවික්‍රම මහතා
2. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මැණිකාමාර දූරයලාගේ මනෝ කුමාර එදිරිසිංහ මහතා
3. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අලහකෝන් පතිරන්නැලාගේ තරංග චම්පික අලහකෝන් මහතා
4. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී හේරත් මුදියන්සේලාගේ ප්‍රදීප් සුජීව හේරත් මහතා

5. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී හේරත් මුදියන්සේලාගේ නිශ්ශංක රම්‍යකුමාර හේරත් මහතා
6. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කුරුප්පු මුදියන්සේලාගේ අජිත් තිලකසිරි මහතා
7. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රත්නායක මුදියන්සේලාගේ උපුල් නිශාන්ත මහතා

## ආගම සිහි කිරීම.

ප්‍රථමයෙන් ජාතික ගීය වාදනය කිරීමෙන් , ආගම සිහිකිරීමෙන් අනතුරුව මිය ගිය රණවිරුවන් සිහිකර ගරු සභාපති වයි.ජී. සංජීව කරුණාසාගර මහතාගේ ප්‍රධානත්වයෙන් පෙ.ව. 10.00 ට පමණ ගරු සභාවේ කටයුතු න්‍යාය පත්‍රානුකූල ආරම්භ කරන ලදී. 2026 මැයි මස මහා සභා රැස්වීමට සහභාගි වන ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මණ්ඩලය ,ලේකම්තුමිය ඇතුළු කාර්යමණ්ඩල නිලධාරීන් , මාධ්‍යවේදීන් ඇතුළු සහභාගි වී සිටින සියළුදෙනාට ගරු සභාපති වයි.ජී. සංජීව කරුණාසාගර මහතා සුභ උදෑසනක් ප්‍රාර්ථනා කරන ලද අතර සියළුදෙනාම ගෞරවයෙන් පිළිගන්නා ලදී.

## 06 (අ). 1.පසුගිය මහා සභා රැස්වීමේ වාර්තාව සම්මත කිරීම .

**ගරු සභාපති වයි.ජී. සංජීව කරුණාසාගර මහතා**

2026.04.07 වන දින පැවති මහා සභා රැස්වීමේ රැස්වීම් වාර්තාව සම්මත කරගන්නා ලෙස ගරු සභාවෙන් ඉල්ලා සිටිනවා.

**ගරු මන්ත්‍රී ඒ.පී.ඩී. ඉෂාන් මධුශංක පීරිස් මහතා - (ජා.ජ.බ)**

සුභ උදෑසනක් ගරු සභාපතිතුමනි, ගරුසභාපතිතුමා ඇතුළු මන්ත්‍රි මණ්ඩලයෙන් අවසරයි. ලේකම්තුමිය ඇතුළු කාර්ය මණ්ඩලයෙන් අවසරයි.පසුගිය මහ සභා රැස්වීම් වාර්තාව සංශෝධන ඇත්නම් ඒවාද ඇතුලත්ව සම්මත කිරීම සුදුසු බවට මා යෝජනා කරනවා.

**ගරු මන්ත්‍රී ඩබ්.එන්.ඩබ්.ඒ.රංජිත් නවරත්න මහතා - (ජා.ජ.බ)**

ගරු සභාපතිතුමා ඇතුළු මන්ත්‍රි මණ්ඩලයෙන් අවසරයි. ලේකම්තුමිය ඇතුළු කාර්ය මණ්ඩලයෙන් අවසරයි. එම යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රිනී ඩී. නිමාලි දිල්හානි මෙනවිය - ( ස.ජ.බ)**

සුභ දවසක් ප්‍රාර්ථනා කරනවා සියළුදෙනාටම.මූලාසනය හොබවන සභාපතිතුමා,ගෞරවනීය මන්ත්‍රී මණ්ඩලය, ලේකම්තුමිය ප්‍රමුඛ කාර්ය මන්ඩලයෙන් අවසරයි. ගරු සභාපතිතුමනි, මේ වාර්තාවේ 6 වෙනි පිටුවෙ IV වෙනි කාරනාව යටතේ ගැසට් කිරීමට නියමිත මාර්ග ලැයිස්තුව නම් කරලා තියනවා.ඒකෙ ගරු සභාපතිතුමනි කොළඹගම කොට්ඨාශයේ කටුමුළුව දිවුල්පොත ඉඩම දක්වා ඇති මාර්ගය කියලා තියනවා.ඒක දිවුල්හේන වත්ත කියලා තමයි ඒ ඉඩම නම් වෙලා තියෙන්නෙ.

**ගරු සභාපති වයි.ජී. සංජීව කරුණාසාගර මහතා**

ඒක සංශෝධණය වෙනවා මන්ත්‍රීතුමිය

**ඒ අනුව පසුගිය මහා සභා රැස්වීම් වාර්තාව සංශෝධන සහිතව පිළිගැනීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ එදින පැමිණි සිටි සභිකයන් විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී.**

## (ආ).සභාපතිවරයා විසින් කරනු ලබන විශේෂ නිවේදන.

**ගරු සභාපති වයි.ජී. සංජීව කරුණාසාගර මහතා**

හිටපු සභාපතිවරයෙක් වගේම වර්තමාන මන්ත්‍රීවරයෙක් වන රංජිත් උපාලි ගරු මන්ත්‍රීතුමා සුවය ලබලා අද දින සභාවට සම්බන්ධ වෙලා ඉන්නවා.අපි බෙහෙවින් සතුටු වෙනවා ඔබතුමා නිරෝග සුවයෙන් සභාවට සම්බන්ධ වීම සම්බන්ධයෙන්.

ඒ වගේම 2027 වර්ෂය සඳහා පඩුවස්නුවර ප්‍රාදේශිය සභාවේ සහභාගිත්ව අයවැය සකස් කිරීම සඳහා පක්ෂ විපක්ෂ ගරු මන්ත්‍රිමණ්ඩලයෙන් සංවර්ධන යෝජනා ලබා ගැනීම සඳහා ඔබතුමාලට, ඔබතුමාලගෙ මේසෙ ඇති යෝජනා ඉදිරිපත් කිරීම සඳහා අදාල වුන පෝරමයක් පුරවන්න.ඒ පෝරමය පුරවලා යෝජනා ටික ඉදිරිපත් කරන්න.ඊට පස්සෙ අපි අයවැයට පෙර සියළු දෙනාම එකතුවෙලා සාකච්ඡා කරලා අයවැය සකසන්නෙ කොහොමද කියලා සාකච්ඡාවක් ගමු.2027 වර්ෂයේ අයවැය සඳහා.

ඊළඟට කසල උත්පාදන ස්ථානයේදීම වෙන්කර ලබා ගැනීම සඳහා හෙට්ටිපොල භූමියේ වෙළඳ ප්‍රජාව දැනුවත් කරන්න හෙට්ටිපොල පොල භූමියේ ගත්තොත් එහෙම වෙළෙන්දො සියළු කසල වර්ග සියල්ල එකට දාලා කලවම් කරලා තියෙන්නෙ.අපි ඒ හින්දා ගිය අවුරුද්දෙ යෝජනා කරගත්තා ඒ සඳහා බකට් වෙනම මිලදී අරගෙන ඒවා ස්ථානගත කරන්න සහ ට්‍රැක්ටරයක් එදා දවස ඇතුලත ගාල් කරලා ඒ දවස ඇතුලත කසල මුදාහරින්න. එතකොට කසල තැන තැන තියෙන්නෙ නෑ. පහසුවෙන් කසල ටික රැගෙන යන්න පුළුවන් කම තියෙනවා.මීට පෙර දෙවතාවක් අපි පොලේ වෙළඳුන් දැනුවත් කලා නමුත් මේ සතියෙත් ලබන සෙනසුරාදා 16 වෙළෙන්දො දැනුවත් කරන්න වැඩසටහනක් යොදාගෙන තියනවා. ඒ සඳහා ඔබ සියළු මන්ත්‍රීතුමන්ලා තුමියන්ලාට ආරාධනා කරනවා සෙනසුරාදා දවසෙ සම්බන්ධවෙන්න කියලා වෙළඳ ප්‍රජාව දැනුවත් කිරීමේ වැඩසටහන සඳහා.

ඊළඟට නිවාස හා නගර සංවර්ධන ආඥාපනතට අදාල අතුරු ව්‍යවස්ථාවක් සම්පාදනය සම්බන්ධ වැඩමුළුවක් පවත්වන්න 2026.05.20 වන දින පෙ.ව 9.00 සිට ප.ව 4.00 දක්වා පඩුවස්නුවර ප්‍රාදේශීය සභා ප්‍රජා ශාලාවේදී පැවැත්වෙනවා.අතුරු ව්‍යවස්ථා හදන විදිහ අපි ඉගනගන්න ඕන.ඒ හින්දා ඒ වැඩසටහන සඳහා සියළු මන්ත්‍රීතුමන්ලා තුමියන්ලාට ආරාධනා කරනවා එදිනට සම්බන්ධ වෙන්න කියලා.

ඒ වගේම තමයි අපි දැක්කා මේ පහුගිය දිනක සමාජ මාධ්‍යයේ හෙට්ටිපොල බස් නැවතුම්පළ සම්බන්ධයෙන් සමාජ මාධ්‍ය කළඹපු වීඩියෝවක් යනවා.ඇත්තටම සභාව අපි භාරගත්තට පස්සෙ අපිත් මුහුණ දුන්න ගැටළුවක් තමයි ඒක.බස් නැවතුම්පලේ උඩ හදලා තියන සිවිලිමේ පරවියො ඉන්නෙ. එතකොට මේ සිවිළිම කලින් තිබුන විදිහ වෙනස් කරලා පස්සෙ හැදුවයි කියලා තියනවා. නමුත් ඒක අස්සට පරවියො රිංගලා ජරා කරලා ඒ ජරාව වෙන තැන් වලට වැටෙනවා කියලා චෝදනාව තමයි ආවේ.ඒ නිසා අපි මැදිහත් වෙලා රෑ එළිවෙනකම් දෙපැත්ත බැඳලා තිබුනෙ නෑ. දෙපැත්තත් බැන්දා. ස්වෙච්ඡාවෙන් ශ්‍රමදානයක් දාලා.මේකෙ එල්ලෙන සිවිළිමක් තියෙන්නෙ. යට සම්පූර්ණයෙන් වහලා තිබුනෙ නෑ. ස්ථිර සාර විසඳුමක් මේකට ඕන වෙනවා.ඒ නිසා ඉංජිනේරු මහත්තයා, ටීඕ මහත්තුරු යොදලා හැම කාමරේකටම නෙට් එකක් දාන්න සැලසුම් කරලා තියනවා.ඒකෙනුත් අපි උත්සාහ කරමු මේක විසඳගන්න පුළුවන්ද කියලා. හැබැයි වීඩියෝ පටියෙ තිබුන ඒවට අපි එකඟ නෑ.මොකද මෙයා හිටපු මන්ත්‍රීවරයෙක්. මේ හිටපු මන්ත්‍රීවරයා අර සිවිළිම ගලවලා සුද්ද කරලා සම්පූර්ණයෙන්ම බිමට දාලා බිත්තරත් බිම තියලා පරවියො ටිකත් බිම තියලා වීඩියෝ කරනවා.මේ වීඩියෝ එකෙන් ප්‍රදර්ශනය කරන්න හදන්නෙ ප්‍රාදේශීය සභාවට කිසි දෙයක් කරගන්න බෑ වගේ එකක්.ඒකට අපි එකඟ නෑ. මොකද වටේ ආවරණය කළා.හැබැයි සිවිලිම සුද්ධ කරන්න අපි ගියෙ නෑ.මම ඊට පස්සෙ වීඩියෝ කරගෙන ආවා.දැන් එහෙම ගැටළුවක් නෑ. අපි ගාව තියනවා ඒ වීඩියෝ ඒ කඩ කාමරේ. දැන් එහෙම ප්‍රශ්නයක් නෑ.හැබැයි තාමත් ටික ටික මේ පරවියන්ගෙ ප්‍රශ්න තියෙනවා.ඒ නිසා ඒකට අපි ස්ථිරසාර විසඳුමකට යන්න ඕන.දැන් එයා කියනවා හිඟ නැතිව අඩු නැතිව බදු ගෙවනවා මුදල් ගෙවනවා කියලා.ඇත්තටම වෙච්ච කාරණාව සභාවට පැහැදිලි කරන්න ඕන.මෙයා මේක පාවිච්චි කරන්නෙ බදු නොගෙවා ඉන්න.කාලයක් තිස්සෙ බදු ගෙවන්නෙ නැතිව හිර කරගෙන හිටියා මේ කතාව කිය කිය ගෙව්වෙ නෑ.ඊට පස්සෙ අපි කොටසක් සභා තීන්දුවකුත් ගත්තා බදු කොටසක් නිදහස් කරලා දෙන්න කියලා පලාත් පාලනේට යවලා දැන් 50% මාස තුනකට නිදහස් කරලා දීලත් තියනවා.ඊට පස්සෙ මෙයා මාස ගානක් ගෙවන්නෙ නැතිව ඉදලා අන්තිමට කාලය පැන්නට පස්සෙ සභාව තීරණය කරා මේක සීල් කරන්න. කඩ කාමර සීල් කරා. කඩ කාමර සීල් කරපු දවසට පහුවදා ඇවිල්ලා මෙයා අර සම්පූර්ණ මුදල ගෙව්වා. අඩු නැතිව මේ ගෙවන්නෙ මොනවා කරාට පස්සෙද කඩේ සීල් කරාට පස්සෙ.ඊට පස්සෙ ඊයෙත් ඇවිල්ලා හදිස්සියෙ සල්ලි බැදලා තියනවා හෙට දැන් මහ සභාව තියනවා නේද අඩුවෙලා තිබ්බොත් හදිස්සියෙ කියලා නිලධාරිත් එක්ක. සල්ලි බැදලා තියනවා. ඒ නිසා කට්ටි පැනලා මේක පෙන්නලා මේ මුදල් නොගෙවා ඉන්න උත්සාහයක් තියෙන්නෙ.ඒ වගේම කඩ අතුරු බදු දීලා තියනවා.ඒ නිසා අතුරු බදු දෙන එක ඔඩිට් කුවරි එකකුත් ඇවිල්ලා තියනවා වහාම ඉවත් කරන්න කියලා.එතකොට මෙතුමා අතුරු බදු දීලා තියනවා.අතුරු බදු දීපු කඩ නැවත පවරා ගැනීමක් කරන්න කියලා තියනවා.ඒ නිසා සමාජ මාධ්‍ය කළඹන්න උත්සාහ කරනවා. අපේ මන්ත්‍රීතුමාලත් කීප දෙනෙක් බලන්න ගිහින් තිබුනා.

**<u>ගරු මන්ත්‍රී ආර්. එච්. රංජිත් උපාලි මහතා - (ස්වාධීන)</u>**

සභාපතිතුමා නිවේදන යටතේ දැනුම් දෙන්න පුළුවන්ද ප්‍රජා ශාලාවේ නවතම තත්වය පිලිබඳව.

**<u>ගරු සභාපති වයි.ජී. සංජීව කරුණාසාගර මහතා</u>**

ඇත්තටම අපි එනකොටම මේකෙ වේදිකාව ගැලෙව්වා.ඊට පස්සෙ මේක හදන්න කියලා දුනුපොත කපාගෙන ආපු මාර ගහේ ලෑලි යොදාගෙන ඒකෙන් මේක හදමු කියලා ලෑස්ති කරලා තියෙද්දි කව්රුහරි පෙත්සම් ගහලා තියනවා.මේකෙ ලෑලි ටික මම ගෙදර ගෙනිච්චා කියලා.සමාජ මාධ්‍යයෙත් ලොකු කැලඹීමකට පත්වුනා.ඊට පස්සෙ අපි තීරණය කරා ඒ ලෑලි අපි දැව සංස්ථාවට දෙමු අපිට අයිති නැත්තම්.දීලා අපි දැන් හදමු කියලා. අපි මේ වෙනකොට ඇස්තමේන්තු හදලා මිල ගනන් කැඳවන්න සූදානම් කරලා තියනවා ලෑලි. මේ ලෑලි හොඳ ශක්තිමත් ලෑලි වෙන්න ඕනී වගේම තිබුන ලෑලි පාවිච්චි කරන්න බෑ කියලා.ඒ ලෑලි නැවත පාවිච්චි කරන්න ගියොත් තුනී වෙනවා.එතකොට වේදිකාවේ ශක්තිය අඩු වෙනවා කියන කථාවත් එක්ක නැවත අලුතින් සම්පූර්ණ ලෑලි දාමු කියන යෝජනාව තියනවා.හොදට වේලිච්ච ලෑලි වෙන්න ඕනි.අමු ලෑලි දැම්මොත් එහෙම ඇකිලෙන්න බලනවා.ඒ නිසා ජූනි මාසෙ අවසන් වෙන්න කලින් මේක හදලා ඉවර කරන්න .මොකද සමහර ප්‍රසම්පාදන ක්‍රියාවලදි මාස දෙක තුනක් යනවා. සමහර වැඩ වලදි. යෝජනාව දාන්න ඕනි. මුදල් කමිටුවට, නැත්තම් සභාවට .ඊට පස්සෙ මිළ කැඳවන්න ඕන.

**<u>ගරු මන්ත්‍රී ආර්. එච්. රංජිත් උපාලි මහතා - (ස්වාධීන)</u>**

නිවේදන යටතේ පැහැදිලි කිරීම්වලට ඉඩ නැතිවුනත් මම ඔබතුමාට කියන්න ඕන.අර දැව සංස්ථාවට ලී ටික අරගෙන තියනවා නමුත් එහෙම අරගෙන යන්න බෑ සභාපතිතුමා සභාවට අයිති පාරක සභාවට අයිති ගහක් කපන්න නීත්‍යානුකූල තත්වයක් තියනවා.ඒ නීතියට අනුව තමයි ගහ කපලා ගෙනාවේ.හැබැයි දැව සංස්ථාවට මේ ලී අරගෙන යන්න බෑ.ඒ පිලිබඳව ඔබතුමාලා නිවැරදි ක්‍රියාමාර්ග ගත්තෙ නෑ.ආණ්ඩුකාරවරයා දැනුවත් කරලා මේක පැහැදිලිව නවත්වන්න පුළුවන්කමක් තිබුනා.ඔබතුමාගෙ ආණ්ඩුකාරවරයා, ඔබතුමාගෙ ආණ්ඩුව ඒක වුනේ නෑ.මගෙ පාලනය කාලෙ මම ඔය වගේ ගස් හතරක් පහක් කපලා තියනවා. අපි ගස් වෙන්දේසි කරා. මං හිතන්නෙ ප්‍රජා ශාලාව දැන් ආදායම් අඩුවුනා මේ අවුරුද්ද ඇතුලතම ආදායමක් ගත්තෙ නෑ. සියළුම දේවල් මලගනේ පන්සලේ ශාලාවට තමයි යන්නෙ.අපි ඉල්ලීමක් කරනවා.හැකි ඉක්මනට අළුත්වැඩියාව කරන්න කියලා.

**<u>ගරු සභාපති වයි.ජී. සංජීව කරුණාසාගර මහතා</u>**

බොහොම ස්තුතියි පැහැදිලි කිරීමට.නමුත් ඔය සම්බන්ධව නීතිමය තත්වය විමසා තමයි.සභාපතිවරුන් දැනුවත් කිරීමේ වැඩසටහනකුත් පැවැත්වුනා.ඒකෙදි සභාව සතු ඉඩම්වල ගස්වල අයිතිය සභාවට තියනවා.හැබැයි සභාව සතු මාර්ගවල දේපල වල අයිතිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට තමයි තියෙන්නෙ ප්‍රාදේශීය ලේකම්ට අයිති භූමිවල ගස් ප්‍රාදේශිය ලේකම් හෝ රජයේ අනිකුත් ආයතනවල ගස්වල අයිතිය කැපුවයින් පස්සෙ දැව සංස්ථාවට.ඒ හින්දා අපි විමසලා බලලා තමයි දුන්නෙ.මාර්ගය අපේ වුනාට මාර්ගය සතුව තියෙන දේපලවල ගස්වල අයිතිය ප්‍රාදේශිය ලේකම්ට ඒ අනුව තමයි අපිට ලෑලි දෙන්න වුනේ.අපි නැවත විමසීමක් කරමු. නමුත් මේක තමයි නීතිමය තත්වය.

## (ඇ).ප්‍රාදේශීය සභාව අමතා එවන ලද සංදේශ,පෙත්සම්,පැමිණිලි හා සන්නිවේදන.

## 1.නිවාඩු අනුමත කිරීම.

**<u>ගරු සභාපති වයි.ජී. සංජීව කරුණාසාගර මහතා</u>**

උප සභාපති බන්දුල සමරවික්‍රම මහතා ,මනෝකුමාර එදිරිසිංහ මන්ත්‍රීතුමා , ආර් එම් උපුල් නිශාන්ත මන්ත්‍රීතුමා, එච්.එම්.ප්‍රදීප් සුජීව හේරත් මන්ත්‍රීතුමා, නිශ්ශංක රම්‍යකුමාර හේරත් මහතා,කේ එම් අජිත් තිලකසිරි මන්ත්‍රීතුමා, තරංග චම්පික අලහකොන් මන්ත්‍රීතුමා නිවාඩු ඉල්ලලා තියෙනවා. එතුමන්ලගෙ නිවාඩු අනුමත කරලා දෙන්න කියලා ඉල්ලා සිටිනවා.

**<u>ගරු මන්ත්‍රී ඒ.පී.ඩී. ඉෂාන් මධුශංක පීරිස් මහතා - (ජා.ජ.බ)</u>**

ගරු සභාපතිතුමාගෙන් අවසරයි.ඒ වගේම ලේකම්තුමියගෙනුත් ගෞරවනීය මන්ත්‍රී මණ්ඩලයෙනුත් අවසරයි.ගරු සභාපතිතුමනි, අද දින නිවාඩු ඉල්ලලා ඇති ගරු මන්ත්‍රීවරුන්හට නිවාඩු අනුමත කිරීම සුදුසුයි කියලා මං යෝජනා කරනවා.

<u>**ගරු මන්ත්‍රී කේ.එම්. නන්දසිරි මහතා - ( ස.ජ.බ)**</u>

ඒ යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

**ඒ අනුව ප්‍රාදේශීය සභා ගරු උප සභාපති බන්දුල සමරවික්‍රම මහතා , ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එම්.ඩී මනෝකුමාර එදිරිසිංහ මහතා , ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ආර් එම් උපුල් නිශාන්ත මහතා, ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එච්.එම්.ප්‍රදීප් සුජීව හේරත් මහතා, ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී නිශ්ශංක රම්‍යකුමාර හේරත් මහතා, ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී කේ එම් අජිත් තිලකසිරි මහතා, ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඒ.පී තරංග චම්පික අලහකොන් මහතා වෙත නිවාඩු අනුමත කිරීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ එදින පැමිණි සිටි සභිකයන් විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදි.**

**II.2026.03.27 වන දින මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කමිටුව සඳහා සහභාගී නොවූ මන්ත්‍රීවරුන්ගේ නිවාඩු අනුමත කිරීම.**

<u>**ගරු සභාපති වයි.ජී. සංජීව කරුණාසාගර මහතා**</u>

2026.03.27 වන දින මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කමිටුව සඳහා සහභාගී නොවූ ගරු උප සභාපති බන්දුල සමරවික්‍රම මහතා, ගරු මන්ත්‍රී එම්.ජී විරාජ් මලින්ද ඩයස් මහතා, ගරු මන්ත්‍රී එම්.ඩී මනෝ කුමාර එදිරිසිංහ මහතා, ගරු මන්ත්‍රී ආර්.එච්.රංජිත් උපාලි මහතා, ගරු මන්ත්‍රී ජේ.එම්.දිලිප් ජයසිංහ මහතා, ගරු මන්ත්‍රී ඒ.පී.තරංග චම්පික අලහකෝන් මහතා,ගරු මන්ත්‍රී එස්.එච්.මාලක අරුණ කුමාර මහතා,ගරු මන්ත්‍රී ඩබ්.ජී.අජිත් ලක්ෂ්මන් මහතා වෙත නිවාඩු අනුමත කරන මෙන් ගරු සභාවෙන් ඉල්ලා සිටිනවා.

<u>**ගරු මන්ත්‍රී ඒ.පී.ඩී. ඉෂාන් මධුශංක පීරිස් මහතා - (ජා.ජ.බ)**</u>

ගරු සභාපතිතුමනි, 2026.03.27 දින මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කමිටුව සඳහා සහභාගී නොවූ ගරු මන්ත්‍රීවරුන් හට නිවාඩු අනුමත කිරීම සුදුසුයි කියලා මං යෝජනා කරනවා

<u>**ගරු මන්ත්‍රී සී.පී. රංජිත් අබේපාල මහතා - (ස්වාධීන)**</u>

ගරු සභාපතිතුමා ඇතුළු සභාවෙන් අවසරයි.එම යෝජනාව මා ස්ථිර කරනවා.

**ඒ අනුව 2026.03.27 වන දින මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කමිටුව සඳහා සහභාගී නොවූ ගරු උප සභාපති බන්දුල සමරවික්‍රම මහතා, ගරු මන්ත්‍රී එම්.ජී විරාජ් මලින්ද ඩයස් මහතා, ගරු මන්ත්‍රී එම්.ඩී මනෝ කුමාර එදිරිසිංහ මහතා, ගරු මන්ත්‍රී ආර්.එච්.රංජිත් උපාලි මහතා, ගරු මන්ත්‍රී ජේ.එම්.දිලිප් ජයසිංහ මහතා, ගරු මන්ත්‍රී ඒ.පී.තරංග චම්පික අලහකෝන් මහතා,ගරු මන්ත්‍රී එස්.එච්.මාලක අරුණ කුමාර මහතා,ගරු මන්ත්‍රී ඩබ්.ජී.අජිත් ලක්ෂ්මන් මහතා වෙත නිවාඩු අනුමත කරන ලෙසට ගෙන ආ යෝජනාව ගරු සභාවේ එදින පැමිණි සිටි සභිකයන් විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී .**

**III.2026.03.27 වන දින පැවති ප්‍රසම්පාදන කමිටුව සඳහා සහභාගී නොවූ මන්ත්‍රීවරුන්ගේ නිවාඩු අනුමත කිරීම.**

<u>**ගරු සභාපති වයි.ජී. සංජීව කරුණාසාගර මහතා**</u>

2026.03.27 වන දින පැවති ප්‍රසම්පාදන කමිටුව සඳහා සහභාගී නොවූ ගරු උප සභාපති බන්දුල සමරවික්‍රම මහතා, ගරු මන්ත්‍රී එම්.ජී විරාජ් මලින්ද ඩයස් මහතා, ගරු මන්ත්‍රී එම්.ඩී මනෝ කුමාර එදිරිසිංහ මහතා, ගරු මන්ත්‍රී ආර්.එච්.රංජිත් උපාලි මහතා, ගරු මන්ත්‍රී ජේ.එම්.දිලිප් ජයසිංහ මහතා, ගරු මන්ත්‍රී ඒ.පී.තරංග චම්පික අලහකෝන් මහතා,ගරු මන්ත්‍රී එස්.එච්.මාලක අරුණ කුමාර මහතා,ගරු මන්ත්‍රී ඩබ්.ජී.අජිත් ලක්ෂ්මන් මහතා වෙත නිවාඩු අනුමත කරන මෙන් ගරු සභාවෙන් ඉල්ලා සිටිනවා.

<u>**ගරු මන්ත්‍රී ඒ.පී.ඩී. ඉෂාන් මධුශංක පීරිස් මහතා - (ජා.ජ.බ)**</u>

2026.03.27 වන දින පැවති ප්‍රසම්පාදන කමිටුව සඳහා සහභාගී නොවූ ගරු මන්ත්‍රීවරුන් නිවාඩු අනුමත කිරීම සුදුසුයි කියලා මං යෝජනා කරනවා

ගරු මන්ත්‍රී සී.පී. රංජිත් අබේපාල මහතා - (ස්වාධීන)

එම යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

**ඒ අනුව 2026.03.27 වන දින පැවති ප්‍රසම්පාදන කමිටුව සඳහා සහභාගී නොවූ ගරු උප සභාපති බන්දුල සමරවික්‍රම මහතා, ගරු මන්ත්‍රී එම්.ජී විරාජ් මලින්ද ඩයස් මහතා, ගරු මන්ත්‍රී එම්.ඩී මනෝ කුමාර එදිරිසිංහ මහතා, ගරු මන්ත්‍රී ආර්.එච්.රංජිත් උපාලි මහතා, ගරු මන්ත්‍රී ජේ.එම්.දිලිප් ජයසිංහ මහතා, ගරු මන්ත්‍රී ඒ.පී.තරංග චම්පික අලහකෝන් මහතා,ගරු මන්ත්‍රී එස්.එච්.මාලක අරුණ කුමාර මහතා,ගරු මන්ත්‍රී ඩබ්.ජී.අජිත් ලක්ෂ්මන් මහතා වෙත නිවාඩු අනුමත කරන ලෙසට ගෙන ආ යෝජනාව ගරු සභාවේ එදින පැමිණි සිටි සභිකයන් විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී .**

**IV.2026.04.09 වන දින පැවති කාර්මික සේවා කමිටුව සඳහා සහභාගී නොවූ මන්ත්‍රීවරුන්ගේ නිවාඩු අනුමත කිරීම.**

ගරු සභාපති වයි.ජී. සංජීව කරුණාසාගර මහතා

2026.04.09 වන දින පැවති කාර්මික සේවා කමිටුව සඳහා සහභාගී නොවූ ගරු මන්ත්‍රී ජේ.එම්.දිලිප් ජයසිංහ මහතා, ගරු මන්ත්‍රී ආර්.ඩී.ලාලිත ඉඳුනිල් මහතා, ගරු මන්ත්‍රී ආර්.එම්.උපුල් නිශාන්ත මහතා, ගරු මන්ත්‍රී එච්.එම්.නිශ්ශංක රම්‍ය කුමාර හේරත් මහතා, ගරු මන්ත්‍රිනී එම්. නිශාන්ති ගුණතිලක මහත්මිය,ගරු මන්ත්‍රිනී ඩී.නිමාලි දිල්හානි මහත්මිය, ගරු මන්ත්‍රී එම්.කේ.ආර්.හුසේයින් මහතා,ගරු මන්ත්‍රී ආර්.එච්.රංජිත් උපාලි මහතා, , ගරු මන්ත්‍රී කේ.එම්.නන්දසිරි මහතා,ගරු මන්ත්‍රී ඩී.ඩී.එස් පද්මලාල් මහතා, වෙත නිවාඩු අනුමත කරන මෙන් ගරු සභාවෙන් ඉල්ලා සිටිනවා.

ගරු මන්ත්‍රිනී ඊ.ඒ. ඉරාෂි ප්‍රියදර්ශනී මහත්මිය - (ජා.ජ.බ)

2026.04.09 වන දින පැවති කාර්මික සේවා කමිටුව සඳහා සහභාගී නොවූ ගරු මන්ත්‍රීවරුන් නිවාඩු අනුමත කිරීම සුදුසුයි කියලා මං යෝජනා කරනවා

ගරු මන්ත්‍රී එස්.එච්. මාලක අරුණ කුමාර මහතා- (ජා.ජ.බ)

එම යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

**ඒ අනුව 2026.04.09 වන දින පැවති කාර්මික සේවා කමිටුව සඳහා සහභාගී නොවූ ගරු මන්ත්‍රී ජේ.එම්.දිලිප් ජයසිංහ මහතා, ගරු මන්ත්‍රී ආර්.ඩී.ලාලිත ඉඳුනිල් මහතා, ගරු මන්ත්‍රී ආර්.එම්.උපුල් නිශාන්ත මහතා, ගරු මන්ත්‍රී එච්.එම්.නිශ්ශංක රම්‍ය කුමාර හේරත් මහතා, ගරු මන්ත්‍රිනී එම්. නිශාන්ති ගුණතිලක මහත්මිය,ගරු මන්ත්‍රිනී ඩී.නිමාලි දිල්හානි මහත්මිය, ගරු මන්ත්‍රී එම්.කේ.ආර්.හුසේයින් මහතා,ගරු මන්ත්‍රී ආර්.එච්.රංජිත් උපාලි මහතා, , ගරු මන්ත්‍රී කේ.එම්.නන්දසිරි මහතා,ගරු මන්ත්‍රී ඩී.ඩී.එස් පද්මලාල් මහතා, වෙත නිවාඩු අනුමත කරන ලෙසට ගෙන ආ යෝජනාව ගරු සභාවේ එදින පැමිණි සිටි සභිකයන් විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී .**

**V.2026.04.27 වන දින මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කමිටුව සඳහා සහභාගී නොවූ මන්ත්‍රීවරුන්ගේ නිවාඩු අනුමත කිරීම.**

ගරු සභාපති වයි.ජී. සංජීව කරුණාසාගර මහතා

2026.04.27 වන දින මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කමිටුව සඳහා සහභාගී නොවූ ගරු උප සභාපති බන්දුල සමරවික්‍රම මහතා, ගරු මන්ත්‍රී ජේ.එම්.දිලිප් ජයසිංහ මහතා, ගරු මන්ත්‍රී ඒ.පී.ඩී. ඉෂාන් මධුශංක පීරිස් මහතා , ගරු මන්ත්‍රී ඩී.ඩී.එස් පද්මලාල් මහතා, ගරු මන්ත්‍රී එම්.ජී විරාජ් මලින්ද ඩයස් මහතා, ගරු මන්ත්‍රී එම්.ඩී මනෝ කුමාර එදිරිසිංහ මහතා, ගරු මන්ත්‍රී ආර්.එච්.රංජිත් උපාලි මහතා, ගරු මන්ත්‍රී එම්.ටී.එම්. තස්ලිම් මහතා, ගරු මන්ත්‍රී ඒ.පී.තරංග චම්පික අලහකෝන් මහතා, වෙත නිවාඩු අනුමත කරන මෙන් ගරු සභාවෙන් ඉල්ලා සිටිනවා.

ගරු මන්ත්‍රී එම්.ඒ.මංජුල ප්‍රසන්න මංජුල මල්ලව ආරච්චි මහතා - (ජා.ජ.බ)

ගරු සභාපතිතුමනි, 2026.04.27 දින මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කමිටුව සඳහා සහභාගී නොවූ ගරු මන්ත්‍රීවරුන් හට නිවාඩු අනුමත කිරීම සුදුසුයි කියලා මං යෝජනා කරනවා

**<u>ගරු මන්ත්‍රීනී ආර්. එම්. නිලන්ති විජේසිංහ මහත්මිය - ( ස.ජ.බ)</u>**

ගරු සභාපතිතුමා ඇතුළු සභාවෙන් අවසරයි.එම යෝජනාව මා ස්ථිර කරනවා.

**ඒ අනුව 2026.04.27 වන දින මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කමිටුව සඳහා සහභාගී නොවූ ගරු උප සභාපති බන්දුල සමරවික්‍රම මහතා, ගරු මන්ත්‍රී ජේ.එම්.දිලිප් ජයසිංහ මහතා, ගරු මන්ත්‍රී ඒ.පී.ඩී. ඉෂාන් මධුශංක පීරිස් මහතා , ගරු මන්ත්‍රී ඩී.ඩී.එස් පද්මලාල් මහතා, ගරු මන්ත්‍රී එම්.ජී විරාජ් මලින්ද ඩයස් මහතා, ගරු මන්ත්‍රී එම්.ඩී මනෝ කුමාර එදිරිසිංහ මහතා, ගරු මන්ත්‍රී ආර්.එච්.රංජිත් උපාලි මහතා, ගරු මන්ත්‍රී එම්.ටී.එම්. තස්ලිම් මහතා, ගරු මන්ත්‍රී ඒ.පී.තරංග චම්පික අලහකෝන් මහතා, වෙත නිවාඩු අනුමත කරන ලෙසට ගෙන ආ යෝජනාව ගරු සභාවේ එදින පැමිණි සිටි සභිකයන් විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී .**

**<u>ගරු සභාපති වයි.ජී. සංජීව කරුණාසාගර මහතා</u>**

ස්තුතිය පුද කිරීමේ ලිපියක් ඉදිරිපත් කරලා තියනවා.ගරු රංජිත් උපාලි මන්ත්‍රීතුමා.ජනවාරි මාසයේ මා හදිසි හෘදයාබාධයකට ලක්වුන මොහොතේ සභාවේ ගරු සභාපතිතුමා විසින් මන්ත්‍රී මණ්ඩලයේ ඒකමතික තීරණයෙන් සභා අරමුදලින් රු.50,000.00 වෙන් කර දීම පිලිබඳව සියළුදෙනාටම හදපිරි ස්තුතිය පුද කරමි.ඒ වාගේම මගේ නිවසට පැමිණ ඉක්මන් සුවය ප්‍රාර්ථනා කරමින් උදව් උපකාර කල සභාපතිතුමා, උප සභාපතිතුමා පැමිණි සියළුම ගරු මන්ත්‍රීතුමන්ලා තුමියන්ලා ගරු ලේකම්තුමිය ඇතුළු කාර්ය මණ්ඩලයේ පැමිණි සියළුම නිලධාරී මහත්ම මහත්මීන්ටත් මාගේ ආදරණීය ස්තුතිය ගෞරවය පුද කරමි. ගරු සභාපතිතුමා ඇතුළු සමස්ථ සභාවේ යෝජනාවෙන් කල ඉල්ලීම පරිදි මහව, කොබෙයිගනේ, වාරියපොල ප්‍රාදේශිය සභාවල ගරු සභාපතිතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලයටද ප්‍රතිපාදනයන් වෙන් කර දීමට කටයුතු කිරීම පිලිබඳව මාගේ ගෞරවය හා ස්තුතිය පුද කිරීමට මෙය අවස්ථාවක් කර ගනිමි. ඉදිරියටත් මාගේ උපරිම ශක්තියෙන් නිවැරදි ගමන් මඟකට අවතීර්ණවීමට හැකියාව ලැබීම මාගේ භාග්‍යයක් කොට සලකමි.

## (ඇ) යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න -නැත

## (ඉ) යථා පරිදි කල්දී ඇති යෝජනා

**<u>ගරු සභාපති වයි.ජී. සංජීව කරුණාසාගර මහතා</u>**

මළඟට හදිසි යෝජනා කිහිපයක් තියෙනවා.න්‍යාය පත්‍රයට ඇතුළත් කරගන්න.මා විසින් ඉදිරිපත් කරනවා අමාත්‍යාංශ ආධාර යටතේ මඩඉන පොල්කුඹුර මාර්ගය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතියට අදාලව මේ වන විට වැඩ අවසන් කර ඇති කොටස සඳහා ගෙවීම් කිරීමට කෘෂිකර්ම පශු සම්පත්, ඉඩම් හා වාරි මාර්ග අමාත්‍යාංශය මඟින් එවා ඇති අත්තිකාරම් මුදල රු.860,621.85 වැඩ අවසන් කර ඇති කොටස සඳහා රු.2,155,859.67 මුළු මුදල රු3,016,481.52 ගෙවීම සුදුසු බවට ගෙන එන යෝජනාව.එම යෝජනාව රැස්වීම් රීති 11(8) යටතේ න්‍යාය පත්‍රයට ඇතුලත් කිරීම සුදුසු බවට යෝජනා සම්මත කරදෙන්න.

**<u>ගරු මන්ත්‍රී ඒ.පී.ඩී. ඉෂාන් මධුශංක පීරිස් මහතා - (ජා.ජ.බ)</u>**

එම යෝජනාව රැස්වීම් රීති 11(8) යටතේ න්‍යාය පත්‍රයට ඇතුලත් කිරීම සුදුසු බවට මා විසින් ස්ථිර කරනවා.

**ඒ අනුව ගරු සභාපති වයි. ජී. සංජීව කරුණාසාගර මහතා විසින් ගරු සභාවට ඉදිරිපත් කර ඇති අමාත්‍යාංශ ආධාර යටතේ මඩඉන පොල්කුඹුර මාර්ගය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතියට අදාලව මේ වන විට වැඩ අවසන් කර ඇති කොටස සඳහා ගෙවීම් කිරීමට කෘෂිකර්ම පශු සම්පත්, ඉඩම් හා වාරි මාර්ග අමාත්‍යාංශය මඟින් එවා ඇති අත්තිකාරම් මුදල රු.860,621.85, වැඩ අවසන් කර ඇති කොටස සඳහා රු.2,155,859.67**

**ක මුදල, මුළු මුදල රු3,016,481.52 ගෙවීම සුදුසු බවට ගෙන එන යෝජනාව රැස්වීම් රීති 11(8) යටතේ න්‍යාය පත්‍රයට ඇතුළත් කිරීම සුදුසු බවට ගරු සභාවේ එදින පැමිණි සිටි සභිකයන් විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදි.**

<u>ගරු සභාපති වයි.ජී. සංජීව කරුණාසාගර මහතා</u>

මීළගට .මා විසින් ඉදිරිපත් කරනවා පඩුවස්නුවර නැගෙනහිර සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලය අංගමුව සායන මධ්‍යස්ථානය වෙත රැගෙන යාම හා ගිවිසුම් ගත විම සම්බන්ධයෙන් වයඹ ප්‍රධාන ලේකම්ගේ අනුමැතිය ලබා ගැනිම හා විධිමත් පරිදි ගිවිසුම් ගත වන තෙක් අධි ගාස්තු ලබා නොගැනිම පිලිබඳ යොජනාව .එම යෝජනාව රැස්වීම් රීති 11(8) යටතේ න්‍යාය පත්‍රයට ඇතුලත් කිරීම සුදුසු බවට යෝජනා සම්මත කරදෙන්න.

<u>ගරු මන්ත්‍රී ජේ.එම්. දිලිප් ජයසිංහ මහතා - (ජා.ජ.බ)</u>

එම යෝජනාව රැස්වීම් රීති 11(8) යටතේ න්‍යාය පත්‍රයට ඇතුලත් කිරීම සුදුසු බවට මා විසින් ස්ථිර කරනවා.

**ඒ අනුව ගරු සභාපති වයි. ජී. සංජීව කරුණාසාගර මහතා විසින් ගරු සභාවට ඉදිරිපත් කර ඇති පඩුවස්නුවර නැගෙනහිර සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලය අංගමුව සායන මධ්‍යස්ථානය වෙත රැගෙන යාම හා ගිවිසුම් ගත විම සම්බන්ධයෙන් වයඹ ප්‍රධාන ලේකම්ගේ අනුමැතිය ලබා ගැනිම හා විධිමත් පරිදි ගිවිසුම් ගත වන තෙක් අධි ගාස්තු ලබා නොගැනිම පිලිබඳ යොජනාව රැස්වීම් රීති 11(8) යටතේ න්‍යාය පත්‍රයට ඇතුළත් කිරීම සුදුසු බවට ගරු සභාවේ එදින පැමිණි සිටි සභිකයන් විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදි.**

<u>ගරු සභාපති වයි.ජී. සංජීව කරුණාසාගර මහතා</u>

මීළගට .මා විසින් ඉදිරිපත් කරනවා. පඩුවස්නුවර ප්‍රාදේශිය සභාවට අයත් හෙට්ටිපොල බස් නැවතුම්පල වෙළෙඳ සංකීර්ණයේ මාසික කුලී හා පෙර ගෙවුම් කඩ කාමර සඳහා රජයේ ප්‍රධාන තක්සේරුකරුගේ KG/RP/2664 YD 2026.05.08 දිනැති තක්සේරු වාර්තාව පිළිගැනිම හා වසර තුනක කාලයක් සඳහා ගිවිසුම් ගත විම සම්බන්ධ යෝජනාව. එම යෝජනාව රැස්වීම් රීති 11(8) යටතේ න්‍යාය පත්‍රයට ඇතුලත් කිරීම සුදුසු බවට යෝජනා සම්මත කරදෙන්න.

<u>ගරු මන්ත්‍රීනී ඩබ්.ටී.එම්. චාන්දනී දීපිකා රත්නායක මහත්මිය - ( ස.ජ.බ)</u>

එම යෝජනාව රැස්වීම් රීති 11(8) යටතේ න්‍යාය පත්‍රයට ඇතුලත් කිරීම සුදුසු බවට මා විසින් ස්ථිර කරනවා.

**ඒ අනුව ගරු සභාපති වයි. ජී. සංජීව කරුණාසාගර මහතා විසින් ගරු සභාවට ඉදිරිපත් කර ඇති පඩුවස්නුවර ප්‍රාදේශිය සභාවට අයත් හෙට්ටිපොල බස් නැවතුම්පල වෙළෙඳ සංකීර්ණයේ මාසික කුලී හා පෙර ගෙවුම් කඩ කාමර සඳහා රජයේ ප්‍රධාන තක්සේරුකරුගේ KG/RP/2664 YD 2026.05.08 දිනැති තක්සේරු වාර්තාව පිළිගැනිම හා වසර තුනක කාලයක් සඳහා ගිවිසුම් ගත විම සම්බන්ධ යෝජනාව රැස්වීම් රීති 11(8) යටතේ න්‍යාය පත්‍රයට ඇතුළත් කිරීම සුදුසු බවට ගරු සභාවේ එදින පැමිණි සිටි සභිකයන් විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදි.**

<u>ගරු සභාපති වයි.ජී. සංජීව කරුණාසාගර මහතා</u>

මීළගට.ගරු මන්ත්‍රී ලාලිත ඉඳුනිල් මහතා විසින් ගෙනු එන හදිසි යෝජනාව. යෝජනාව ඉදිරිපත් කරන්න ඔබතුමා. එම යෝජනාව රැස්වීම් රීති 11(8) යටතේ න්‍යාය පත්‍රයට ඇතුලත් කිරීම සුදුසු බවට යෝජනා සම්මත කරදෙන්න.

<u>ගරු මන්ත්‍රී ආර්.ඩී. ලාලිත ඉඳුනිල් මහතා - (ජා.ජ.බ)</u>

ගරු සභාපතිතුමනි, හෙට්ටිපොල නගරයේ විදුලි අළුත්වැඩියා කටයුතු සඳහා සෙනසුරාදා දින හැර අනිකුත් දිනයන් යොදාගන්නා ලෙස කරන විශේෂ යෝජනාව.

<u>ගරු මන්ත්‍රී ඒ.පී.ඩී. ඉෂාන් මධුශංක පීරිස් මහතා - (ජා.ජ.බ)</u>

එම යෝජනාව රැස්වීම් රීති 11(8) යටතේ න්‍යාය පත්‍රයට ඇතුලත් කිරීම සුදුසු බවට මා විසින් ස්ථිර කරනවා.

**ඒ අනුව ගරු මන්ත්‍රී ආර්.ඩී. ලාලිත ඉඳුනිල් මහතා විසින් ගරු සභාවට ඉදිරිපත් කර ඇති හෙට්ටිපොල නගරයේ විදුලි අළුත්වැඩියා කටයුතු සඳහා සෙනසුරාදා දින හැර අනිකුත් දිනයන් යොදාගන්නා ලෙස කරන විශේෂ යෝජනාව රැස්වීම් රීති 11(8) යටතේ න්‍යාය පත්‍රයට ඇතුළත් කිරීම සුදුසු බවට ගරු සභාවේ එදින පැමිණි සිටි සභිකයන් විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදි.**

__ගරු සභාපති වයි.ජී. සංජීව කරුණාසාගර මහතා__

මීළගට.ගරු මන්ත්‍රී ආර්.එච්.රංජිත් උපාලි මහතා විසින් ගෙනු එන හදිසි යෝජනාව. යෝජනාව ඉදිරිපත් කරන්න ඔබතුමා. එම යෝජනාව රැස්වීම් රීති 11(8) යටතේ න්‍යාය පත්‍රයට ඇතුලත් කිරීම සුදුසු බවට යෝජනා සම්මත කරදෙන්න.

__ගරු මන්ත්‍රී ආර්. එච්. රංජිත් උපාලි මහතා - (ස්වාධීන)__

ගරු සභාපතිතුමනි, නගරයේ බස්නැවතුම්පොල පවතින ස්ථානයේ වෙළඳ සංකීර්ණයේ කඩ කාමරවල පවතින අපිරිසිදුභාවය හා පරිපාලනයේ ගැටළු පිලිබඳව මේ මොහොතේ සමාජ මාධ්‍යයේ මේ සිද්ධිය සම්බන්ධ රූප රාමු සංසරණය වෙමින් පවතිනවා .මෙම තත්වය මග හැරීම සඳහා මෙහි වැඩ කටයුතු හා කළමණාකාරීත්වය යාවත්කාලීනව පවත්වාගෙන යාම සඳහා සුදුසු වැඩපිලිවෙලක් ක්‍රියාත්මක කිරීම සඳහා මෙම හදිසි යෝජනාව ගේනවා.

__ගරු මන්ත්‍රී සී.පී. රංජිත් අබේපාල මහතා - (ස්වාධීන)__

එම යෝජනාව රැස්වීම් රීති 11(8) යටතේ න්‍යාය පත්‍රයට ඇතුලත් කිරීම සුදුසු බවට මා විසින් ස්ථිර කරනවා.

**ඒ අනුව ගරු මන්ත්‍රී ආර්.එච්.රංජිත් උපාලි මහතා විසින් ගරු සභාවට ඉදිරිපත් කර ඇති නගරයේ බස්නැවතුම්පොල පවතින ස්ථානයේ වෙළඳ සංකීර්ණයේ කඩ කාමරවල පවතින අපිරිසිදුභාවය හා පරිපාලනයේ ගැටළු මග හැරීම සඳහා මෙහි වැඩ කටයුතු හා කළමණාකාරීත්වය යාවත්කාලීනව පවත්වාගෙන යාම සඳහා සුදුසු වැඩපිලිවෙලක් ක්‍රියාත්මක කිරීම සඳහා ගෙන ආ විශේෂ යෝජනාව රැස්වීම් රීති 11(8) යටතේ න්‍යාය පත්‍රයට ඇතුළත් කිරීම සුදුසු බවට ගරු සභාවේ එදින පැමිණි සිටි සභිකයන් විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදි.**

__ගරු සභාපති වයි.ජී. සංජීව කරුණාසාගර මහතා__

මීළගට.ගරු මන්ත්‍රී කේ. එම්.නන්දසිරි මහතා විසින් ගෙනු එන හදිසි යෝජනාව. එම යෝජනාව රැස්වීම් රීති 11(8) යටතේ න්‍යාය පත්‍රයට ඇතුලත් කිරීම සුදුසු බවට යෝජනා සම්මත කරදෙන්න.

__ගරු මන්ත්‍රී කේ.එම්. නන්දසිරි මහතා - ( ස.ජ.බ)__

සුභ උදෑසනක් ගරු සභාපතිතුමනි, ගරුසභාපතිතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලයෙන් අවසරයි. ලේකම්තුමිය ඇතුළු කාර්ය මණ්ඩලයෙන් අවසරයි. නිකපිටිය ගනේගම ප්‍රධාන මාර්ගය තාවකාලිකව හෝ ඒබීසී දමා පිලිසකර කර දෙන මෙන් යෝජනා කරනවා.

__ගරු මන්ත්‍රී එම්. කේ.ආර්. හුසේයින් මහතා - ( ස.ජ.බ)__

එම යෝජනාව රැස්වීම් රීති 11(8) යටතේ න්‍යාය පත්‍රයට ඇතුලත් කිරීම සුදුසු බවට මා විසින් ස්ථිර කරනවා.

**ඒ අනුව ගරු මන්ත්‍රී කේ එම් නන්දසිරි මහතා විසින් ගරු සභාවට ඉදිරිපත් කර ඇති නිකපිටිය ගනේගම ප්‍රධාන මාර්ගය තාවකාලිකව හෝ ඒබීසී දමා පිලිසකර කර දෙන මෙන් සිදු කරන විශේෂ යෝජනාව රැස්වීම් රීති 11(8) යටතේ න්‍යාය පත්‍රයට ඇතුළත් කිරීම සුදුසු බවට ගරු සභාවේ එදින පැමිණි සිටි සභිකයන් විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදි.**

**(ඉ) I.** __ගරු සභාපති වයි.ජී.සංජීව කරුණා සාගර මහතා මහතා විසින් කරනු ලබන අංක 6.(ඉ). I දරණ යෝජනාව__

කඹුරාපොල වෙළඳ සංකීර්ණයේ K-03 කඩ කාමරය බදුකරුවන ජේ.ඒ.නිසංසලා ප්‍රියදර්ශනී විසින් එම කඩ කාමරය ජාතික හැඳුනුම්පත් අංක 855923807V දරණ ජයකොඩි ආරච්චිලාගේ අනුෂා ලක්මාලි ජයකොඩි

යන අයට, 2019/02 චක්‍රලේඛණය අනුව පැවරුම්කරුගේ ගිවිසුම් කාලයෙන් ඉතිරි කාලය සඳහා ගිවිසුම් ගත වීමේ හැකියාව පවතින බැවින් (2029 පෙබරවාරි මස 28 දින දක්වා) පැවැරුම් ගාස්තු ලෙස මාසික කඩ කුලිය මෙන් 24 ගුණයක් අය කර ගැනීමෙන් පසුව ගිවිසුම් ගත වීම සුදුසු බව යෝජනා කරනවා .

<u>ගරු මන්ත්‍රී ආර්. එච්. රංජිත් උපාලි මහතා - (ස්වාධීන)</u>

එම යෝජනාව ස්ථිර කරනවා.හැබැයි මූලාසනේ දැන් ඔබතුමා දැනුම් දුන්නා. අතුරු බදු දෙන්න පුළුවන් කමක් නෑ කියලා.

<u>ගරු සභාපති වයි.ජී. සංජීව කරුණාසාගර මහතා</u>

අතුරු බදු නෙමේ. සම්පූර්ණයෙන්ම ගන්න කෙනාගෙ නමට පවරන්නෙ.

<u>ගරු මන්ත්‍රී ආර්. එච්. රංජිත් උපාලි මහතා - (ස්වාධීන)</u>

හිමිකරුට දීලා තිබුන කාලයේ ඉතිරි තියනවා.ඒ ඉතිරි කාලය වෙන නමකට ගිවිසුම්ගත වෙනවා.ඒකත් අතුරු බදු දීමක් තමයි.

<u>ගරු සභාපති වයි.ජී. සංජීව කරුණාසාගර මහතා</u>

මන්ත්‍රිතුමා මේ සිද්ධ වෙන්නෙ කලින් කෙනා යටතේ තියාගෙන වෙන කෙනෙකුට අතුරුබදු දීමක් නෙමේ.කලින් තිබුන කෙනාගෙන් ගලවලා මේ අනිත් කෙනාට සම්පූර්ණ බදු දෙනවා.

**ඒ අනුව කඹුරාපොල වෙළඳ සංකීර්ණයේ K-03 කඩ කාමරය බදුකරුවන ජේ.ඒ.නිසංසලා ප්‍රියදර්ශනී විසින් එම කඩ කාමරය ජාතික හැඳුනුම්පත් අංක 855923807V දරණ ජයකොඩි ආරච්චිලාගේ අනූෂා ලක්මාලි ජයකොඩි යන අයට, 2019/02 චක්‍රලේඛණය අනුව පැවරුම්කරුගේ ගිවිසුම් කාලයෙන් ඉතිරි කාලය සඳහා ගිවිසුම් ගත වීමේ හැකියාව පවතින බැවින් (2029 පෙබරවාරි මස 28 දින දක්වා) පැවැරුම් ගාස්තු ලෙස මාසික කඩ කුලිය මෙන් 24 ගුණයක් අය කර ගැනීමෙන් පසුව ගිවිසුම් ගත වීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ එදින පැමිණි සිටි සභිකයන් විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී .**

**(ඉ) II.** <u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.එම්.කුමාරසේන ජයලත් මහතා විසින් කරනු ලබන අංක 6.(ඉ). II දරණ යෝජනාව</u>

<u>ගරු මන්ත්‍රී පී.එම්. කුමාරසේන ජයලත් මහතා - ( ස.ජ.බ)</u>

ගරු සභාපතිතුමා,හෙට්ටිපොල සතිපොල බුලත්පොල වැසිකිළි පද්ධතිය නවීකරණය කර අළුත්වැඩියා කිරීම සුදුසු බවට යෝජනාව මං සභාවට ඉදිරිපත් කරනවා.

<u>ගරු මන්ත්‍රී ඒ.ජී.ඩී. රංජිත් ප්‍රේමලාල් මහතා - ( ස.ජ.බ)</u>

ගරු සභාපතිතුමා මං ඒ යෝජනාව ස්ථිර කරනවා.

<u>ගරු මන්ත්‍රී පී.එම්. කුමාරසේන ජයලත් මහතා - ( ස.ජ.බ)</u>

ගරු සභාපතිතුමා හෙට්ටිපොල සතිපොල බුලත්පොල අවුරුදු ගණනාවක් තිස්සෙ මන්ත්‍රිවරු ගණනාවක් සම්බන්ධ වෙලා තිබ්බා ගොවියන් හැටියට.ඒ අයත් මේ අඩුපාඩුව දකිනවා.මමත් බුලත් පොළට ගොවියෙක් විදිහට සම්බන්ධ වෙනකොට ඒ අඩුපාඩුව දැක්කා.මේකට ප්‍රස්තුත වූ කතාවකුත්තියනවා.එතනට මම ගිය අවස්ථාවේ මටත් දොස් නැගුවා සභාවෙ මන්ත්‍රිවරයෙක් නේද කියලා. ඒ අවස්ථාවේදී ම හිතුවා මේ යෝජනාව සභාවට ඉදිරිපත් කරන්න.එමල් සභාපතිතුමාගෙ කාලෙදි තමයි මේ බුලත්පොල එම ස්ථානයට අරගෙන ගියෙ.මෙතෙන්ට අරගෙන ගිහින් යම්කිසි මට්ටමකට බුලත්පොල තියනවා.ඒ හා සම්බන්ධ වැසිකිලි පද්ධතිය හා ජල පහසුකමක් මේ පොල භූමියේ නෑ.වැසිකිලි කාමර දෙකක් තියනවා.ඒවා ජරාවාස වෙලා යන්න බෑ කාටවත්.තියෙන වැසිකිළිවලත් ඒ කාලෙ තිබුන තාක්ෂණයට අනුව වලයි පෝච්චියයි සමානයි.මම මෙතනදි මේ වැසිකිලි පද්ධතිය නවීකරණය සහ අළුත්වැඩියාව කිව්වෙ දැන් මේවට අළුත්ක්‍රම තියනවා. ඒ හරහා අපි මේ බුලත්පොලට වැසිකිළි පද්ධතියක් ඉදිරිපත් කරමුයි කියන යෝජනාව තමයි මම කියන්නෙ.බුලත්පොලේ මං හිතන්නේ මාසිකව ලක්ෂෙ ඉක්මවූ ආදායමක් ලැබෙනවා.මේ බුලත් පොළට ලංකාවෙ පුරාම ඉන්න වෙළෙන්දො සහභාගි වෙනවා.මේ අය බුලත්පොලට සම්බන්ධ වෙනකොට පාන්දර 1.00, 2.00 ඉඳන් නැවත උදේ 7.00, 8.00 වෙනකම් බුලත්පොලේ රැදිලා ඉන්නවා. යම් අවශ්‍යතාවයක් ඇතිවුනොත් ඒ අවශ්‍යතා ඉටුකරගන්න ස්ථානයක් නෑ. බයිසිකල් පාර්ක් එක හරියෙ ජරාවාස වෙලා.මම

මේ යෝජනාව ගේන්න හිතුවෙ මට හිතුනා අපේ සභාපතිතුමාට කියලා මේක ඉෂ්ට සිද්ධ කරගන්න පුළුවන් වෙයි කියලා. මං පොලේ හිටපු ගොවීන් වෙළෙන්දො කීපදෙනෙකුට අත්සන් ලේඛනයක් දෙමු අපේ සභාපතිතුමාට කියන යෝජනාවත් ගෙනාවා. අත්සන් ලේඛණයත් තියනවා මේකෙ බර ගනනක් අත්සන් කරලා තියනවා.ඔබතුමාගෙ සභාව.අපි මන්ත්‍රිවරු හැටියට අඩුපාඩු පෙන්නලා දීලා ඔබතුමාට සපෝට් එකක් දෙන්න හදන්නෙ.අපේ න්‍යායපත්‍රයෙත් තියනවා අපේ සියඹලාගස්වැටිය වැවේ වැසිකිළි පද්ධතිය පිලිබඳ යෝජනාව.ඊට වඩා අපිට ලොකු ලාභයක් උපයලා දෙනවා මේ බුලත් පොලෙන්.ඒ හින්දා ඒ වැසිකිළි පද්ධතියට වඩා මේ වැසිකිළි පද්ධතිය වටිනවා.ජල පපහසුකමුත් එක්ක මේ වැසිකිළි පද්ධතිය හදලා දෙන්න කියලා තමයි යෝජනා කරන්නෙ.

**<u>ගරු මන්ත්‍රී කේ.එම්. නන්දසිරි මහතා - ( ස.ජ.බ)</u>**

ගරු සභාපතිතුමාගෙන් අවසරයි. බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා අපේ කුමාර මන්ත්‍රිතුමා බුලත්පොල වැසිකිළිය සම්බන්ධව මේ යෝජනාව ඉදිරිපත් කිරීම පිලිබඳව.ගොවියෙක් හැටියට මමත් හැමදාම සෙනසුරාදාට බුලත්පොලට අනිවාර්යයෙන් යනවා.ගරු සභාපතිතුමනි මිනිසුන්ගේ ආන්දෝලනය, සෝෂාව ඇහුවම අපිට එතෙන්ට මන්ත්‍රිවරයෙක් විදිහට ඉදිරිපත් වෙන්න බෑ.කුමාර මන්ත්‍රිතුමා කිව්ව විදිහට එතන පුදුමාකාර ජරාජීර්ණ වූ වැසිකිළි පද්ධතියක් තියෙන්නෙ.ඒ අහලකවත් ඉන්න බෑ.ඒ හින්දා ඒකත් මතක් කරමින් ඒ වගේම හෙට්ටිපොල සතිපොල වැසිකිළි පද්ධතිය.ඒකෙ වැසිකිළි කාමර කීපයක් තිබුනට එකයි පාවිච්චි කරන්න පුළුවන්.හෙට්ටිපොල සතිපොල වෙලෙන්දො දාස් ගානක් ඉන්න ප්‍රධාන සතිපොල.ලොකු ආදායමක් එන තැනක්. ගරු සභාපතිතුමා ඒ බුලත්පොල වැසිකිළි පද්ධතිය හදනවා වගේම හෙට්ටිපොල සතිපොලේ වැසිකිළි පද්ධතියත් අළුත්වැඩියා කරන්න කියන ඉල්ලීම කරනවා.

**<u>ගරු මන්ත්‍රී ආර්.ඩී. ලාලිත ඉඳුනිල් මහතා - (ජා.ජ.බ)</u>**

ගරු සභාපතිතුමනි, ගරුසභාපතිතුමා ඇතුළු මන්ත්‍රි මණ්ඩලයෙන් අවසරයි. ලේකම්තුමිය ඇතුළු කාර්ය මණ්ඩලයෙන් අවසරයි.දැනට මේ බුලත් පොලේ වැසිකිළි පද්ධතියේ ප්‍රශ්නයට ස්ථිරව විසඳුමක් ගේනකම් දැනට තාවකාලික විසඳුමක් වශයෙන් ගලි බවුසරය දාලා අපිට සුද්ධ කරන්න පුළුවනි. ඇත්තටම ඔය හරියෙ හෝටලුත් තියනවා. පිටිපස්සෙ තියෙන්නෙ කම්කරු නිවාස. සෞඛ්‍ය ප්‍රශ්න වගේම සනීපාරක්ෂක ප්‍රශ්නත් එනවා. බුලත්පොල වැසිකිළි ඉබියතුරු දාලා වහලා තියන්නෙ නැනෙ.ඒ නිසා කවුරු භාවිතා කරනවද කියලා අපි දන්නෙත් නෑ.

**<u>ගරු මන්ත්‍රී ඩී.ඩී.එස්.පද්මලාල් මහතා - (සර්ව ජන බලය)</u>**

කුමාර මන්ත්‍රිතුමා, නන්දෙ මන්ත්‍රිතුමා, ලාලිත මන්ත්‍රිතුමාත් කිව්වා කාරණා මමත් දන්නවා.මේ මන්ත්‍රිවරු තුන්දෙනාම කියපු කාරනා සත්‍යයි.ලාලිත මන්ත්‍රිතුමාගෙ කථාවෙදි කම්කරු නිවාස ගැන කියවුනා.ඒ අයත් ඉතාම අසරණව ඉන්නවා ඒ ප්‍රදේශයේ.ඒ අයගෙත් වැසිකිළි,කැසිකිළි පද්ධතිය සම්බන්ධයෙන් ඔබතුමාගේ අවධානය යොමුවෙයි කියලා අපේක්ෂා කරනවා.

**<u>ගරු මන්ත්‍රී ආර්. එච්. රංජීත් උපාලි මහතා - (ස්වාධීන)</u>**

ගරු සභාපතිතුමා මම ස්තුතිවන්ත වෙනවා කුමාර මන්ත්‍රිතුමාට මේ යෝජනාව ඉදිරිපත් කිරීම පිලිබඳව නගරෙ ප්‍රධාන ප්‍රශ්නයක් හැටියට.මේකට ඌණ පූර්ණයක් විදිහට එකතු කරන්න කැමතියි. වැසිකිළියක් කොච්චර නවීකරණය කරලා හැදුවත් ඒක පාවිච්චි කරන විදිහ අනුව තමයි ඒකෙ පිරිසිදුකම තියෙන්නෙ.මේ බුලත්පොල පිටුපස්සෙ තමයි කම්කරු නිවාස තියෙන්නෙ.ඒ නිසා මේ යෝජනාවට කෑල්ලක් එකතු කරනවා.නවීකරණය කරලා පිලිසකර කරලා සභාවේ යෝජනාවකින් දීමනාවක් දීලා සේවිකාවක් හෝ සේවකයෙක් පත් කරන්න මේක පිරිසිදු කරන්න.එහෙම නැතිව මේක පවත්වන්න බෑ.කොච්චර හැද්වත් මේ බුලත්පොලට එන මිනිස්සු සංවරව, සංවේදීව හැසිරෙන අය නෙමේ.ඒක ලංකාවේ ස්වභාවයේ හැටි.ඒ හින්දා හදලා මාසෙකින් අපිරිසිදු වෙයි.සියඹලාගස්වැටියෙ භූ දර්ශනය ඇතුලෙ වැසිකිළි පද්ධතිය හදන්න පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් මුදල් වෙන් කරලා තියනවා.ඒ වැසිකිළි පද්ධතිය හදන මුදල් වලින් යම් මුදලක් අරගෙන මේ වැසිකිළි පද්ධතිය නවිකරණය කරලා හදලා සභාවෙ යෝජනාවකින් දීමනාවක් ගෙවන්න සේවිකාවක් යොදලා පිරිසිදු කරන්න කියන යෝජනාවත් මං මේ යෝජනාවට එකතු කරනවා.

**<u>ගරු සභාපති වයි.ජී. සංජීව කරුණාසාගර මහතා</u>**

බුලත්පොල වැසිකිළි පද්ධතිය සම්බන්ධව කුමාරසේන ජයලත් මන්ත්‍රීතුමා ගෙන ආ යෝජනාවට අදහස් කීපයක්ම ඉදිරිපත් වුනා.බුලත්පොල වැසිකිලි පද්ධතිය, හෙට්ටිපොල සතිපොල භූමිය වැසිකිළි පද්ධතිය, බස් නැවතුම්පොල උඩ කාමරවල වැසිකිලි පද්ධතිය. එතකොට මේවා අළුත්වැඩියා කරන්න ඕන, නවීකරණය කරන්න ඕන.අපි බලය ලබාගෙන මුල් දවස්වල තිබුනෙ ඔය වගේ තත්වයක් නෙමේ.සම්පූර්ණයෙන්ම කළු වෙලා, දිය සෙවල බැඳුන තත්වයක් දැන් එහෙම නෑ.ඒ වගේම නවීකරණය කරලා මේක ගොඩනගන්න පුළුවන්ද කියලා බලන්න ඕන.එහෙම නැත්තම් අලුත් වැසිකිලි පද්ධතියක් හදන්න වෙනවා.ඒ වගේම තමයි මේ යෝජනාවට එකතු කරනවා මම හෙට්ටිපොල සතිපොල භූමියේ වැසිකිලි පද්ධතිය ප්‍රමාණවත් නෑ.අලුත් වැසිකිලි පද්ධතියක් මුත්‍රා කිරීම සඳහා කාන්තා, සහ පිරිමි අලුතින්ඉදි කරමු කියන යෝජනාවත් මම මේ යෝජනාවට ඇතුලත් කරමින් ස්තුතිවන්ත වෙනවා මේ යෝජනාව ඉදිරිපත් කිරීම සම්බන්ධව.ඒ වගේම සියඹලාගස්වැටියෙ භූ දර්ශකයේ වැසිකිලි පද්ධතිය සංචාරකයො ඉලක්ක කරගෙන තමා ඉදි වෙන්නෙ. ඒ මුදල හම්බවෙන්නෙ සංචාරක අමාත්‍යශය හරහා.ඒ මුදල් වෙනත් දේකට යොදවන්න බෑ.ගිය පාර ලක්ෂ 100 ක් හම්බවෙලා තිබුනා පඩුවස්නුවර ප්‍රජා භූමියේ රථගාලේ වැසිකිලි පද්ධතිය ඉදි කරන්න.නමුත් අපිට ඒක ඉදි කරන්න බැරිවුනා.ඒ ඉඩමේ අයිතිය සම්බන්ධ ගැටළුවක් ආවා.

**ඒ අනුව හෙට්ටිපොල සතිපොල බුලත්පොල වැසිකිළි පද්ධතිය නවීකරණය කර අළුත්වැඩියා කිරීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ එදින පැමිණි සිටි සභිකයන් විසින් ඒකමතිකව සහා සම්මත කරන ලදී .**

**(ඉ) III.<u>ගරු සභාපති වයි.ජී.සංජීව කරුණා සාගර මහතා</u> <u>විසින් කරනු ලබන අංක 6.(ඉ). III</u> <u>දරණ යෝජනාව</u>**

පඩුවස්නුවර ප්‍රාදේශිය සභාවේ මුරකරු තනතුරේ සේවය කල යූ.එච්.එස්.ප්‍රේමසිරි මහතා 2026.02.08 දින සිටද එම්.ඒ.එවහප් මහතා 2025.12.10 දින සිට විශ්‍රාම යාමත් හේතු කොට ගෙන ආයතනයේ මේ වන විට මුරකරු තනතුරු 02 ක් පුරප්පාඩු වී ඇත.තනතුරේ රාජකාරි කටයුතු සිදු කිරීමට සේවා ගිවිසුම් පදනම මත සේවකයන් දෙදෙනෙකු බඳවා ගැනීම සුදුසු බව යෝජනා කරමි.

**<u>ගරු මන්ත්‍රීනී ඊ.ඒ. ඉරාෂි ප්‍රියදර්ශනී මහත්මිය - (ජා.ජ.බ)</u>**

ගරු සභාපතිතුමා විසින් ගෙන ආ යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

**ඒ අනුව පඩුවස්නුවර ප්‍රාදේශිය සභාවේ මුරකරු තනතුරේ සේවය කල යූ.එච්.එස්.ප්‍රේමසිරි මහතා 2026.02.08 දින සිටද එම්.ඒ.එවහප් මහතා 2025.12.10 දින සිට විශ්‍රාම යාමත් හේතු කොට ගෙන ආයතනයේ මේ වන විට මුරකරු තනතුරු 02 ක් පුරප්පාඩු වී ඇත.තනතුරේ රාජකාරි කටයුතු සිදු කිරීමට සේවා ගිවිසුම් පදනම මත සේවකයන් දෙදෙනෙකු බඳවා ගැනීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ එදින පැමිණි සිටි සභිකයන් විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී .**

**<u>ගරු සභාපති වයි.ජී.සංජීව කරුණාසාගර මහතා</u>**

තේ පානය සඳහා සභාව අඩාලව කල් තියන්න යෝජනා සම්මත කරගන්න.

**<u>ගරු මන්ත්‍රී කේ.එම්. නන්දසිරි මහතා - ( ස.ජ.බ)</u>**

තේ පානය සඳහා විනාඩි 20 කට අඩාලව කල් තැබීම සුදුසුයි කියා මම යෝජනා කරනවා.

**<u>ගරු මන්ත්‍රීනී ඩී. නිමාලි දිල්හානි මෙනවිය - ( ස.ජ.බ)</u>**

එම යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

**ඒ අනුව පෙ.ව 11.00 වතේ පානය සඳහා විනාඩි 20 ක් සඳහා සභාව කල් තබන ලදි.**

**<u>ගරු සභාපති වයි.ජී.සංජීව කරුණාසාගර මහතා</u>**

අඩාලව කල් තැබූ සභාව නැවත ආරම්භ කිරීම සඳහා යෝජනා සම්මත කරන්න.

**ගරු මන්ත්‍රී කේ.එම්. නන්දසිරි මහතා - ( ස.ජ.බ)**

තේ පානය සඳහා අඩාලව කල් තැබූ සභාව නැවත පවත්වා ගෙන යාම සුදුසුයි කියා මම යෝජනා කරනවා.

**ගරු මන්ත්‍රීනී ඩී. නිමාලි දිල්හානි මෙනවිය - ( ස.ජ.බ)**

එම යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

**ඒ අනුව තේ පානයෙන් පසු මහ සභාව 11.20 ට නැවත ආරම්භ විය**

**(ඉ) IV. ගරු සභාපති වයි.ජී.සංජීව කරුණා සාගර මහතා විසින් කරනු ලබන අංක 6.(ඉ). IV දරණ යෝජනාව**

607-03-i වැය ශිර්ෂය යටතේ රු.500,000.00 ක මුදලක් වෛද්‍යාආධාර සඳහා වෙන් කර ඇති බැවින් පහත නම් සඳහන් අය සඳහා ආධාර ලබා දීමට 1987 ප්‍රාදේශිය සභා පනතේ අංක 132 (ඔ) වගන්තිය ප්‍රකාරව ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය මත ප්‍රාදේශිය සභා අරමුදලින් වැය දැරීමට යෝජනා කරමි.

1. පහල මීගස්පිටිය ,හෙට්ටිපොල පදිංචි ඩබ්.ඩී. චන්ද්‍රාවතී මහත්මිය - වකුගඩු රෝගය රු.10,000.00
2. කඩවලගෙදර, මූණමල්දෙණිය පදිංචි එස්.සරත් ස්ටැන්ලි මහතා - වකුගඩු රෝගය රු.10,000.00
3. විජය උදාගම, නො 50, අනුක්කනේ පදිංචි ඩබ්.සිරිපාල ප්‍රනාන්දු මහතා - අංශභාග රෝගය රු.10,000.00
4. බිංගිරිය ප්‍රාදේශීය සභාවේ සංවර්ධන නිලධාරිනී කේ.ඩී. කුමුදු ශාලිකා අමරජීව මහත්මියගේ සැමියා එම්.ඒ.අනුර වීරවර්ධන මහතාගේ හෘද රෝගය - තීරණය කරන ලද මුදලක්
5. බිංගිරිය ප්‍රාදේශීය සභාවේ ආදායම් පරීක්ෂක යූ.පී.සී.උඩදෙනිය මහතාගේ හෘද රෝගය - තීරණය කරන ලද මුදලක්

යෝජනා සම්මත කරගන්න ගමන් මුදලත් තීරණය කරගන්න.

**ගරු මන්ත්‍රී ඩබ්.ජී. අජිත් ලක්ෂ්මන් මහතා - (ජා.ජ.බ)**

ගරු සභාපතිතුමනි,ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කළ වෛද්‍යාධාර පිළිබඳ යෝජනාවේදී 1,2,3,4,5 සඳහා රු.10,000.00ක මුදල් ලබා දීම සුදුසුයි කියන යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

**ඒ අනුව පහල මීගස්පිටිය ,හෙට්ටිපොල පදිංචි ඩබ්.ඩී. චන්ද්‍රාවතී මහත්මියගේ වකුගඩු රෝගය වෙනුවෙන් රු.10,000.00 ක මුදලක් කඩවලගෙදර, මූණමල්දෙණිය පදිංචි එස්.සරත් ස්ටැන්ලි මහතා ගේ වකුගඩු රෝගය වෙනුවෙන්රු.10,000.00 ක මුදලක් ද,විජය උදාගම, නො 50, අනුක්කනේ පදිංචි ඩබ්.සිරිපාල ප්‍රනාන්දු මහතා ගේ අංශභාග රෝගය වෙනුවෙන්රු.10,000.00 ක මුදලක්ද ,බිංගිරිය ප්‍රාදේශීය සභාවේ සංවර්ධන නිලධාරිනී කේ.ඩී. කුමුදු ශාලිකා අමරජීව මහත්මියගේ සැමියා එම්.ඒ.අනුර වීරවර්ධන මහතාගේ හෘද රෝගය වෙනුවෙන් රු.10,000.00ක මුදලක් ද,බිංගිරිය ප්‍රාදේශීය සභාවේ ආදායම් පරීක්ෂක යූ.පී.සී.උඩදෙනිය මහතාගේ හෘද රෝගය වෙනුවෙන් රු.10,000.00 ක ලද මුදලක් 1987 ප්‍රාදේශිය සභා පනතේ අංක 132 (ඔ) වගන්තිය ප්‍රකාරව ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය මත ප්‍රාදේශිය සභා අරමුදලින් වැය දැරීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ එදින පැමිණි සිටි සභිකයන් විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී .**

**(ඉ) V. ගරු සභාපති වයි.ජී.සංජීව කරුණා සාගර මහතා විසින් කරනු ලබන අංක 6.(ඉ). V දරණ යෝජනාව**

හංතිහව පච්චලවැව සිට මහවැව දක්වා මාර්ගය රණවිරු ඩබ්.එම්.ජයසිංහ මහතාට උපහාර වශයෙන් " බනි 11 රණවිරු ජයසිංහ මාවත" ලෙස නම් කිරීම සුදුසු බව යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ඩබ්.ජී. අජිත් ලක්ෂ්මන් මහතා - (ජා.ජ.බ)**

ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව මා ස්ථිර කරනවා.ඒ වගේම බනි 11 කියන එක 11ත් අයින් කරලා රණවිරු බලලත් නිලධාරී ජයසිංහ මාවත කියලා නම් කරන්න කියලා මම ඉල්ලා සිටිනවා..

**ගරු මන්ත්‍රී ඩී.ඩී.එස්.පද්මලාල් මහතා - (සර්ව ජන බලය)**

ගරු සභාපතිතුමනි,එම යෝජනාව සුදුසුයි.ඒ වගේම අර කිව්වා වගේ බලලත් නිලධාරී ලෙස යොදන ලෙස මමත් ඉල්ලනවා.

**ඒ අනුව හංතිහව පච්චලවැව සිට මහවැව දක්වා මාර්ගය රණවිරු ඩබ්.එම්.ජයසිංහ මහතාට උපහාර වශයෙන් " රණවිරු බලලත් නිලධාරී ජයසිංහ මාවත" ලෙස නම් කිරීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ එදින පැමිණි සිටි සභිකයන් විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී .**

## (ඉ) VI. ගරු සභාපති වයි.ජී.සංජීව කරුණා සාගර මහතා විසින් කරනු ලබන අංක 6.(ඉ).VIදරණ යෝජනාව

වැඩ බිම් භාරව කටයුතු කිරීම එම කටයුතු අධීක්ෂණය කිරීම සහ වැඩ ක්ෂේත්‍ර කම්කරුවන්ගේ රාජකාරි කටයුතු අධීක්ෂණය සඳහා මෙම ආයතනයට සේවා ගිවිසුම් පදනම මත ප්‍රාථමික ගණයේ වැඩ පරිපාලක තනතුර සඳහා සේවක මහතකු බඳවා ගැනීම සුදුසු බව යෝජනා කරමි.

**ගරු මන්ත්‍රිනී ඊ.ඒ. ඉරාෂි ප්‍රියදර්ශනී මහත්මිය - (ජා.ජ.බ)**

ගරු සභාපතිතුමා විසින් ගෙන ආ යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

**ගරු සභාපති වයි.ජී.සංජීව කරුණාසාගර මහතා**

මම ඒ යෝජනාව ඉදිරිපත් කරන්නෙ විශේෂ හේතුවක් නිසා.ඇත්තටම අවුරුදු ගානක් තිස්සෙ සභාවෙ වැඩ පරිපාලකවරයෙක් නෑ.සමහර වැඩ,දෙපස සුද්ද කරලා නෑ වගේ චෝදනා එන්නෙ මේ කරුණ නිසා. ඒ නිසා අපිට වැඩ පරිපාලකවරයෙකු අවශ්‍ය වෙනවා.පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් තමයි එවන්නෙ.නමුත් එහෙම තවම දැනගන්න නෑ. ඒ නිසා තාවකාලික පදනම මත අපි මේ නිලධාරියාව බඳවා ගමු.

**ගරු මන්ත්‍රී ආර්. එච්. රංජිත් උපාලි මහතා - (ස්වාධීන)**

ගරු සභාපතිතුමා මේ යෝජනාව කාලෝචිතයි.නමුත් කම්කරුවො පාලනය කරන්න කම්කරුවන් ඉන්නවද කියන එක දැනගන්න ඕන.ක්ෂෙත්‍ර කම්කරුවන් කිසිදු මාර්ගයක් එලි කරන්නෙ නෑ.කනෝගම කාර්යාලයට විසිරිච්ච කණ්ඩායමක් නෑ. මල්වානේගෙදර කාර්යාලයට විසිරිච්ච කණ්ඩායමක් නෑ.ප්‍රධාන කාර්යාලයේ කණ්ඩායමකුත් නෑ.පෙරෙට්ටුවකුත් නෑ.ග්‍රාම නිලධාරී කොට්ඨාශ 103 ම පාරවල් කැළෑ වලින් පිරිලා.ඒවා සුද්ද වෙන්නෙ නෑ.ඔබතුමාගෙ මේ යෝජනාව හොඳයි.කම්කරු පරිපාලකයෙක් ඉන්න ඕන.මම දන්න තරමින් ක්ෂෙත්‍ර කම්කරුවො දැන් හතරකට වැඩියෙන් එලියෙ නෑ.පහුගිය කාලපරිච්ඡේදයේ කම්කරුවන් 23 ක් 24 ක් හිටියා.ඔවුන් පාලනය කරන්න වැඩ පරිපාලකවරයෙක් හිටියා.මං ඉල්ලීමක් කරනවා මේ විසිරිලා ඉන්න කම්කරුවන් සියළුදෙනා ක්ෂෙත්‍රයට යවන්න.කම්කරු පරිපාලකවරයෙක් පත් කරගන්න නම් ඒ පරිපාලකයට පාලනය කරන්න කණ්ඩායමක් ඉන්න ඕන.කණ්ඩායමක් නැතිව පරිපාලකයෙක් පත් කරගෙන වැඩක් නෑ.මං ඉල්ලීමක් කරනවා. කෝරල 05 ට ඔබතුමාගෙ මන්ත්‍රිවරු ඉන්නවා 17 දෙනෙක්.කොන්ත්‍රාත් කම්කරු කණ්ඩායමක් පත් කරගන්න.අඩුතරමෙ කම්කරුවො 25 ක කණ්ඩායමක් 30 ක කණ්ඩායමක්.ඒ හින්දා මං හිතනවා පරිපාලක වරයා පත් කරගන්න කලින් මේ කණ්ඩායම පත් කර ගැනීම සුදුසුයි කියා මං විශ්වාශ කරනවා. මේකට විරුද්ධ වෙනවා නෙමේ.මේකට ඌණ පූර්ණයක් විදිහට කියන්නෙ.

**ගරු මන්ත්‍රී ඒ.ජී.ඩී. රංජිත් ප්‍රේමලාල් මහතා - ( ස.ජ.බ)**

ගරු සභාපතිතුමනි, ගරුසභාපතිතුමා ඇතුළු මන්ත්‍රි මණ්ඩලයෙන් අවසරයි. ලේකම්තුමිය ඇතුළු කාර්ය මණ්ඩලයෙන් අවසරයි.අපේ රංජිත් උපාලි මන්ත්‍රිතුමා කිව්වා වගේ ඉස්සර අපි දකිනවා කම්කරුවො මාර්ගවල නියමිත රාජකාරිවල යෙදෙනවා.මේ වෙනකොට කම්කරුවො හිටියට නියමිත ස්ථානවල නෑ.ඒ වගේම තමයි ගරු සභාපතිතුමා අපි දැකපු දෙයක් තමයි ඒක ඔබතුමත් දකින්න ඇති.මන්ත්‍රිවරුත් දකින්න ඇති.මේ අයගෙ විනය පිලිබඳවත්.අවුරුදු උත්සවය වෙලාවෙත් අපි දැක්කා.කම්කරුවන්ගේ සමහර වෙලාවට හැසිරීම ඉතාම අශෝභනයි.හැම කෙනාගෙම නෙමේ.ඉතාම අතලොස්සකගෙ.සමහර වෙලාවට ඉන්නෙ කව්ද කියලවත් මේ අයට මතක නෑ.ඒ නිසා බඳවා ගන්නකොට වගේම ඉන්න අයට උපදෙස් ටිකක් දෙන්න වෙයි. මේ සභාවෙ කටයුතු කරන්නෙ කොහොමද කියන එක පිලිබඳව.මත්පැන් පානය කරගෙන ඉතාම අශෝභන විදිහට හැසිරෙනවා.මාර්ග ගත්තහම සියළුම මාර්ග කැළෑ වැහිලා. මර්දනය කරන්න බැරි තරම් අලි මාන. හැම ගමකම කරන්න බැරි වුනත් නගරේ ආශ්‍රිතව පාරවල් වල හරි පාරවල් සුද්ද කරන්න ඕන.වැඩ පරිපාලකවරයෙක් බඳවා ගන්න එකට අපි විරුද්ධ නෑ.නමුත් මේ අයට ඒ අයගෙ රාජකාරිය, වගකීම සම්බන්ධව කිසිම හැඟිමක් නෑ.ඒ හින්දා මේ අයට උපදෙස් දෙන්න ඒ අයගෙ වගකීම වගේම හැසිරීම පිලිබඳව.

**ගරු මන්ත්‍රී ආර්.ඩී. ලාලිත ඉඳුනිල් මහතා - (ජා.ජ.බ)**

ඇත්තවශයෙන්ම මම නගරයේ ඉන්න නිසා මං දන්නවා විශේෂයෙන්ම කම්කරුවො ඉන්නවා පේනවා ආයෙත් නැතිව යනවා.උදේට ඒගොල්ලො එනවා.ඊට පස්සෙ එයාලගෙ වැඩ ළමයි ගෙනියන්න යනවා. විවිධ විවිධ රාජකාරී.අපි ශ්‍රමදානයක් කරා ස්ටෑන්ඩ් එකේ.ඒ වෙලාවෙ සභාවෙ කම්කරුවො, රියදුරෝ කිසිම කෙනෙක් ආවෙ නෑ.අපි දකිනවා සමහර කම්කරුවො තමන්ගෙ රාජකාරි වෙලාවෙදි, එයාලා චන්ඩි වගේතමයි රගපාන්නෙ.අපේ සභාවෙ වැඩ පරිපාලකවරයෙක් වගේම වැඩ අධීක්ෂණය කරන කෙනෙකුත් නෑ.එහෙම කෙනෙක් බඳවා ගන්නවනම් හොඳ දැනුමක් තියෙන කම්කරුවො පාලනය කරන්න හැකියාවක් තියෙන කෙනෙක් පත්කරගන්න ඕන.තමන්ගෙ රාජකාරිය ඉතාම ඉහලින් කරන පිරිසකුත් ඉන්නවා.ඒ අයව අගය කරනවා වගේම තමන්ගෙ රාජකාරිය පැහැර හරින අය පිළිබඳව අප්‍රසාදය පල කරනවා.

**<u>ගරු මන්ත්‍රීනි ඩබ්.ටී.එම්. චාන්දනී දීපිකා රත්නායක මහත්මිය - ( ස.ජ.බ)</u>**

ගරු සභාපතිතුමනි, ගරුසභාපතිතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලයෙන් අවසරයි. ලේකම්තුමිය ඇතුළු කාර්ය මණ්ඩලයෙන් අවසරයි.ගරු සභාපතිතුමා ලාලිත මන්ත්‍රීතුමා කිව්ව පරිදි අපගේ කම්කරු සේවකයන්ගෙන් සේවයක් සභාවට නොවෙනවම නෙමේ.නමුත් එයාලගෙ සේවාව මීට වඩා විධිමත් විය යුතුයි. බස් ටැන්ඩ් එකට මමත් මගේ අවශ්‍යතාවකට ගිය වෙලාවෙදි මටත් චෝදනා කරා.මම හිතනවා අලුත් කම්කරු මණ්ඩලයක් බඳවගෙන හෝ බස් ටැන්ඩ් එකේ කඩ කාමරවල තියෙන ඒ පරෙවිකූඩු සුද්ද කරලා දීලා අපිට ඒ සභාවට එන්න තියෙන මුදල් ටික නිසි ආකාරව ලබා ගන්න එකත් , කම්කරු මණ්ඩලය සමඟ මේ නවීකරණ කටයුතුත් කරලා මේ සභාවේ කීර්තිනාමය රැකගමු කියලා මං යෝජනා කරනවා.

**<u>ගරු මන්ත්‍රිනී අයි.සද්නා දිල්හානි ප්‍රනාන්දු මහත්මිය - (ශ්‍රී.ල.පො.පෙ)</u>**

ගරු සභාපතිතුමාගෙන් අවසරයි.ඇත්තටම මගේ යෝජනාවකුත් තියනවා එතෙන්දි මගෙ වචනයෙන් කියනවනම් මම පොඩි කොටසක් එකතු කරන්න හදන්නෙ.ගරු සභාපතිතුමා සභාවෙ කම්කරුවන් පිලිබඳ ප්‍රධාන මෙහෙයුම් නිලධාරියටවත් අවබෝධය තියනවද මං දන්නෙ නෑ.අපේ කාඩර් එකක් තියනවා නිලධාරීන්ගේ.තනතුර කම්කරු වුනාට වෙනත් රාජකාරි කරනවා කියන එක ප්‍රසිද්ද රහසක්.තමුන්ගෙ පත්වීම් ලිපියෙ තියන තනතුරේ නෙමේ ඉන්නෙ. ඒ සියල්ල එක්ක තමයි මගේ ඇඹෝගෙදර කොට්ඨාශෙ අනතුරු කීපයක් වුනා. මෝටර්සයිකලයක්වත් පේන්නෙ නෑ වංගුවකදි.මං ගිය සභා වාරෙකදිත් යෝජනාවක් කරලා තියනවා. කම්කරුවො ප්‍රමාණවත් නැත්තම් ඒ සඳහා වල් නාශක යොදලා අත්‍යවශ්‍යම ටිකටවත් ට්‍රැක්ටරයට සවිකරන තලයකින් ඒ අත්‍යවශ්‍යම පාරවල්වල දෙපැත්ත කපලා වල් නාශක හරි යොදලා ගම්වාසීන්ට ඉන් පස්සෙ තමුන්ගෙ ගේ ඉස්සරහ තියන ටික ඉන් පස්සෙවත් කරගන යන්න අවස්ථාවක් දීලා අපි වෙනත් ක්‍රමයකින් හරි මේක කරගත යුතුම වෙනවා. ඉතින් ඒ නිසා වැඩ පරිපාලකවරයෙකුට අධීක්ෂණය කරන්න පිරිසක් නැතිවෙයි.වැඩ පරිපාලකවරයා විතරක් ඉන්නවා වෙයි.ඒ නිසා සුදුසු විදිහට කාඩර් එකේ විදිහට ගම් මට්ටමින් ඒ කාර්ය මණ්ඩලය කොයි ආකාරයකින් හෝ සපයා ගෙන ක්‍රමය වෙනස් කරලාවත් ඒ මාර්ග ටික කැළෑ කපලා සංවර්ධනය කරගන්න කියන ඉල්ලීම කරනවා.ඒ වගේම තමා වීදී පහන් අළුත්වැඩියා කරන පිරිස අධීක්ෂණය කරන්න ප්‍රධාන අධීක්ෂකවරයෙක් ඇති TO මහත්තුරු යටතේ වෙන්නැති ඒ ගොල්ලො ඉන්නෙ.ඒකත් දැන් අක්‍රියම වෙලා තියනවා.වීදී පහන් අළුත්වැඩියා කරන එක අතෑරලම දාන්න එපා.අත්‍යවශ්‍ය ටික තියනවා.අපේ ගම්වල පුදුම විදිහට අපේ තරුණ පිරිස් මත්ද්‍රව්‍ය වලට ඇබ්බැහිවෙලා තියෙනවා.තියලා යන්නෙ වෙන කෙනෙක්,ගන්නෙ වෙන කෙනෙක්. අපි දැකලා තියනවා.ඒ වගේ අත්‍යවශ්‍ය අඳුරු ස්ථානවල තියන වීදී පහන් ටිකවත් අළුත්වැඩියා කරන්න කියලා කාරුනික ඉල්ලීමක් කරනවා.මම ගිය අගෝස්තු මාසෙ ලියුම් දීලා තියෙනවා ලයිට් 3 ක් හදන්න.අත්‍යවශ්‍ය ස්ථාන වල විතරමයි ඉල්ලන්නෙ.තුන්වෙනි වතාවටත් ලියුම් දීලා තියනවා.ඒ වුනාට ප්‍රතිසංස්කරණය කරන්නෙ නෑ.ඉන්ධන හේතුවද කියලා දන්නෙ නෑ.කාර්ය මණ්ඩලය ඒක බාරගෙන නැද්ද කියන එක දන්නෙත් නෑ. ඒ හින්දා ඒ පිලිබඳ ඔබතුමා දැඩි අවධානය යොමු කරන්න කියන ඉල්ලීම කරනවා.

**<u>ගරු සභාපති වයි.ජී.සංජීව කරුණාසාගර මහතා</u>**

මම ස්තුතිවන්ත වෙනවා ගරු රංජිත් උපාලි මන්ත්‍රීතුමාට මේ කාරණා ටික ප්‍රකාශ කිරීම සම්බන්ධව.මොකද පඩුවස්නුවර ප්‍රාදේශීය සභාවේ මීට අවුරුදු විස්සකට විතර එහා තිබුන තත්වයත් කමයි ඔබතුමා කිව්වෙ.කනෝගම උප කාර්යාලය තිබුනා.මල්වානේගෙදර උප කාර්යාලය තිබුනා, බන්ඩාරකොස්වත්ත උප කාර්යාලය තිබුනා.එතකොට ඒ උප කාර්යාලවලට අනුයුක්ත සේවක මණ්ඩලයකුත් හිටියා. දැන් ඒ සියල්ල සභාවට මධ්‍යගත වෙලා අවුරුදු ගනණාවක් වෙනවා.ඊළඟට අපි පුංචි කාලෙත් පාරවල් සුද්ද කරන කණ්ඩායමක් හිටියා. හැබැයි අපි බලයට එනකොට මේ සියල්ල අතෑරලා තිබුනෙ. ප්‍රතිපත්තිමය කරුනකුත් තිබුනා.ඒක අපිට අයිති කාරණයක් නෙමේ.ගෙවල්වල ඉන්න අය ඒවා සුද්ද කරගත්තාවෙ වගේ තැනකට

පොඩි ලපු වීමකුත් තිබුනා.ඔය කාරණා සියල්ල අරගෙන තමයි මේ වෙනකොට තියන තත්වය වෙනස් කරලා ඔබතුමා අර කිව්වෙ එකම පාරක්වත් සුද්ද කරන්නෙ නෑ කියලා.දැන් ආරම්භ කරලා තියෙන්නෙ.අපිට ඕනකම තිබුනා මාර්ග සංවර්ධනය ගත්තොත් මේ තාර දැමීම වගේ දේවල් අපිට පහුගිය කාලෙ දකින්න තිබුන දෙයක් තමා මාර්ගය නඩත්තු කරනවා කියන එක අතෑරලා තිබුනා.ඒ වෙනුවට නැවත පාර කැඩෙනකම් ඉදලා නැවත සල්ලි දාලා අලුතින් හදනවා වගේ වැඩක් තිබුනෙ.අර ප්‍රිමික්ස්, මට මතකයි රංජිත් උපාලි සභාපතිවරයා ඉන්න කාලෙ ප්‍රිමික්ස් වැඩේ කරා.ඒකත් අතෑරලා තිබුනෙ.ඒ නිසා අපි දැන් ප්‍රිමික්ස් වැඩේ පටන් ගත්තා.මාර්ග සංවර්ධනය සම්බන්ධයෙන් අපි අපේ සංවර්ධන නිලධාරී සුමිත් මහත්තයා පත් කරලා කණ්ඩායමක් දැන් ලබා දීලා තියනවා ප්‍රිමික්ස් අනලා පාරේ පුංචිවලවල් තියනවනම් ඒක කැඩෙන්න කලින් පිළිසකර කරන වැඩේ කරන්න.පාරවල් 4 ක් අපි අවසන් කරලා තියනවා.ඒ වැඩේ දිගටම යන්න ඕන.මේ දවස්වල පුංචි ගැටළුවකට අපි මූණ දීලා ඉන්නවා ලෝක වෙළඳපොලේ ඉන්ධන මිල වැඩිවීම සමඟ තාර මිලත් වැඩි වෙලා තියනවා.දෙගුණයක් වෙලා තියනවා තාර මිල.ඒ නිසා අපේ අරමුණ තමයි දැනට තිබ්බ ප්‍රශ්නය අර ඔබතුමාලා කියපු තත්වය තියනවා මෙන්න මෙහෙම කාඩර් එකේ දැනට තියන තනතුරේ නෙමේ එයාලා වෙනත් රාජකාරිවල නිරත වීම දැන් ප්‍රසිද්ද රහසක් තමයි ඒක. හැබැයි ඒකෙදි මං මෙහෙම දකිනවා ඒ තමයි. විවිධ දේශපාලන හෝ මොකක් හරි අරමුණක් මත ගන්න ඇති. නමුත් ඒ ගත්ත සේවකයො දැන් සභාවෙ ඉන්න අය .සමහර අය ඉන්නවා ඔවුන් බඳවාගත්ත තනතුරු නාමය ගැලපෙන්නෙ නෑ.සමහර අය ඉන්නවා මාර්ග කම්කරු.නමුත් ඔවුන් ඊට වඩා තනතුරක් හොබවන්න සුදුසු මට්ටමේ අය.ඒ නිසා දැන් අපි අපහසුතාවයකට පත් වෙලා ඉන්නවා.අපේ කාඩර් එකේ වැඩ ක්ෂෙත්‍ර කම්කරු නාමය.එයා කරන්නෙ වෙන රාජකාරියක්.ඇත්තටම ඔහුට වැඩ ක්ෂෙත්‍ර කම්කරු නෙමේ ගැලපෙන්නෙ. අපි උත්සාහ කරමින් ඉන්නවා.කාඩර් එක එයාට ගැලපෙන තනතුරකට සංශෝධනය කරන්න තමයි අපි සූදානම් වෙන්නෙ.එතකොට අපිට පුළුවන් වෙනවා අදාල තනතුරට බඳවා ගන්න. නමුත් දැනට අපේ කම්කරුවො ප්‍රමාණයක් ඉන්නවා. 12 කට ආසන්න ප්‍රමාණයක්.ඒ අය අපි විවිධ වැඩ වලට යොදවලත් තියනවා.යොදවලා තියන අතරත් ඉන්න ටිකෙන් හරි වැඩේ කරගන්න තමයි අපිට වැඩ පරිපාලක වරයෙක් අවශ්‍ය වෙන්නෙ. ඒක තමා මේ බඳවා ගැනීම කරන්න යන්නෙ. අර ඔබතුමා බලාපොරොත්තුවන වැඩේ නැවත ආරම්භ කරන්න තමයි මේ සැලසුම් කරන්නෙ.

<u>ගරු මන්ත්‍රී ආර්. එච්. රංජිත් උපාලි මහතා - (ස්වාධීන)</u>

මගෙ ඉල්ලීම තමයි මේ කම්කරුවො ටික කොන්ත්‍රාත් පදනම මත නෙමේ දෛනික වැටුප් පදනම මත කෝරල 5 කින් 5 දෙනා ගානෙ බඳවා ගන්න.

**ඒ අනුව වැඩ බිම් භාරව කටයුතු කිරීම එම කටයුතු අධීක්ෂණය කිරීම සහ වැඩ ක්ෂේත්‍ර කම්කරුවන්ගේ රාජකාරි කටයුතු අධීක්ෂණය සඳහා මෙම ආයතනයට සේවා ගිවිසුම් පදනම මත ප්‍රාථමික ශ්‍රේණියේ වැඩ පරිපාලක තනතුර සඳහා සේවක මහතකු බඳවා ගැනීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ එදින පැමිණි සිටි සභිකයන් විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී .**

## (ඉ) <u>VII. ගරු සභාපති වයි.ජී.සංජීව කරුණා සාගර මහතා විසින් කරනු ලබන අංක 6.(ඉ).VIIදරණ යෝජනාව</u>

2027 වර්ෂයේ සහභාගීත්ව අයවැය සකස් කිරීමට අදාලව ප්‍රාග්ධන වියදම් ඇස්තමේන්තුවට සහ සංවර්ධන සැලැස්මට ඇතුළත් කිරීමට අදහස් කරනු ලබන යෝජනා, 2026.06.30 දිනට පෙර ලබා ගැනීම සඳහා බල ප්‍රදේශයේ ජනතාව වෙත පුවත්පත් මඟින් කෙරෙන නිවේදනයක් 2026.05.31 දිනට පෙර භාෂා ත්‍රිත්වයෙන් පළ කිරීමට කටයුතු කරන ලෙස වයඹ පළාත් ආණ්ඩුකාරවර විසින් 2020.10.28 දිනැතිව 2020 ප්‍රාදේශීය සභා අයවැය සම්පාදනය හා බලාත්මක කිරීමේ රීති යටතේ නියම කර ඇත.ඒ අනුව එම පුවත්පත් නිවේදනය භාෂාත්‍රයෙන් පළ කිරීමට හා මුදල් ගෙවීම සුදුසු බව යෝජනා කරමි.

<u>ගරු මන්ත්‍රී බී. සුදත් උදය කුමාර මහතා- (ජා.ජ.බ)</u>

ගරු සභාපතිතුමා විසින් ගෙන ආ යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

**ඒ අනුව 2027 වර්ෂයේ සහභාගීත්ව අයවැය සකස් කිරීමට අදාලව ප්‍රාග්ධන වියදම් ඇස්තමේන්තුවට සහ සංවර්ධන සැලැස්මට ඇතුළත් කිරීමට අදහස් කරනු ලබන යෝජනා, 2026.06.30 දිනට පෙර ලබා ගැනීම සඳහා බල ප්‍රදේශයේ ජනතාව වෙත පුවත්පත් මඟින් කෙරෙන නිවේදනයක් 2026.05.31 දිනට පෙර භාෂා**

**ත්‍රිත්වයෙන් පළ කිරීමට හා ඒ සඳහා මුදල් ගෙවීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ එදින පැමිණි සිටි සභිකයන් විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී .**

**(ඉ) <u>VIII. ගරු සභාපති වයි.ජී.සංජීව කරුණා සාගර මහතා විසින් කරනු ලබන අංක 6.(ඉ).VIIIදරණ යෝජනාව</u>**

පඩුවස්නුවර ප්‍රාදේශිය සභාව විසින් භුක්ති විදිනු හා නඩත්තු කරනු ලැබූ, නමුත් මෙම සභාව වෙත විධිමත්ව පවරා දී නොමැති දේපලක් වන මාවී ඇල සතිපොල 2014 දැයට කිරුල වැඩසටහන යටතේ ඉදි කර ඇත.වසර 3 කට ආසන්න කාලයක සිට සතිපොල ක්‍රියාකාරීත්වය අසාර්ථක වීම නිසා පොලෙන් කිසිදු ආදායමක් නොලැබීම මත එහි සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය ඉදි කිරීම සඳහා ලබා දෙන මෙන් පඩුවස්නුවර නැගෙනහිර ප්‍රාදේශිය ලේකම් විසින් කර ඇති ඉල්ලීමට එකඟතාවය ලබා දීම සුදුසු බව යෝජනා කරමි.

<u>ගරු මන්ත්‍රී ඒ.පී.ඩී. ඉෂාන් මධුශංක පීරිස් මහතා - (ජා.ජ.බ)</u>

ගරු සභාපතිතුමා විසින් ගෙන ආ යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

<u>ගරු සභාපති වයි.ජී.සංජීව කරුණාසාගර මහතා</u>

ඒ වගේම මේකට එකතු කරන්න කාරණා කීපයක් තියනවා.මේ පොල කලින් පැවැත්තුවෙ කුමාර මහත්තයාගෙ ඉඩමේ පුද්ගලිකව. ඊට පස්සෙ තමයි ගොඩනැගිල්ලක් හදලා ඇතුලට ගෙනිච්චෙ.මේක අසාර්ථකභාවයට පත්වෙච්ච පොලක්.මේ භූමිය අපිට අයිති නෑ.භූමිය අයිති ප්‍රදේශය ලේකම්ට මේ සම්බන්ධව සාකච්ඡාවක් ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ සියළු ආයතන එකතු වෙලා පැවැත්වූවා.ඒකෙදි පොදු එකඟතාවයකට අපි ආවා.පඩුවස්නුවර සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලයට රජයේ ඉඩමක් නෑ.ඒ නිසා මේ භූමිය ඒකට ලබා දෙන එක සුදුසුයි කියලා.ප්‍රාදේශිය ලේකම්තුමියගේ ඉඩම ඒකට ගන්න ඉල්ලීමක් කරන්නෙ.පොල ඉදි කරලා තියන නිසා සභාව විසින් මේකට තීරණයක් ගන්න ඕන.ආපහු බාර දෙනවයි කියන එකට.දැනට පඩුවස්නුවර නැගෙනහිර බල ප්‍රදේශයේ ජනතාවට දැන් තියන ප්‍රධාන ප්‍රශ්නයක් තමයි එම්ඕඑච් එක ස්ථානගත කරන්න තැනක් නැති කම. හිටපු තැන මොරගනේ මහ විද්‍යාලය ඉස්සරහ හිටපු විදුහල්පති සූරියසේන මහත්තයාගෙ නිවසෙ තමයි එම්ඕඑච් එක තිබුනෙ.ඒක මිලදී අරගෙන තිබුනා වෙනත් කෙනෙක් විසින් ඇත්තම කාරණාව මෙතනින් එළියට දැම්මට පස්සෙ අපේ අංගමුව සායන මධ්‍යස්ථානයට දැන් ගෙනල්ලා ස්ථාපිත කරලා තියනවා.ඒකෙ ගිවිසුම තමයි අත්සන් කරන්න අනුමැතිය ගත්තේ. දීර්ඝකාලීනව අපිට මේක දීලා තියන්නත් බෑ.ඒකෙ ඉඩකඩ මදි.ස්ථිර වශයෙන්ම තැනක් ඕන.වයඹ පළාත් සෞඛ්‍ය දෙපාර්තමේන්තුව ඇවිල්ලා ඔය ස්ථානය නරඹලා, ඉංජිනේරුවො ඇවිල්ලා පරීක්ෂා කරලා තමයි ඔවුන් කියන්නේ මේක වඩා සුදුසුයි මේ වැඩේට කියලා.ඒ නිසා පොලක් හරියට ක්‍රියාත්මක වෙන්න නැති නිසා ජනතාවට වඩා අවශ්‍යතාවයක් තියෙන්න ඒක නිසා.මාවිඇලට පොලක අවශ්‍යතාවයක් අවශ්‍ය නම් අපිට ඒ සඳහා ඒජීඒ ඔෆිස් එක පිටුපස්සෙ අපේ ඉඩමේ ඒකෙ පොල පවත්වන්න ඕන නම් හදන්න පුළුවන්.අපේ ඉඩම. ඒ හින්දා මේ යෝජනාව සම්මත කරලා නැගෙනහිර ජනතාවට සාධාරණ ඉෂ්ට කරමු.

<u>ගරු මන්ත්‍රී ආර්. එච්. රංජිත් උපාලි මහතා - (ස්වාධීන)</u>

ගරු සභාපතිතුමා මං හිතන්නෙ 2026 අවුරුද්දෙ 1 වන කාර්තුවෙ මේ සතිපොල සම්බන්ධව අශෝක මන්ත්‍රීතුමාත්, රංජිත් මන්ත්‍රීතුමත් මේ සභාවට කරුණු ඉදිරිපත් කරා. ඒ අවස්ථාවේ පොල ආරම්භ කිරීම පිලිබඳව.මේ පොල හදනකොට වයඹ පළාත් සභාවේ හිටියෙ දයාසිරි ජයසේකර අමාත්‍යතුමා.මේ පොල හදලා සභාවට පවරා දෙන්න අවශ්‍ය කරන කටයුතු සිද්ද කරා.ප්‍රාදේශීය ලේකම්ගෙ ඉඩමෙ සතිපොල හැදුවට පස්සෙ අයිතිය තියෙන්නෙ සභාවට.ඒත් ඒ අයිතිය පවරලා දීලා නෑ.ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හදන්න තිබුනෙ කනෝගම.එහෙම වුනානම් එම්ඕඑච් එක හදන්නත් නිශ්චිත ස්ථානයක් තිබුනා.නමුත් එහෙම වුනේ නෑ.මගේ පෞද්ගලික මතය.මං මේකට විරුද්ධ වෙනවා නෙමේ.සතිපොල හදලා ඉවරයි.පහුගිය කාලෙ කතිකාවතක් ගියා ප්‍රාදේශීය සභා දෙකක් ගැන.එහෙම වෙනවනම් මේ භූමියේ ආදාහනාගාරයක් හදන්න පුළුවන්.අපිට තියෙන්නෙ එක ආදාහනාගාරයයි.ග්‍රාම නිලධාරී වසම්103 යි.අංගමු කෝරළේ පාදක කරගෙන ආදාහනාගාරයක් හදන්න පුළුවන්කමක් තියෙනවනම් මේක සුදුසුම ස්ථානයක්.කොස්දෙනියෙ රෝහල තියන තැන තමයි එම්ඕඑච් එකට සුදුසුම ස්ථානය.මගෙ අදහස මේ

ඉදිරිපත් කරන්නෙ.ආදායම් උත්පාදන මාර්ගයක් විදිහට අංගමු කොරලේට ආදාහනාගාරයක් හැදීම ඉතාම සුදුසු වැඩක්.මම මේ ස්ථානය එම්ඕඑච් එකට දෙනවට මම එකඟ නෑ.මොකද සභාවේ තියන වත්කමක් අර්ධ වශයෙන් හරි අපිට හිමිවෙලා තියෙන මොහොතෙ ඒක අයිතිකරගන්න උත්සාහ කරන්න ඕන.කොස්දෙණිය භූමිය හා ගොඩනැගිලි සම්බන්ධ කරගෙන එම්ඕඑච් එක හදන්න පුළුවන් නිසා.

**<u>ගරු සභාපති වයි.ජී.සංජීව කරුණාසාගර මහතා</u>**

හිටපු සභාපතිතුමා ගෙනාපු යෝජනාව ඔතන ආදාහනාගාරයට සුදුසුයි කියනවනෙ.මෙතන දැන් තවත් නිවාස ඉදිකරලා තියෙන්නෙ.ගේට්ටුව ඉස්සරහත් දැන් ගෙයක් තියනවා. ඒ නිසා ජනාකීර්ණ තැනක්.ඊළඟට ඔබතුමා කිව්වනෙ තවත් ප්‍රාදේශිය සභාවක් ගැන.ප්‍රාදේශිය සභාවෙ අදහස මොකක් හෝ නමුත් දැන් ඒ පලාතට නගරයක අවශ්‍යතාවය තියනවා.නගරයේ අවශ්‍යතාවය ගත්තහම මංසන්ධි දෙකක් තියනවා.ප්‍රධාන පාරවල් කීපයක්, හොරොම්බාව පාර, මූණමල්දෙණිය, කුලියාපිටිය පාර, කොටඹපිටිය පාර යන මංසන්ධි දෙකක් තියන ප්‍රාදේශිය ලේකම් කාර්යාලය තියෙන මං සන්ධිය.රාජ්‍ය ආයතන ටික ගොනු වෙන්න ඕන එක තැනකට.එතකොට තමා ප්‍රවාහන පහසුකම් ටික සැලසෙන්නෙ මිනිස්සුන්ට යන්න එන්න පහසුවෙන්නෙ. ඔබතුමා කිව්වනෙ කොස්දෙනිය හොදයි එම්ඕඑච් එකට කියලා.මම සතුටුයි ගම හින්දා හැබැයි ඇත්තටම ගත්තොත් අපේ ගමේ අයට පහසුයි.එතෙන්ට යන්න. හැබැයි නැගෙනහිර ලේකම් කොට්ඨාශෙ ජනතාවට එතෙන්ට යන්න අපහසුයි.පාර තියනවා.හැබැයි පොදු ප්‍රවාහන පහසුකම් තවම නෑ.කොට්ඨාශෙ අවසන් වෙන්නෙ රඹාවැව හන්දියෙන්, මේ පැත්තෙන් මායාකඩවර පැත්තෙන්, කිරිමැටියාවෙන් මඟුලාගම පැත්තෙන් අවසන් වෙන්නෙ.තාමත් ගමනාගමන පහසුකම් තියෙන්නෙ ඔය හන්දියෙ.අනාගතේ ප්‍රාදේශිය සභාවක් කරනවනම් නගරයක් බවට පත් කරන්න වෙන්නෙ ඔතන.ෂෙඩ් එක තියනවා.ආයුර්වේද මධ්‍යස්ථානයක් ඔතන හදමු කියන අදහස තියනවා. මෙතන නගරයක් බවට පත් කිරීමේ ප්‍රවණතාවය තියනවා.ඒ නිසා ඒ අවශ්‍යතාවය සලකලා තමයි පොල භූමිය එම්ඕඑච් එකට දෙමු කියන යෝජනාව ගෙනාවෙ.කිරිමැටියාව නගරයක් බවට පත් කිරීමේ අදහස ඉස්සර තිබුනා.හැබැයි ඒක නගරයක් වුනාට ඒක තියන්නෙ එහා කොනේ. මධ්‍යස්තානයක් හැටියට තියෙන්නෙ මෙතන.

**<u>ගරු මන්ත්‍රී ජේ.එම්. දිලිප් ජයසිංහ මහතා - (ජා.ජ.බ)</u>**

ගරු සභාපතිතුමනි,මම මේ අදහස් දෙකටම එකඟයි. ඔබතුමාගෙ අදහසටත් මං ගරු කරනවා.ඒ වගේම හිටපු සභාපතිතුමාගෙ අදහසටත් මං ගරු කරනවා.දෙකම ඇත්ත කරුණු දෙකක්. නමුත් කලින් අදහසත් ප්‍රතික්ෂේප නොකර ඒකටත් සුදුසු ස්ථානයක් අපි හොයාගෙන එතුමගෙ අදහසත් ක්‍රියාවට නැංවුවොත් අපේ ප්‍රදේශවාසීන්ට අවශ්‍යතා ඉෂ්ට වෙනවා.ඒ කරුනු දෙකම අපිට බලපාන කරුනු දෙකක්.පුළුවන්නම් එම්ඕඑච් එකට සුදුසු ස්ථානයක් සකස් කරලා දීලා ඒ වැඩෙත් කරමු.හිටපු සභාපතිතුමාගේ අදහසත් ක්‍රියාවට නංවමු.

**<u>ගරු සභාපති වයි.ජී.සංජීව කරුණාසාගර මහතා</u>**

පඩුවස්නුවර ආදාහනාගාරය පොල්තවානෙ ස්ථානගත වෙලා තියනවා.නිකවැරටියෙ ආදාහනාගාරය තියෙන්නෙ නිකවැරටියෙ.වාරියපොල එක තියෙන්නෙ වල්පොල.හැබැයි අපේ ප්‍රාදේශිය සභා බල ප්‍රදේශයේ රඹාවැවට යනකම් තියනවා.වාරියපොල සිට නිකවැරටියට යනකම්ම හිස් පදාසයක් එතකොට අපිට වඩා සුදුසු වෙන්නෙ ආදාහනාගාරයට අපේ රනෝරාව අක්කර 3 කට ආසන්න තුඩුගල උයන වත්තෙ ඉඩම තියෙනවා.ඒ ගැන අවධානය යොමු වෙලා තියෙන්නෙ. මාවිඇල ආදාහනාගාරය හැදුවා කියන්නකො. හැබැයි මාවීඇලේ ඉදලා පොල්තවානට වැඩි දුරක් නෑ.

**<u>ගරු මන්ත්‍රී ආර්.ඩී. ලාලිත ඉඳුනිල් මහතා - (ජා.ජ.බ)</u>**

සභාපතිතුමා පොඩි අදහසක් ඉදිරිපත් කරන්න තියෙනවා මේ සම්බන්ධව.ඔය පොල භූමියේ ගොඩනැගිලි හදලානෙ දැන් තියෙන්නෙ.ඒවා කඩන්නෙ නැතිව ගන්න දෙයකට අපිට ප්‍රයෝජනයට ගන්න පුළුවන්කමක් තියෙනවනම් හොදයි.මොකද ඕවා කඩලා නැවත හදනවා කියන්නෙ දැවැන්ත මුදල් නාස්තියක්.

**<u>ගරු මන්ත්‍රී ඒ.පී.ඩී. ඉෂාන් මධුශංක පීරිස් මහතා - (ජා.ජ.බ)</u>**

ගරු සභාපතිතුමනි සියළුදෙනාගෙන් අවසරයි. අපේ ගරු රංජිත් උපාලි මන්ත්‍රිතුමාගේ අදහස හොද අදහසක්.හැබැයි ප්‍රාදේශිය සම්බන්ධිකරණ නැගෙනහිර කමිටුවෙ අපි වාඩිවෙලා ඉද්දි සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලයක් නැතිකම නිසා තියන අපහසුතාවය අපි හොදටම අත් විදිනවා.එතකොට ඒක ඇතුලෙ

එතුමන්ලා පුදුමාකාර අපහසුතාවයක් මැද තමයි ඉන්නෙ. හැමදාම ස්ථිර තැනක් ඉල්ලලා ඉල්ලීම් කරනවා සම්බන්ධීකරණ කමිටුවෙ සභාපතිතුමාට සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීතුමා ඒ අපහසුතා මැද්දෙ වෛද්‍ය නිලධාරිතුමා,කාර්ය මණ්ඩලය ඒකෙ ප්‍රතිඵලය අවසානෙට ගලා එන්නෙ අපි නියෝජනය කරන අපේ ආදරණීය ජනතාවට නිසි ඵලදායි සේවාවක් ලබා ගැනිමේ ගැටළුව.ඉතාම යෝග්‍යයයි සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය ඔය කියන ස්ථානයට රැගෙන ඒමට හම්බවුනොත් රත්මල්ල, කොළඹගම, වගේ අපේ ජනතාවට ලොකු සේවයක් ලැබෙනවා. ඉතාම යෝග්‍යයයි මේ මොහොතේ රංජිත් උපාලි මන්ත්‍රීතුමාගේ අදහසට ඔබතුමත් ඌණපූර්ණයක් කරා මට මතකයි සතිපොල භූමිය සතිපොල පවත්වාගෙන යන්න හෝ ප්‍රාදේශීය සභාවේ මුදල් උත්පාදනය කරන්න මෙතෙක් හෝ යම් කාර්යයක් යෝජනා කරනවනම් ඒකටත් අපිට ඉඩ තියනවා.මේක ප්‍රාදේශිය ලේකම්තුමියගෙ.එතුමියටත් මේ මොහොත වෙද්දි දැඩි අවශ්‍යතාවයක් තියෙන්නෙ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලයක් ස්ථිරව ස්ථාපිත කිරීමේ අවශ්‍යතාවය.එතකොට මේක අත්පත් කරගන්න ගියාමත් ලොකු ක්‍රමවේදයක් තියෙයි.එතකොට අවසානේ වෙන්නෙ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලයෙන් ඉතාමත් යහපත් සේවයක් ලබාගන්න තියන අවස්ථාවක් ගිලිහීම.ඒ නිසා මේ මොහොතේ මම ගරු මන්ත්‍රීතුමාලට, මන්ත්‍රීතුමියලා මගෙ අදහසක් විදිහට ඉදිරිපත් කරනවා එම යෝජනාවට අවස්ථාව ලබා දීම ඉතාම යෝග්‍යයයි.ඉතාම වටිනවා කියලා.

<u>**ගරු මන්ත්‍රීනී ඩී. නිමාලි දිල්හානි මෙනවිය - ( ස.ජ.බ)**</u>

ගරු සභාපතිතුමා ප්‍රධාන ගෞරවනීය මන්ත්‍රීමන්ඩලයෙන් සහ ලේකම්තුමිය ප්‍රධාන කාර්ය මණ්ඩලයෙන් අවසරයි.ඇත්තටම ගරු සභාපතිතුමා මං හිතන්නෙ පඬුවස්නුවර නැගෙනහිර ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශෙ තමයි මමත් ජීවත්වෙන්නෙ. ඇත්තටම ආදාහනාගාරයක් අවශ්‍යයයි.ආදාහනාගාරය ඕන මැරුනහමනෙ. උපතේදී දරුවෙකුට බෙහෙත් ටික විදගන්න අම්මට ඒ අවශ්‍ය උපදෙස් ටික ගන්න ඒ හැමදේම වෙන්නෙ ඔතනින්නෙ.එතකොට ඉස්සරලා ඒ ක්‍රමවේද ටික යන්න ඕනිනෙ.ඊට පස්සෙනෙ හිටපු සභාපතිතුමා කිව්ව තැනට අපිට යන්න වෙන්නෙ ආදාහනය කරන එක.ඇත්තටම ආදාහනාගාරයක් අපිට දැන් තියනවනෙ.අපේ ආදාහනාගාරයේ එකවර දේහ 2 ක් ආදාහනය කරන පහසුකම තියනවා.එතකොට සභාපතිතුමා මම මේ මධුශංක මන්ත්‍රීතුමා කිව්ව අදහසටත් එකඟ වෙනවා නැගෙනහිර ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශෙ ඒ කාලෙ ඉදන්ම ඇදි ඇදි එන කාරණයක් ඕක.අම්මා කෙනෙකුට තමන්ගෙ දරු ප්‍රසූතියෙන් පස්සෙ ඒ දරුවට ලබාදෙන එන්නත් ඒ සියළුදේටත් සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලයෙන් බොහොම සේවයක් වෙනවා. ඇත්තටම හෙට්ටිපොල ඒජීඒ ඔෆිස් එක ඉස්සරහ තියෙන්නෙ එම්ඕඑච් එක. ලොකු පහසුවක් වෙනවා නගරෙ ආශ්‍රිතව තියෙන එක.එනිසා මම ගෞරවයෙන් ඉල්ලා සිටිනවා මේ මන්ත්‍රී මණ්ඩලයෙන් මේ හදලා තියෙන්නෙත් රජය වියදම් කරපු ගොඩනැගිල්ලක්.මේකත් මේ සභාව සතු භූමියක සිද්ද වුනාට මේ මහජනතාවගෙ තමයි මේ දේත්.ඒකෙ කරුනු අවුරුදු 3 ක් තිස්සෙ සිද්ද නොවෙනවනම් අර නූපන් දරුවා වෙනුවෙන් අපි යමක් ආයෝජනය කරන්න, දෙන්න සූදානම් වෙනවනම් වැඩිහිටියො හැටියට ඒ අවස්ථාව දීම, වගකිව යුතු මන්ත්‍රීවරු හැටියට අපේ වගකීමක්, යුතුකමක්. පක්ෂ පාට භේදයකින් තොරව මේ අවශ්‍යතාවය සපුරිය යුතුමයි. මම හිස නමා ඉල්ලීමක් කරනවා. මේ ආයතනය මේ ගොඩනැගිල්ල ප්‍රාදේශීය සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය ඉදිකරන්න පඬුවස්නුවර නැගෙනහිර අපිට බොහොම අස්වැසිල්ලක් මේ අය මේක දෙනවනම්.ඉතින් බොහොම ගෞරවයෙන් ඉල්ලනවා ඔබතුමාලාගෙන් මෙම ස්ථානය ලබා දීම සුදුසු බවට මං පෞද්ගලිකව කියනවා ඒකට එකඟතාවය ඔබ සියළුදෙනා ලබා දෙන්න කියලා මං බොහොම ගෞරවයෙන් ඉල්ලා සිටිනවා.

**ඒ අනුව පඬුවස්නුවර ප්‍රාදේශිය සභාව විසින් භුක්ති විදිනු හා නඩත්තු කරනු ලැබූ, නමුත් මෙම සභාව වෙත විධිමත්ව පවරා දී නොමැති දේපලක් වන මාවී ඇල සතිපොල 2014 දැයට කිරුල වැඩසටහන යටතේ ඉදි කර ඇත.වසර 3 කට ආසන්න කාලයක සිට සතිපොල ක්‍රියාකාරීත්වය අසාර්ථක වීම නිසා පොලෙන් කිසිදු ආදායමක් නොලැබීම මත එහි සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය ඉදි කිරීම සඳහා ලබා දෙන මෙන්**

**පඩුවස්නුවර නැගෙනහිර ප්‍රාදේශීය ලේකම් විසින් කර ඇති ඉල්ලීමට එකඟතාවය ලබා දීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ එදින පැමිණි සිටි සභිකයන් විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී .**

**(ඉ) <u>IX. ගරු සභාපති වයි.ජී.සංජීව කරුණා සාගර මහතා විසින් කරනු ලබන අංක 6.(ඉ). IX දරණ යෝජනාව</u>**

පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රධාන 2026 යටතේ මල්වානේගෙදර පන්සල මාර්ගයේ කුට්ටිගල අතුරා ඇති කොටස මිල ගණන් කැඳවා ප්‍රතිසංස්කරණය කිරීම සුදුසු බව යෝජනා කරමි. ඇස්තමේන්තු මුදල රු.2,500,000.00

**<u>ගරු මන්ත්‍රිනී ඊ.ඒ. ඉරාෂි ප්‍රියදර්ශනී මහත්මිය - (ජා.ජ.බ)</u>**

ගරු සභාපතිතුමා විසින් ගෙන ආ යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

**ඒ අනුව පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රධාන 2026 යටතේ මල්වානේගෙදර පන්සල මාර්ගයේ කුට්ටිගල අතුරා ඇති කොටස මිල ගණන් කැඳවා ප්‍රතිසංස්කරණය කිරීම (ඇස්තමේන්තු මුදල රු.2,500,000.00) සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ එදින පැමිණි සිටි සභිකයන් විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී .**

**(ඉ) <u>X. ගරු සභාපති වයි.ජී.සංජීව කරුණා සාගර මහතා විසින් කරනු ලබන අංක 6.(ඉ). X දරණ යෝජනාව</u>**

පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රධාන 2026 යටතේ කාබනික අපද්‍රව්‍ය ගොනු කිරීම සඳහා නව ගොඩනැගිල්ලක් මිල ගණන් කැඳවා ඉදි කිරීම සුදුසු බව යෝජනා කරමි.ඇස්තමේන්තු මුදල රු.5,000,000.00

**<u>ගරු මන්ත්‍රී එම්.ජී.මංජුල ප්‍රසන්න මංජුල මල්ලව ආරච්චි මහතා - (ජා.ජ.බ)</u>**

ගරු සභාපතිතුමා විසින් ගෙන ආ යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

**ඒ අනුව පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රධාන 2026 යටතේ කාබනික අපද්‍රව්‍ය ගොනු කිරීම සඳහා නව ගොඩනැගිල්ලක් මිල ගණන් කැඳවා ඉදි කිරීම (ඇස්තමේන්තු මුදල රු.5,000,000.00) සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ එදින පැමිණි සිටි සභිකයන් විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී .**

**(ඉ) <u>XI. ගරු සභාපති වයි.ජී.සංජීව කරුණා සාගර මහතා විසින් කරනු ලබන අංක 6.(ඉ). XI දරණ යෝජනාව</u>**

පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රධාන 2026 යටතේ පල්ලේගම ඝන අපද්‍රව්‍ය මධ්‍යස්ථානයේ අංක 02 ගොඩනැගිල්ල වටා කාණු පද්ධතිය හා වැහි පිළී ඉදි කිරීම සුදුසු බව යෝජනා කරමි.ඇස්තමේන්තු මුදල රු.3,000,000.00

**<u>ගරු මන්ත්‍රී බී. සුදත් උදය කුමාර මහතා- (ජා.ජ.බ)</u>**

ගරු සභාපතිතුමා විසින් ගෙන ආ යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

<u>ගරු සභාපති වයි.ජී.සංජීව කරුණාසාගර මහතා</u>

මේ කාණු පද්ධතිය ඕනි වෙන්නෙ ඇත්තටම මේ ඉඩම පිහිටලා තියෙන්නෙ ආනතියට.ඇලයක් සහිතව පිහිටලා තියෙන්නෙ.අපි හදලා තියෙන ගොඩනැගිල්ලේ හරහා තමයි වතුර යන්නෙ.එතකොට කුණු හරහා තමයි වතුර යන්නෙ.කුණු ටික හරහා වතුර ගියාට පස්සෙ පල්ලෙහා ඉන්න මිනිස්සුන්ගෙන් අපිට සැහෙන ප්‍රශ්න එනවා.එනිසා ඉදිරියේ කානුවක් ඉදිකරන්න තමයි මේ යෝජනාව කරන්නෙ.

**ඒ අනුව පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රධාන 2026 යටතේ පල්ලේගම ඝන අපද්‍රව්‍ය මධ්‍යස්ථානයේ අංක 02 ගොඩනැගිල්ල වටා කාණු පද්ධතිය හා වැහි පිළී ඉදි කිරීම (ඇස්තමේන්තු මුදල රු.3,000,000.00) සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ එදින පැමිණි සිටි සභිකයන් විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී .**

**(ඉ) XII. ගරු සභාපති වයි.ජී.සංජීව කරුණා සාගර මහතා විසින් කරනු ලබන අංක 6.(ඉ). XII දරණ යෝජනාව**

අමාත්‍යාංශ ආධාර, රාජ්‍ය පරිපාලන පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය යටතේ හෙට්ටිපොල සියඹලාගස්වැටිය භූ දර්ශන ව්‍යාපෘතිය අසල වැසිකිළි පද්ධතියක් ඉදි කිරීම සුදුසු බව යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ඒ.පී.ඩී. ඉෂාන් මධුශංක පීරිස් මහතා - (ජා.ජ.බ)**

ගරු සභාපතිතුමා විසින් ගෙන ආ යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

**ගරු සභාපති වයි.ජී.සංජීව කරුණාසාගර මහතා**

මේක අපිට සංචාරක අමාත්‍යාංශයෙන්මයි දෙන්නෙ.අනාගතේ සංචාරක කර්මාන්තය සඳහා විශාල වැඩ කොටසක් කරන්න නියමිතයි.පඩුවස්නුවර රාජධානියේ දිය අගල ගැඹුරු කිරීමේ කටයුතු ආරම්භ කරලා තියනවා.දිය අගලට වතුර පුරවන්න.චක්‍රාවාලය වටා ආලෝකකරණ පද්ධතියක් සකස් කරන්න කටයුතු සූදානම් කරලා තියනවා.පඩුවස්නුවර රාජධානිය වටා තියන ප්‍රදේශවල අපි ප්‍රාදේශිය ලේකම් කාර්යාලත් මැදිහත්වෙලා වසම් මට්ටමින් තමන්ගෙ ප්‍රදේශවල සංචාරක කර්මාන්තය දියුණුකරන්න පුළුවන් ස්ථාන මොනවද කියලා යෝජනා අරගෙන තියනවා. විශාල සැලසුමක් තියනවා පඩුවස්නුවර, දඹදෙණිය, කුරුණෑගල,සහ යාපහුව මූලික කරගෙන සංචාරක ගමනාන්තයක් බවට පත් කරන්න. ගිය අවුරුද්දෙ අයවැයෙන් මේකට මිලියන 500 ක් වෙන්වුනා.ඒ මුදල් වලින් තමයි අර වැඩ ටික යන්නෙ.

**ගරු මන්ත්‍රී ආර්. එච්. රංජිත් උපාලි මහතා - (ස්වාධීන)**

ගරු සභාපතිතුමා බුලත්පොල වැසිකිළි පද්ධතිය ගැන කථා කරද්දි මේ පිලිබඳ පුංචි ඉදිරිපත් කිරීමක් කලා. මං විශ්වාස කරනවා.සියඹලාගස්වැව භූ දර්ශකය තුල වැසිකිළි පද්ධතිය හැදුවොත් මෙතන තියන සුන්දර බව නැතිවෙනවා.ගංජා ගහන, කුඩු ගහන තිප්පලක් බවට මෙතන පත් වෙනවා මේ වැසිකිළි පද්ධතිය හැදුවොත්. මීට වඩා දර්ශනීය නගරවල මේක වෙනවා.ඔබතුමාගෙ උත්සාහය පිලිබඳ මං ස්තුතිවන්ත වෙනවා.නමුත් මං ඉල්ලීමක් කරනවා.ආණ්ඩුකාරතුමාට මේ කරුණු ඉදිරිපත් කරලා මේ මුදල සියඹලාගස්වැටිය භූ දර්ශකයට යන්නෙ නැතිව පඩුවස්නුවර පූජා භූමියට යොදවන්න පුළුවන්නම් හොඳයි.සියඹලාගස්වැටිය වැසිකිළි පද්ධතිය පුස්තකාලෙ පිටුපස්සෙ බෝඩ් එකකුත් ගහලා.නිවැරදිව පිලිවෙලට හදන්න පුළුවන්.ඒක මගෙ පළවෙනි අදහස.දෙවැනි එක මකර තොරණක් හදනවනම් වංගුවෙ තියන වම් පැත්තෙ ඉඩම ලබා ගන්න උත්සාහයක යොදෙන්න.මොකද හේතුව විකල්පයක් හැටියට සියඹලාගස්වැටිය භූ දර්ශකයේ සංචාරකයො ගෙන්නනවට වඩා පඩුවස්නුවරට ඔබතුමාලගෙ සැලැස්මත් එක්කලා ඒ පැත්තෙ හොඳ වැසිකිළි පද්ධතියක් නිර්මාණය කරන්න.වැව තියනවා.මේකෙ ආරක්ෂක අමාත්‍යාංශයේ අවසරයක් ලබාගෙන පඩුවස්නුවර ප්‍රාදේශිය සභාවෙන් බෝට්ටු සේවාවක් සපයන්න පුළුවන්.මේක හැමදාම වතුර තියන වැවක්.දේශිය සංචාරකයො එනවා.මේක අදහසක් විතරයි කිව්වෙ. විරුද්ධ වීමක් නෙමේ. උත්සාහයක යෙදෙන්න.සංචාරක අමාත්‍යාංශයෙන් ලබා දුන්න මේ මුදල් භාවිතා කරලා සියඹලාගස්වැටිය වැව ගාව තියන වැසිකිළි පද්ධතිය හදනවට වැඩියෙ වෙනත් ඵලදායි වැඩක් කරන්න යෙදෙන්න කියලා ඉල්ලීමක් කරනවා.

**ගරු සභාපති වයි.ජී.සංජීව කරුණාසාගර මහතා**

මන්ත්‍රීතුමා ඔබතුමාගේ යෝජනාව හොඳයි.පඩුවස්නුවර පූජා භූමියෙත් ඔය විදිහෙම වැසිකිළි පද්ධතියක් ඕන.එතෙන්ටත් හදන්න ඕන.ගැටළුව තමයි.අපිට ගිය අවුරුද්දෙත් ලක්ෂ 100 ක් ලැබුනා සංචාරක මණ්ඩලයෙන් වැසිකිළි පද්ධතිය හදන අපේ ප්‍රධාන ඉල්ලීම වුනේ පූජා භූමියේ මේක හදන්න.ඊට පස්සෙ අපිට මේ මුදල දුන්නෙ නෑ.භූමිය අපේ නෙමේ කියලා.ඉඩම පුරා විද්‍යා සතු භූමියක්. ඒ අනෙක් භූමි වෙන්කරගන්න එක හරි පහසුයි.පුරා විද්‍යා භූමි සභාවට පවරගන්න බැරි ප්‍රශ්නයක් තියනවා.ඒ නිසා ඒ මුදල ආපහු ගියේ.ඊළඟට ඔබතුමා මේක පුරෝකථනය කරනවනෙ ඔතන කැතවෙයි කියලා.නමුත් මේ හදන්න හදන ගොඩනැගිල්ල වැසිකිළියකට එහා ගිය සමහරවිට ගෙදරටත් වඩා ලස්සන වෙන්න පුළුවන් තැනක් විදිහට තමයි මේක යෝජනා කරන්නෙ.සංචාරකයින්ටත් ගැලපෙන විදිහට හදන්න.

**ගරු මන්ත්‍රී ආර්.ඩී. ලාලිත ඉඳුනිල් මහතා - (ජා.ජ.බ)**

සභාපතිතුමා කොට්ඨාශෙ මන්ත්‍රීතුමා විදිහට මේකට විරුද්ධතාවය ප්‍රකාශ කරනවා නෙමේ. ඔය තියෙන වැසිකිළි පද්ධතිය හදලා තියෙන්නෙ පැත්තක් අඩ තියලා.ඔතන ආකර්ශනීයව හදන්න ඉඩ නෑ.මේ වෙනකොට අපි දකින දෙයක් උදේ හවහ ඕක භාවිතා කරන්නෙ ඔතන ඉන්න වෙළෙන්දො සමහර අය නේවාසිකව ඔතන ඉන්නවා.ප්‍රධාන ප්‍රශ්නෙ තියෙන්නෙ ඔතන ඉඩ ප්‍රමාණවත් මදි.සුළු ඉඩක් තියෙන්නෙ .ඒක එක පැත්තක් අඩ තියලා තමයි හදලා තියෙන්නෙ.එතන පිටිපස්සෙ තියනවා රිසවේෂන් කොටසක්.ඒක

ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයිති කොටසක්.අපිට ඕනි නම් විධිමත් ආකාරයට ප්‍රාදේශිය ලේකම් හරහා ඒක පවරගෙන යම්කිසි ක්‍රමවේදයකට එතන හදන්න පුළුවන්.දැන් ඔය වැසිකිලි පද්ධතිය තියෙන තැනනම් ඔතන ඉඩ නෑ.ඒ හින්දා අපි ඒල් ආර්සී එකේ ඉඩම පවරගන්න වැඩෙත් අපි යෝජනා කරගමු.

**<u>ගරු මන්ත්‍රී කේ.එම්. නන්දසිරි මහතා - ( ස.ජ.බ)</u>**

- ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඒ.පී.ඩී.ඉෂාන් මධුශංක පිරීස් මහතා ප.ව.12.32 ට පමණ සභාවෙන් බැහැරට ගියා.
- ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එස්.එච්. මාලක අරුණ කුමාර මහතා ප.ව.12.34 ට පමණ ගරු සභාවෙන් බැහැරට ගියා.

ගරු සභාපතිතුමනි බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා ලාලිත මන්ත්‍රීතුමාට .ඔය වැවේ වැකන්ද ගත්තහම දැන් හදලා තියන වැසිකිළිය වුනත් වැවෙන් කණු දාලා තමයි හදලා තියෙන්නෙ.දැන් ඔය වගේ ලොකු ව්‍යාපෘතියක් ඇවිල්ලා කොහෙද ඇත්තටම ඕක හදන්නෙ.සංචාරක මණ්ඩලේකට ලොකු වැසිකිලි පද්ධතියක් හදන්න කොහෙද ඉඩක් තියෙන්නෙ.සංචාරක මණ්ඩලේ අයත් එක්ක ගිහිල්ලා ඔබතුමත් පරීක්ෂා කළා නම් මෙතන හදන්න ඉඩක් නැත්තම් වැව ගොඩ කරලද හදන්නෙ ඔතන. සභාපතිතුමා සුදුසු තැනක් අරගෙන ඕක හදන්න කියන ඉල්ලීම කරනවා.

**<u>ගරු සභාපති වයි.ජී.සංජීව කරුණාසාගර මහතා</u>**

- ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඒ.පී.ඩී.ඉෂාන් මධුශංක පිරීස් මහතා ප.ව.12.36 ට පමණ ගරු සභාවට පැමිණියා.
- ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එස්.එච්. මාලක අරුණ කුමාර මහතා ප.ව.12.36 ට පමණ ගරු සභාවට පැමිණියා

සංචාරක කර්මාන්තය දියුණු කරන්න වැඩ පිලිවෙලක් ඉස්සරහට එනවා.සංචාරක අමාත්‍යංශය හරහා මුදල් එනවා.අනාගතේ ඉලක්කයක් තියනවා.සංචාරක කර්මාන්තය දියුණු කරගන්න.ඒකට අදාල ස්ථාන තෝරලා තියනවා.ඒ ස්ථානවලින් පළාත් පාලන දෙපාර්තමේන්තුවත්, සංචාරක අමාත්‍යංශයත් අපෙන් අහපුවාම, එකක් තමයි සියඹලාගස්වැටිය හූ දර්ශන ව්‍යාපෘතිය, දෙවනි එක තමයි විලගෙදරවත්තෙ තියෙන වැව, බණ්ඩාරකොස්වත්ත වැව මේ කියන ස්ථාන අපි තෝරලා යවලා තියනවා.මේ තියෙන්නෙ සංචාරක අමාත්‍යංශයෙන් අපිට මුදලක් දෙන්න තීරණය කරලා තියනවා.අපි අපේ ස්ථානෙ හදාගන්න යෝජනා කරලා තියනවා.එතන ඉඩකඩ ප්‍රශ්නයක් තියනවනම් අපි සභාව කතා කරලා සුදුසු විදිහට හදා ගමු.සංශෝධන තියනවනම් තැන් ටික වෙනස් කරගමු.

**<u>ගරු මන්ත්‍රී ඩී.ඩී.එස්.පද්මලාල් මහතා - (සර්ව ජන බලය)</u>**

මමත් පුංචි අදහසක් ඉදිරිපත් කරන්නම ඕන. මොකද මමත් නිතරම යන ස්ථානයක්.රංජිත් උපාලි මන්ත්‍රීතුමා ඒ ඉදිරිපත් කරපු කරුනු සම්පූර්ණ ඇත්ත.ඔය කියපු ඔක්කොමත් හරි. අවසානෙට ලාලිත මන්ත්‍රීතුමත්,නන්දෙ මන්ත්‍රීතුමත් කිව්ව වගේ වැසිකිලි පද්ධතියක් එතන හදන්න බෑ.නමුත් ඒක පිටිපස්සෙ ලාලිත මන්ත්‍රීතුමා කිව්ව රිසිවේෂන් කිව්ව කොටසෙ ගොඩ නොකර ගන්න පුළුවන් කොටසකුත් තියනවා. එම නිසා වැසිකිළි පද්ධතිය පිටුපස්සට ගන්න එක සුදුසුයි.ඒ නිසා මමත් එම යෝජනාව කරනවා.

**<u>ගරු මන්ත්‍රී ඒ.ජී.ඩී. රංජිත් ප්‍රේමලාල් මහතා - ( ස.ජ.බ)</u>**

ගරු සභාපතිතුමා.සංචාරක කර්මාන්තය දියුණු කරන එක තමයි මං හිතන්නෙ මේ වැසිකිළි පද්ධතියෙන් බලාපොරොත්තු වෙන්නෙ.පඬුවස්නුවර කේන්ද්‍රස්ථානය තමයි පඬුවස්නුවර රාජධානිය.සභාපතිතුමා කිව්වා පඬුවස්නුවර වැසිකිළි පද්ධතිය ඉදි කරන්න යනකොට අනුමැතිය ගන්න අපහසු වුනා.ඒක පිළිගන්නවා.මොකද පුරා විද්‍යා රක්ෂිතයක්.පුරා විද්‍යාවෙන් අනුමැතිය ගන්න ඕන.සභාපතිතුමා නමුත් අපිට පඬුවස්නුවර රජමහා විහාරස්ථානයට අයිතිඉඩම තියනවා.ඒ ඉඩමේ වැසිකිලි පද්ධතිය ඉදි කරලා තියනවා. විවිධ ව්‍යාපෘති ඉදි කරලා තියනවා.ඒවට අනුමැතිය පුරාවිද්‍යාවෙන් අවසර දෙනවා සභාපතිතුමා.ඇත්තටම අපේ රංජිත් උපාලි මන්ත්‍රීතුමා කිව්ව සියඹලාගස්වැටිය හූ දර්ශන වයාපෘතියෙ වැසිකිළි පද්ධතියටත් එහා ගිය වැඩිම අවශ්‍යතාවය තියෙන්නෙ පඬුවස්නුවර පූජා භූමියට.මොකද වැඩිම සෙනඟක් වෙසක් ,පොසොන් හෝ ඇසල චේවා පෝයක් චේවා සියල්ලටම එන්නෙ පඬුවස්නුවර පූජාභූමියට. ඔබතුමාගේ කාරුණික අවධානය යොමුකරලා.පඬුවස්නුවර රජධානියට පැමිණෙන අය ලොකු අපහසුතාවයකට පත් වෙනවා.සංචාරක කර්මාන්තය හරහා ප්‍රාදේශිය සභාවට ආදායමක් උපයාගන්න මාර්ගයක් සලසා ගන්න

පුළුවන්.අපි හොඳ දේදි ඔබතුමාට සහාය දෙනවා.අපි මේකට විරුද්ධ නෙමේ, පුළුවන්නම් මේකත් කරන්න .නමුත් සංශෝධනයක් කරලා පූජා භූමියට මේක ගන්න පුළුවන්නම් පක්ෂ, විපක්ෂ සියළු දෙනාම ගිහිල්ලා හරි පඬුවස්නුවර රජමහා විහාරයේ විහාරාධිපති හිමියන් පුරා විද්‍යා ස්ථානභාර කට්ටිය කැඳවලා හරි අර හිටපු සභාපතිතුමා කිව්වා වගේ එතන ලොකු වැඩසටහනක් අදායම් ගන්න පුළුවන්.පැඩල් බෝට්ටු නැත්නම් බෝට්ටු ව්‍යාපෘතියක්, හැරෙන තැන බතලගොඩ වැව තියනවා.එතනින් එහා රථ ගාල ගාව.රදාදෙන වැව තියනවා.මේ වැව් දෙකේම හැම කාලෙම වතුර තියනවා.ඉතින් අපිට ලොකු ආදායමක් සභාවට උපයාගන්න පුළුවන්.ඉතින් ඒ වගේ වැඩ පිළිවෙලක් අපි ඔක්කොම එකතුවෙලා සංචාරක කර්මාන්තෙ තුලින් යම් ආදායමක් ගන්න අපි සියළුදෙනා කථා කරලා වැඩ පිළිවෙලක් හදමු.

**<u>ගරු මන්ත්‍රීනී එම්. නිශාන්ති ගුණතිලක මහත්මිය - ( ස.ජ.බ)</u>**

ගරු සභාපතිතුමනි.රංජී මන්ත්‍රිතුමා ඉදිරිපත් කල දෙයට පොඩි දෙයක් මටත් එකතු කිරීමට තියනවා.ඇත්තටම පහුගිය දවසක පඬුවස්නුවර රාජධානියේ කාන්තාවො විදිහට අපිත් සීල ව්‍යාපාරයකට සහභාගී වුනා.එතනදි හරි අසීරුතාවයට පත් වුනා. කාන්තාවෝ හැටියට පඬුවස්නුවර රාජධානියේ වැසිකිළි පද්ධතිය පිළිබදව.ඒ වෙලාවෙ මම හිතුවා මේක නවීන පහසුකමින් යුතු වැසිකිලි පද්ධතියක් වුනානම් කොච්චර හොඳද කියලා.රංජිත් උපාලි මන්ත්‍රිතුමා කරුනු රාශියක් හෙලිකලා.සමහර වෙලාවට ප්‍රජා සංවර්ධන ව්‍යාපෘතියක් ආරම්භ කරද්දි ඒ ප්‍රදේශයේ සිටින පළපුරුදු ප්‍රජා නායකයන්ගෙ අදහස් අපි හුඟක් අගය කොට සලකන්න ඕන. ඔවුන්ගෙ අදහස්වලට පිටින් සංවර්ධන යෝජනා ක්‍රියාත්මක කරලා ඒවා අඩාල වුන තැන් අපි අතීතේ ඉදන්ම අධ්‍යයනය කරලා තියනවා.ඒ වගේ අසාර්ථක වුන සංවර්ධන වැඩපිලිවෙලවල්.විශේෂයෙන්ම අපේ හිටපු සභාපතිතුමාගෙත් අදහස් ගරු කරලා අපි තාක්ෂණ නිලධාරීන්ටම ඔවුන්ටම අභිමුඛ කරගෙන කරන කටයුත්තක් කර නොගෙන අපෙත් අදහස්, සාම්ප්‍රදායික අත්දැකීම් බහුල අයගෙත් අදහස් මේකට එකතු කරගෙන මේ වගේ වැඩ පිලිවෙලක් ආරම්භ කරනවනම් හොඳයි කියලා මං යෝජනා කරනවා.ඒ වගේම විශේෂයෙන්ම මේ පඬුවස්නුවර පූජා භූමියේ වැසිකිලි පද්ධතියකුත් අපේ සභා අරමුදලෙන් හරි කොතනක හො ගොඩනගන්න උත්සාහ කරමු කියන යෝජනාවත් මං මේ සභාවට ඉදිරිපත් කරනවා.

**<u>ගරු සභාපති වයි.ජී.සංජීව කරුණාසාගර මහතා</u>**

මං කලිනුත් කිව්වා වගේ පඬුවස්නුවර රාජධානියේ රථගාලේ වැසිකිළි පද්ධතිය ඉදිකරන්න පහුගිය අවුරුද්දෙත් අපිට මුදල් ලැබුනා ආසාවෙන් බලන් හිටියා මේක හදන්න.මොකද ඒ තියන වැසිකිළි පද්ධතිය මදි වෙසක් පොසොන් ඇසළ වගේ කාලෙට ජනතාවට දෙන්න.නමුත් ඉඩමේ අයිතිය සම්බන්ධ ගැටළුව නිසා අපිට ඒක කරගන්න බැරිවුනා.ඊළඟට අපි ආණ්ඩුකාරතුමත් පුරා විද්‍යා දෙපාර්තමේන්තුවත් මධ්‍යම සංස්කෘතික අරමුදලක් එකතු වෙලා ගිය මාසෙ සාකච්ඡාවක් ගත්තා. ඒ සාකච්ඡාවේදී අපි යෝජනා කරගෙන තියනවා.සංචාරකයො ආවට පස්සෙ එයාලට නවාතැන් පහසුකම් හදන්න ඕන.ඒකට පෞද්ගලික අංශෙ අයට ඕනතරම් අවස්ථා තියනවා.වැසිකිලි පද්ධතියක් සහ තව පාර්ක් එකක් ප්‍රධාන පාර්ක් එකට අමතරව තව එකක් හදන්න යෝජනා කරලා තියනවා.ඒවට සැලසුම් තියනවා.මේක අපි නැවත සාකච්ඡාවට ගමු.මේක මෙතෙන්ට ගැලපෙන්නෙ නැත්තම්. හැබැයි මේ මුදලත් ආපහු යන වැඩපිලිවෙලක් හදාගන්නෙ නැතිව.

**<u>ගරු මන්ත්‍රී ඩී.ඩී.එස්.පද්මලාල් මහතා - (සර්ව ජන බලය)</u>**

මෙතෙන්ට ආව මුදල් ගිය පාර රාජධානියට ආව මුදල් වගේ නැතිව පුළුවන් තරම් උත්සාහ කරලා මේ ආපු මුදල් ටිකෙන් ප්‍රයෝජනයක් අරන් මේක හරිගස්සන එක උචිතයි කියන එක.මොකද හේතුව දෛනිකවම විශාල සංඛ්‍යාවක් එන නිසා.පූජා භූමිය ගත්තොත් වෙසක් පොසොන් කාලවලට ඇතුලටම යනවා සෙනඟ. නැත්තම් මිනිස්සු ගෙවල්වල ඒවා පාවිච්චි කර ගන්නවා.නමුත් මෙතන එහෙම තත්වයක් නෙමේ තියෙන්නෙ.ජනාකීර්ණයි. දෛනිකවම එනවා.ඉතින් පඬුවස්නුවර වැසිකිලි පද්ධතිය හදන එකටත් කැමතියි.ඒකත් අපිට අවශ්‍ය කාරණාවක්.මේකත් අවශ්‍යයයි.ඔබතුමා සුදුසු තීරණයක් අරගෙන ඒක ක්‍රියාත්මක කරන්න.

**<u>ගරු සභාපති වයි.ජී.සංජීව කරුණාසාගර මහතා</u>**

දැන් අපි මේ යෝජනාව සම්මත කරලා එහාට යැව්වට පස්සෙ තමයි අපේ ඇස්තමේන්තුවත් එක්ක තමයි අපි යවන්නෙ.ඇස්තමේන්තුවත් එක්ක තමයි එහෙන් මුදල් ප්‍රමාණේ අනුමත කරලා එවන්නෙ.එනිසා ඇත්තටම මෙතන යෝජනා කරන්න හේතුව තමයි. මෙතන අපි ඔය හදලා තත්වය ඉස්සරහට තවත් දියුණු කරන්න අදහසක් තියනවා.මැද තියන රවුම විශේෂයෙන්ම උත්සව ගන්න පුළුවන්තැනක් බවට පත්කරන්න පිෂින් තෙරපි, ඒ වගේ වැඩ ගොඩක් තියනවා.ඒ නිසා අපි බලාපොරොත්තුවෙන්නෙ දැන් තියන තත්වයෙන් මේක පවත්වාගන්න නෙමේ.ලාලිත මන්ත්‍රිතුමා කිව්ව ඉඩම මගෙ ඔලුවෙ තිබුනා. ඒකට අදාල කරන

නීතිමය තත්වය හදාගන්නකම් කිව්වෙ නෑ.ඔතන උද්‍යානමය තත්වයකට සුදුසුම තැනක්.එතෙන්ට එන්න පෙර සූදානමක් තමයි මේ.

**ඒ අනුව , රාජ්‍ය පරිපාලන පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යංශය ආධාර යටතේ හෙට්ටිපොල සියඹලාගස්වැටිය භූ දර්ශන ව්‍යාපෘතිය අසල වැසිකිළි පද්ධතියක් ඉදි කිරීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ එදින පැමිණි සිටි සභිකයන් විසින් ඒකමතිකව සහා සම්මත කරන ලදී .**

## (ඉ) <u>XIII. ගරු සභාපති වයි.ජී.සංජීව කරුණා සාගර මහතා විසින් කරනු ලබන අංක 6.(ඉ). XIII දරණ යෝජනාව</u>

වරිපනම් බදු අය කරන දේපල සඳහා 2025 වර්ෂයේදී සිදු කරන ලද තක්සේරුවට අනුව කුඹුරු හා පඩුවස්නුවර පන්සල පාර තාවකාලික කඩ 06 ක් තක්සේරුවෙන් ඉවත් කර ඇත.මෙම දේපලවල ඉදිරි ලැබීම් වශයෙන් 2025 දෙසැම්බර් මස අවසාන වන විට රු.153.01 ක මුදලක් පවතී.මෙම මුදල සහා අරමුදලට බැර කිරීම සඳහා 2026.04.22 පැවති විගණන හා කළමණාකරන කමිටුවේදී තීරණය විය.මෙම මුදල සහා අරමුදලට බැර කිරීමට යෝජනා කරමි.

<u>ගරු මන්ත්‍රී ආර්.ඩී. ලාලිත ඉඳුනිල් මහතා - (ජා.ජ.බ)</u>

ගරු සභාපතිතුමා විසින් ගෙන ආ යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

<u>ගරු සභාපති වයි.ජී.සංජීව කරුණාසාගර මහතා</u>

මේ කුඹුරු කියන එක බදු අයකරන එකෙන් ඉවත්කරලා දැන් තියෙන්නෙ.ඊළඟට අර තාවකාලික කඩ ටිකක් හදලා තියෙන්නෙ පඩුවස්නුවර හංදියෙ. ආදිකාලීනව තියෙන්නෙ.ඒවයෙන් වරිපනම් අය කරන්නෙ නෑ.ඒවා ස්ථිර ගොඩනැගිලි නෙමේ. වෙළඳ බලපත්‍රයක් එයාලා ගන්නවා.වරිපනම් ගෙවන්නෙ නෑ.අපි වරිපනම් ගන්න ගියොත් අයිතියක් බවට පත් වෙනවා.මේක පාර පලල් කරද්දි ගැටළු වෙනවා.

<u>ගරු මන්ත්‍රී ආර්.ඩී. ලාලිත ඉඳුනිල් මහතා - (ජා.ජ.බ)</u>

ඔතන පූජා නගරයක් හදන්න කලින් ඔතන ඔය අනවසර ඉදිකිරීම් ටික ඉවත් කරලා ඔයාලට වෙන කොහේ හරි තැනක් දෙනවනම් සුදුසුයි කියා මතයක් ප්‍රකාශ කරනවා.

<u>ගරු මන්ත්‍රී ඒ.ජී.ඩී. රංජිත් ප්‍රේමලාල් මහතා - ( ස.ජ.බ)</u>

කඩ ඉවත්කරන්න ගියොත් ලොකු ප්‍රශ්නයක් වෙයි.සංවර්ධනය කරනවනම් නිසි ක්‍රමවේදයකට, එයාලටත් අවස්ථාව දීලා ඒක කරන්න.

<u>ගරු සභාපති වයි.ජී.සංජීව කරුණාසාගර මහතා</u>

අපේ රජයේ ප්‍රතිපත්තිය තමයි අවස්ථාවක් නොදී ජීවන තත්වය අහිමි කරන්නෙ නෑ.

<u>ගරු මන්ත්‍රී ඩී.ඩී.එස්.පද්මලාල් මහතා - (සර්ව ජන බලය)</u>

හැබැයි සභාපතිතුමා මෙතන ඉන්නවා.කඩ කුලියට දීලා පවත්වගෙන යන අය.

**ඒ අනුව වරිපනම් බදු අය කරන දේපල සඳහා 2025 වර්ෂයේදී සිදු කරන ලද තක්සේරුවට අනුව කුඹුරු හා පඩුවස්නුවර පන්සල පාර තාවකාලික කඩ 06 ක් තක්සේරුවෙන් ඉවත් කර ඇති බැවින් මෙම දේපලවල ඉදිරි ලැබීම් වශයෙන් 2025 දෙසැම්බර් මස අවසාන වන විට රු.153.01 ක මුදල සහා අරමුදලට බැර කිරීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ එදින පැමිණි සිටි සභිකයන් විසින් ඒකමතිකව සහා සම්මත කරන ලදී .**

## (ඉ) <u>XIV. ගරු සභාපති වයි.ජී.සංජීව කරුණා සාගර මහතා විසින් කරනු ලබන අංක 6.(ඉ). XIV දරණ යෝජනාව</u>

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව යටතේ ඇති කුලි/ හෙට්ටිපොල මහින්දෝදය මහා විද්‍යාලයට අයත් හෙට්ටිපොල මහජන ක්‍රීඩාංගනය නඩත්තු හා සංවර්ධන කටයුතු සඳහා පඩුවස්නුවර ප්‍රාදේශීය සභාව වෙත පවරා දී ඇත. මෙම ක්‍රීඩාංගනය 1987 අංක 15 දරන ප්‍රාදේශිය සභා පනතේ 3 වන වගන්තිය යටතේ ප්‍රදේශයේ මහ ජනතාවගේ සුබ විහරණය සඳහාද 19 (xix) අ වගන්තිය යටතේ ප්‍රාදේශීය සභා ප්‍රදේශය තුල ක්‍රීඩා භූමි පහසුකම් සැලසීම යටතේද පඩුවස්නුවර ප්‍රාදේශීය සභාවට පවරා ගැනීම සුදුසු යැයි යෝජනා කරමි.

<u>ගරු මන්ත්‍රී එම්.ඒ.මංජුල ප්‍රසන්න මංජුල මල්ලව ආරච්චි මහතා - (ජා.ජ.බ)</u>

ඇත්තටම ඒක අත්‍යවශ්‍ය කාරණාවක්.ඒ නිසා සභාපතිතුමා විසින් ගෙන ආ මහජන ක්‍රිඩාංගනය පිලිබඳ යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

**ගරු සභාපති වයි.ජී.සංජීව කරුණාසාගර මහතා**

මේක මේ ඉඩම අයිතිය අපිට නැති නිසා.අනිත් සියළුම කටයුතු සිද්ධ වෙන්නෙ ප්‍රාදේශීය සභාවෙන්.නඩත්තු කිරීම් කටයුතු ටික අපි කරනවා.අනිත් අය අයිතිය බුක්ති විදිනවා.එනිසා මේක පවරගන්න අපි යෝජනාව සම්මත කරගමු.

**ගරු මන්ත්‍රී ඒ.ජී.ඩී. රංජිත් ප්‍රේමලාල් මහතා - ( ස.ජ.බ)**

ගරු සභාපතිතුමනි.ඔබතුමා කිව්ව වගේ. දැන් ඔය පඬුවස්නුවර මහජන ක්‍රිඩාංගනය හැමදාම මාතෘකාවට ලක්වෙන තැනක් මේක පහුගිය කාලෙ අපිට ආරංචි වුනා හෙට්ටිපොල මහින්දෝදය විද්‍යාලයට තමයි අයිතිය තියෙන්නෙ.මේ විද්‍යාලෙ කටයුතුවලට තමයි ගන්නෙ කියලා.අයිතිය සම්බන්ධ එදා ඉඳන් ඒ ගැටළුවම එනවා.නමුත් මේක ඔබතුමා කිව්වා වගේ නඩත්තු කරන්න ගියාම.නඩත්තු කරන්න ඕන ප්‍රාදේශිය සභාවෙන්.අයිතිය අපිට නෑ.පහුගිය කාලේ ලොකු වියදමක් ලොකු මුදලක් දරන්න වෙනවා මේක සංවර්ධනය කරලා නඩත්තු කරන්න.ප්‍රාදේශිය සභාවත් ලොකු අපහසුතාවයට පත්වෙනවා මේ සංවර්ධන කටයුතු කරන්න. නඩත්තු කටයුතු කරන්න මුදල් වියදම් කරන්න.ඒ නිසා වෙන්න ඇති කලින් තිබුන අලංකාරය පොඩ්ඩ පොඩ්ඩ අඩුවෙලා.මේක පඬුවස්නුවර ආසනේ විතරක් නෙමේ.වයඹ පලාතේ ගත්තහම රාජ්‍ය ආයතන, පෞද්ගලික ආයතන වෙනත් වෙනත් අපේ ඉන්න ක්‍රිඩකයො ක්‍රිඩා කරනවා.වෙනත් කටයුතුවලට භාවිතා කරනවා.ඒ හින්දා මමත් අනුමත කරනවා සභාවට ගන්න ඕන.සභාවට අයිතිය ගන්න ඕන.එහෙම කියලා අපි හෙට්ටිපොල මහින්දෝදය විද්‍යාලයටත් අවට පාසල්වලටත් ක්‍රිඩා කරන තරුණ තරුණියන්ටවත් ඒ අයගෙ තියන අවශ්‍යතාවය නැති කරන්නෙ නැනෙ.ප්‍රාදේශීය සභාවෙ අරමුණ තමයි උපතේ සිට මරණය දක්වා පහසුකම් සැලසීම.ඒ හින්දා සුදුසුම දේ තමයි ප්‍රාදේශීය සභාවට පවරාගෙන නඩත්තු කටයුතු හා සංවර්ධන කටයුතු කරන්න පුළුවන්නම් ලොකු දෙයක්.නැත්තම් මේ ක්‍රිඩාංගනය විනාශ වුනොත් අපේ අනාගත පරපුරට තියෙන ලොකු දෙයක් නැති වෙනවා.ඒ හින්දා සභාපතිතුමනි මේ යෝජනාව ඉතා හොඳයි.

**ගරු මන්ත්‍රී කේ.එම්. නන්දසිරි මහතා - ( ස.ජ.බ)**

ඔබතුමා ඉදිරිපත් කරලා තියනවා මහජන ග්‍රවුන්ඩ් එක පවර ගන්න යෝජනාව. ඔය පවර ගැනීමේ කටයුත්තෙදි මීට පෙර ක්‍රිකට් පාලක මණ්ඩලයට පවරන්න ගිහිල්ලා ඕකෙ අනන්‍යතාවය මහ විද්‍යාලය සතුයි කියන කාරණේ මතුවෙලා හිටපු ලේකම්තුමාත් හරහා සාකච්ඡා වටේදි එකඟතාවයකට ආවා ප්‍රාදේශිය සභාවට මේකෙ පැවරීම් කටයුතු කරලා සියළුම අවට පාසල්වලට ක්‍රිඩා කරන්න අවස්ථාව ලබා දෙන්න මුදල් අයකිරිමකින් තොරව.ඒක ඒ විදිහට ගිහිල්ලා එතනින් එහාට මොන විදිහට ක්‍රියාත්මක වුනාද කියන එක පැහැදිලි නෑ. අපි දන්නෙ නෑ.නමුත් මම ඔබතුමාගෙන් අහන්නෙ මේ ක්‍රිඩාපිටිය ගැන ඇදිච්ච නිසා පහුගිය වකවානුවේදී කුලී පදනමට සල්ලි අය කරලා හරි දෙනවනම් මං හිතනවා ඒකෙ විනිවිදභාවයක් තියෙන්න ඕන. ග්‍රවුන්ඩ් එක ආරක්ෂා කරන වගකීම. මහ විද්‍යාලයට දුන්නත් ග්‍රවුන්ඩ් එක ආරක්ෂා කරන වගකීම සභාව සතුයි. මං දැක්කා අර ලයිට් කනු හිටවන්න වගේ ලොකු වලවල් හාරලා තියෙනවා නයිට් මැච් එකක් තියන්න.ග්‍රවුන්ඩ් එක වටේටම වලවල් හාරලා තියනවා. අපි ගාව වීඩියෝ තියනවා.ඒ හින්දා මං ඔබතුමාට යෝජනාවක් හැටියට ගේන්න කැමතියි. මුදල් ගන්නකොට කොන්දේසියක් දාගන්න.එවකට හිටපු දයාසිරි ජයසේකර ක්‍රිඩා ඇමතිතුමා තමා මුදල් දාලා ඔය ග්‍රවුන්ඩ් එක ඔය තත්වයට ගෙනල්ලා තියෙන්නෙ.මං ඔබතුමාගෙන් ඉල්ලනවා පැහැදිලිවම ක්‍රිඩාවට දෙනවනම් යම් කොන්දේසි ඇතිව කටයුතු කරන්න කියන බොහොම නිහතමානී ඉල්ලීම කරනවා.

- ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඩබ්.ජී.අජිත් ලක්ෂ්මන් මහතා ප.ව.13.05 ට පමණ සභාවෙන් බැහැරට ගියා.
- ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එම්.ටී.එම්.තස්ලිම් මහතා ප.ව.13.05 ට පමණ ගරු සභාවෙන් බැහැරට ගියා.

**ගරු සභාපති වයි.ජී.සංජීව කරුණාසාගර මහතා**

මට හිතෙනවා ඔය ගැටළු ඔක්කොම විසදෙනවා අපි මේක පවරාගත්තට පස්සෙ. අලුත් තාක්ෂණයත් එක්ක දිවා රාත්‍රි මැච් ගහන්න පුළුවන් විදිහට හදන්න පුළුවන්. අපි ඒ විදිහට මේක හදලා ගත්තොත් එහෙම විශාල ගනනකට මේක දෙන්න පුළුවන්.සභාවට විශාල මුදලක් ගන්න පුළුවන්.

**ගරු මන්ත්‍රී ආර්. එච්. රංජිත් උපාලි මහතා - (ස්වාධීන)**

- ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඩබ්.ජී.අජිත් ලක්ෂ්මන් මහතා ප.ව.13.07 ට පමණ ගරු සභාවට පැමිණියා.
- ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එම්.ටී.එම්.තස්ලිම් මහතා ප.ව.13.08 ට පමණ ගරු සභාවට පැමිණියා
- ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එම්.විරාජ් මලින්ද ඩයස් මහතා ප.ව.13.09 ට පමණ ගරු සභාවෙන් බැහැරට ගියා.

ගරු සභාපතිතුමා පවරා ගැනීමේ යෝජනාව සම්මත වුනා.හැබැයි මේ ක්‍රිඩා පිටිය හොළඹලැවෙ විදුහල්පතිනිය ඉන්න කොට තමයි නිමල් බංඩාර ප්‍රධාන අමාත්‍යතුමාගේ දිස්ත්‍රික් සම්බන්ධීකරණ රැස්වීමේ ජයසේන රාජකරුණා හිටපු මන්ත්‍රිතුමා මේක සභාවට පවරා දෙන්න යෝජනාව ඉදිරිපත් කලේ.ඒ යෝජනාව සම්මත වුනා.ඒ සම්මත වෙලා ප්‍රාදේශීය සභාවේ පාලනයට මේක ලබා දුන්නා. ජයරත්න හිටපු කොට්ඨාශ අධ්‍යාපන අධ්‍යක්ෂ තුමා මේකට ප්‍රශ්නයක් ඇදලා නැවත වතාවක් අධ්‍යාපන අමාත්‍යංශයට පවරගන්න උත්සාහයක යෙදුනා.මේ මොහොත වෙද්දිත් කීප දෙනෙකුගේ උත්සාහයක් මත අධ්‍යාපන අමාත්‍යංශයට පවරා ගැනීමේ උත්සාහයක නිරත වෙලා ඉන්නවා.හැබැයි හෙට්ටිපොල මහ විද්‍යාලයට මේක පවරා ගත්තා කියලා මේක නඩත්තු කරන්න බැ.ඒක නිශ්ඵල ක්‍රියාවක් විතරයි.මේ යෝජනාව සම්මත කරලා තව ඉදිරියට යන්න වෙනවා.නැත්තම් නැවත වතාවක් මේ ගැටළුව එනවා. ලිඛිතව ඔප්පුවකින් අපිට මේක දුන්නෙ නැතිවට මේක අපේ.දිස්ත්‍රික් සම්බන්ධිකරණ කමිටුව මේක පවරලා දීලා තිබ්බා.ඊළඟට මේකට ඌණ පූර්ණයක් හැටියට ගේනවා දැනට නුගවෙල හන්දියෙ ක්‍රීඩා පිටියක් තියනවා.මේක තියෙන්නෙත් ප්‍රාදේශීය ලේකම්තුමාට.මේක සමතලා කරලා වටේම ආරක්ෂිත තාප්පෙ හදලා ගත්තනම් එන ඉල්ලීම් වලට සංගීත සංදර්ශනවලට, තොරන් ගහන්න මේක දෙන්න පුළුවන්කමක් තියනවා.දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවට ඉදිරිපත් කරන්න.ආණ්ඩුකාරවරයගෙ නියමය පරිදි මේක පවරගෙන දෙවැනි අතුරුපිටියක් හදන්න.සංගීත සංදර්ශන, අවුරුදු උත්සව වැනි නොයෙකුත් දේවලට නුගවෙල ක්‍රිඩාංගනය ප්‍රමාණවත් වෙනවා.එතකොට හෙට්ටිපොල පිට්ටනියට නගරයේ තියන තදබදය අයින් කරගන්න පුළුවන් කමක් තියනවා.දිස්ත්‍රික් සම්බන්ධිකරණ කමිටුවෙ අනුමත කරපු එක නැවත වතාවක් සභාවෙ සම්මත කරලා, සභාවෙ යෝජනාවක් එක්ක දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවට ඉදිරිපත් කරන්න කියලා මං ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා.

- ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එච්.එම්.සමරසිංහ කිර්ති බංඩාර හේරත්මහතා ප.ව.13.12 ට පමණ ගරු සභාවෙන් බැහැරට ගියා.
- ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එම්.විරාජ් මලින්ද ඩයස් මහතා ප.ව.13.12 ට පමණ ගරු සභාවට පැමිණියා

**ගරු මන්ත්‍රී ආර්.ඩී. ලාලිත ඉඳුනිල් මහතා - (ජා.ජ.බ)**

සභාපතිතුමනි, පහුගිය දවස්වල තිබුන රාත්‍රි ක්‍රිකට් තරඟය මටත් කට්ටිය කතා කලා. චෝදනා කලා.ඒත් ඒ වෙනකොට අපිට ඒක නවත්වන්න පුළුවන් කම තිබුනෙ නෑ.සභාවෙන් අනුමැතිය දිලා ඉවරයි එතකොට.අවසර දුන්නට පස්සෙ 80% ක් විතර වැඩ ඉවර වෙලා තියෙද්දි ඒක නැවැත්තුවනම් ලොකු ගැටළුවක්ඇති වෙනවා.මට විරුද්ධ වෙන්න බෑ.මේකට ඩිපොසිට් එකක් තියනවා රු.10,000.00 විතර.ටිඕී ලා දාලා වාර්තාවක් අරගෙන එයාලගෙ ඩිපොසිට් එකෙන් කපාගෙන නැවත යථා තත්වයට පත් කරගන්න මේ වැඩේට ඉඩ දෙන්න කියලා.ඉතින් එහෙම තත්වයක් තමයි උදා වුනේ.

- ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එච්.එම්.සමරසිංහ කිර්ති බංඩාර හේරත්මහතා ප.ව.13.16 ට පමණ ගරු සභාවට පැමිණියා

**ඒ අනුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව යටතේ ඇති කුලි/ හෙට්ටිපොල මහින්දෝදය මහා විද්‍යාලයට අයත් හෙට්ටිපොල මහජන ක්‍රීඩාංගනය නඩත්තු හා සංවර්ධන කටයුතු සඳහා පඩුවස්නුවර ප්‍රාදේශීය සභාව වෙත පවරා දී ඇත. මෙම ක්‍රීඩාංගනය 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ ප්‍රදේශයේ මහ ජනතාවගේ සුබ විහරණය සඳහාද 19 (xix) අ වගන්තිය යටතේ ප්‍රාදේශීය සභා ප්‍රදේශය තුල ක්‍රීඩා භූමි පහසුකම් සැලසීම යටතේද පඩුවස්නුවර ප්‍රාදේශීය සභාවට පවරා ගැනීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ එදින පැමිණි සිටි සභිකයන් විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී.**

**(ඉ) <u>XV. ගරු සභාපති වයි.ජී.සංජීව කරුණා සාගර මහතා විසින් කරනු ලබන අංක 6.(ඉ). XV දරණ යෝජනාව</u>**

අමාත්‍යංශ ආධාර යටතේ මඩඉන පොල්කුඹුර මාර්ගය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතියට අදාලව මේ වන විට වැඩ අවසන් කර ඇති කොටස සඳහා ගෙවීම් කිරීමට කෘෂිකර්ම පශු සම්පත්, ඉඩම් හා වාරි මාර්ග අමාත්‍යංශය මඟින් එවා ඇති අත්තිකාරම් මුදල රු.860,621.85 වැඩ අවසන් කර ඇති කොටස සඳහා රු.2,155,859.67 මුළු මුදල රු3,016,481.52 ගෙවීම සුදුසු බව යෝජනා කරමි.

**<u>ගරු මන්ත්‍රී එම්.ජී.මංජුල ප්‍රසන්න මංජුල මල්ලව ආරච්චි මහතා - (ජා.ජ.බ)</u>**

සභාපතිතුමා විසින් ගෙන ආ යෝජනාව මා විසින් ස්ථිර කරනවා

**ඒ අනුව අමාත්‍යාංශය ආධාර යටතේ මඩඉන පොල්කුඹුර මාර්ගය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතියට අදාලව මේ වන විට වැඩ අවසන් කර ඇති කොටස සඳහා ගෙවීම් කිරීමට කෘෂිකර්ම පශු සම්පත්, ඉඩම් හා වාරි මාර්ග අමාත්‍යංශය මඟින් එවා ඇති අත්තිකාරම් මුදල රු.860,621.85 වැඩ අවසන් කර ඇති කොටස සඳහා රු.2,155,859.67 මුළු මුදල රු3,016,481.52 ගෙවීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ එදින පැමිණි සිටි සභිකයන් විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී.**

**(ඉ) <u>XVI. ගරු සභාපති වයි.ජී.සංජීව කරුණා සාගර මහතා විසින් කරනු ලබන අංක 6.(ඉ). XVI දරණ යෝජනාව</u>**

පඩුවස්නුවර නැගෙනහිර සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලය අංගමුව සායන මධ්‍යස්ථානය වෙත රැගෙන යාම හා ගිවිසුම් ගත විම සම්බන්ධයෙන් වයඹ ප්‍රධාන ලේකම්ගේ අනුමැතිය ලබා ගැනිම හා විධිමත් පරිදි ගිවිසුම් ගත වන තෙක් අධි ගාස්තු ලබා නොගැනිම යොජනා කරමි.

**<u>ගරු මන්ත්‍රී ජේ.එම්. දිලිප් ජයසිංහ මහතා - (ජා.ජ.බ)</u>**

එම යෝජනාව මා විසින් ස්ථිර කරනවා

**<u>ගරු සභාපති වයි.ජී.සංජීව කරුණාසාගර මහතා</u>**

සාමාන්‍ය අපේ ගාස්තුවෙ දිනය පමා වුනාම දඩ මුදලක් අය කරනවා.ගිවිසුම් ගත වෙන්න කාලයක් යනවා.ඒ ගිවිසුම්ගතවන තෙක් මේ අධි ගාස්තුව අය කර නොගෙන ඉන්න අපි යෝජනා සම්මත කර ගමු.

**ඒ අනුව පඩුවස්නුවර නැගෙනහිර සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලය අංගමුව සායන මධ්‍යස්ථානය වෙත රැගෙන යාම හා ගිවිසුම් ගත විම සම්බන්ධයෙන් වයඹ ප්‍රධාන ලේකම්ගේ අනුමැතිය ලබා ගැනිම හා විධිමත් පරිදි ගිවිසුම් ගත වන තෙක් අධි ගාස්තු ලබා නොගැනිම සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ එදින පැමිණි සිටි සභිකයන් විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී.**

**(ඉ) <u>XVII. ගරු සභාපති වයි.ජී.සංජීව කරුණා සාගර මහතා විසින් කරනු ලබන අංක 6.(ඉ). XVII දරණ යෝජනාව</u>**

පඩුවස්නුවර ප්‍රාදේශිය සභාවට අයත් හෙට්ටිපොල බස් නැවතුම්පල වෙළෙඳ සංකීර්ණයේ මාසික කුලී හා පෙර ගෙවුම් කඩ කාමර සඳහා රජයේ ප්‍රධාන තක්සේරුකරුගේ KG/RP/2664 YD 2026.05.08 දිනැති තක්සේරු වාර්තාව පිළිගැනිම හා වසර තුනක කාලයක් සඳහා ගිවිසුම් ගත විම යොජනා කරමි.

**<u>ගරු මන්ත්‍රී ආර්.ඩී. ලාලිත ඉඳුනිල් මහතා - (ජා.ජ.බ)</u>**

කඩ කාමරවල තක්සේරු මුදල පොඩ්ඩක් වැඩි බව තමා පේන්නෙ.ඒ නිසා හෙට්ටිපොල බස් නැවතුම්පල වෙළෙඳ සංකීර්ණයේ මාසික කුලී හා පෙර ගෙවුම් කඩ කාමර සඳහා තක්සේරුව නැවත සලකා බැලිමත් ගිවිසුම අවසන් වන දින සිට නැවත වසර 3 ක් සඳහා ගිවිසුම් ගත වීමත් සුදුසුයි කියලා මම ඒ යෝජනාව සංශෝදනය කරලා ස්ථිර කරනවා.

**ඒ අනුව පඩුවස්නුවර ප්‍රාදේශිය සභාවට අයත් හෙට්ටිපොල බස් නැවතුම්පල වෙළෙඳ සංකීර්ණයේ මාසික කුලී හා පෙර ගෙවුම් කඩ කාමර සඳහා තක්සේරුව නැවත සලකා බැලිම සඳහා ඉල්ලිමක් නැවත රජයේ ප්‍රධාන තක්සේරුකරුවෙත ඉදිරිපත් කිරිමත් ගිවිසුම අවසන් වන දින සිට නැවත වසර 3 ක් සඳහා පවතින**

**කුලිය යටතේ ගිවිසුම් ගත විමත් සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ එදින පැමිණි සිටි සභිකයන් විසින් ඒකමතිකව සහා සම්මත කරන ලදී.**

## (ඉ) XVIII ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.ඩී.ලාලිත ඉඳුනිල් මහතා විසින් කරනු ලබන අංක 6.(ඉ). XVIII දරණ යෝජනාව

**ගරු මන්ත්‍රී ආර්.ඩී. ලාලිත ඉඳුනිල් මහතා - (ජා.ජ.බ)**

ගරු සභාපතිතුමනි, හෙට්ටිපොල නගරයේ විදුලි අළුත්වැඩියා කටයුතු සඳහා සෙනසුරාදා දින හැර අනිකුත් දිනයන් යොදාගන්නා ලෙස කරන යෝජනාව මම සභාවට ඉදිරිපත් කරනවා..

**ගරු මන්ත්‍රී එම්.ජී.මංජුල ප්‍රසන්න මංජුල මල්ලව ආරච්චි මහතා - (ජා.ජ.බ)**

එම යෝජනාව මා විසින් ස්ථිර කරනවා

**ගරු මන්ත්‍රී ආර්.ඩී. ලාලිත ඉඳුනිල් මහතා - (ජා.ජ.බ)**

- ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී පි.එම්.කුමාරසේන ජයලත් මහතා ප.ව.13.20 ට පමණ ගරු සභාවෙන් බැහැරට ගියා.
- ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ආර්.ඩී.එම්. ජයන්ත දිසානායක මහතා ප.ව.13.20 ට පමණ ගරු සභාවෙන් බැහැරට ගියා.

ගරු සභාපතිතුමනි, මේ යෝජනාව ඉදිරිපත් කරන හේතුව සෙනසුරාදා දිනය තමයි මේකෙ ව්‍යාපාරිකයො,සතියම ඉඳලා, මහජනතාව ගෙදර ඉන්න දවස සතිපොල පැවැත්වෙනවා.ව්‍යාපාරවලත් සතියෙ නිවාඩු දවස් නිසා සියළුදෙනාම ගමේ අය ටවුමට එන්නෙ යම්කිසි දෙයක් මිලදී ගන්න.සෙනසුරාදා දවසේ විදුලිය විසන්ධි කරාම ප්‍රජාවක් වශයෙන් දැඩි අපහසුතාවයට පත්වෙනවා.විශේෂයෙන්ම හෙට්ටිපොල මේ ටවුන් ඒරියා එකේවත් මෙය ක්‍රියාත්මක කරගන්න පුළුවන්නම් මෙය ඉතා යෝග්‍යයයි කියලා මං යෝජනා කරනවා.උදේ 9.00 ඉඳන් සවස 5.00 වෙනකම් කපනවා කියන්නෙ ඒ වෙළඳම් කරන්න තියන කාලය හා ව්‍යාපාරික අවස්ථා සම්පූර්ණයෙන්ම ගිලිහි යනවා.ඒ සම්බන්ධව සභාවක් වශයෙන් කටයුතු කරලා විදුලිබල මණ්ඩලයට ඒක දැනුවත්කරමු කියන අදහස තමයි මං මේ අවස්ථාවේ යෝජනා කරන්නෙ.

**ගරු සභාපති වයි.ජී.සංජීව කරුණාසාගර මහතා**

පහුගිය සෙනසුරාදා හෙට්ටිපොල නගරයේ විදුලිය බිඳ වැටුනා.පොලේ වතුර නැතිව ගියා. වැසිකිලි පද්ධතිවල වතුර නැතිව ගියා.සභාවෙන් ජලය සපයන්නෙ නැ.ජල සම්පත් මණ්ඩලයෙන් මේක සපයන්නෙ.චෝදනාව ආයෙ නැවත එන්නෙ සභාවට.ඒ නිසා අපි මේක සම්බන්ධීකරණ කමිටුව හරහා විදුලිබල මණ්ඩලය වෙත මේ යෝජනාව යවමු.හෙට්ටිපොල නගරයේ සෙනසුරාදා දවසේ හදිසි තත්වයක් ඇතුලෙ නොවන නඩත්තු කටයුතු සෙනසුරාදා දිනයට යොදා ගන්න එපා කියන එක.

**ඒ අනුව ගරු මන්ත්‍රී ආර්.ඩී. ලාලිත ඉඳුනිල් මහතා විසින් ගරු සභාවට ඉදිරිපත් කර ඇති හෙට්ටිපොල නගරයේ විදුලි අළුත්වැඩියා කටයුතු සඳහා සෙනසුරාදා දින හැර අනිකුත් දිනයන් යොදාගන්නා ලෙස ඉල්ලීම් කිරිම සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ එදින පැමිණි සිටි සභිකයන් විසින් ඒකමතිකව සහා සම්මත කරන ලදි.**

## (ඉ) XIX. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එච්.රංජිත් උපාලි මහතා විසින් කරනු ලබන අංක 6.(ඉ). XIX දරණ යෝජනාව

**ගරු මන්ත්‍රී ආර්. එච්. රංජිත් උපාලි මහතා - (ස්වාධීන)**

ගරු සභාපතිතුමනි, ගරුසභාපතිතුමා ඇතුළු මන්ත්‍රි මණ්ඩලයෙන් අවසරයි. ලේකම්තුමිය ඇතුළු කාර්ය මණ්ඩලයෙන් අවසරයි, නගරයේ බස්නැවතුම්පොල පවතින ස්ථානයේ වෙළඳ සංකීර්ණයේ කඩ කාමරවල පවතින අපිරිසිදුභාවය හා පරිපාලනයේ ගැටළු පිලිබඳව මේ මොහොතේ සමාජ මාධ්‍යයේ මේ සිද්ධිය සම්බන්ධ රූප රාමු සංසරණය වෙමින් පවතිනවා .මෙම තත්වය මග හැරීම සඳහා මෙහි වැඩ කටයුතු හා කළමණාකාරීත්වය යාවත්කාලීනව පවත්වාගෙන යාම සඳහා සුදුසු වැඩපිලිවෙලක් ක්‍රියාත්මක කිරීම සඳහා මම මේ යෝජනාව සභාවට ඉදිරිපත් කරනවා..

**<u>ගරු සභාපති වයි.ජී.සංජීව කරුණාසාගර මහතා</u>**

ඔබතුමාගෙ යෝජනාව මමම ස්ථිර කරනවා.

**<u>ගරු මන්ත්‍රී ආර්. එච්. රංජිත් උපාලි මහතා - (ස්වාධීන)</u>**

- ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී සි.පි.රංජිත් අබේපාල මහතා ප.ව.13.24 ට පමණ ගරු සභාවෙන් බැහැරට ගියා.
- ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී පි.එම්.කුමාරසේන ජයලත් මහතා ප.ව.13.24 ට පමණ ගරු සභාවට පැමිණියා
- ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ආර්.ඩි.එම්. ජයන්ත දිසානායක මහතා ප.ව.13.25 ට පමණ ගරු සභාවට පැමිණියා
- ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී සි.පි.රංජිත් අබේපාල මහතා ප.ව.13.26 ට පමණ ගරු සභාවට පැමිණියා

ගරු සභාපතිතුමනි,පහුගිය දවසක නන්දසිරි මන්ත්‍රීතුමත්,මමත් රංජිත් අබේපාල මන්ත්‍රීතුමත් අපි ගමනක් යන්න ගියාම බස්නැවතුම්පලේ නැවතුනා.අපිට ඉල්ලීමක් කළා.ගොඩනැගිල්ලට ගිහිල්ලා බලන්න කියලා.අපි ගිහින් බලපුවම ඔය කියන තත්වෙත් එක්ක හාත්පසින් වෙනස් වෙච්ච දර්ශනයක් අපි දැක්කා.බිත්තර වැටුනා නම් බිදෙන්න ඕන.කුරුළු පැටව් වැටුනනම් මැරෙන්න ඕන.සිවිලිම අලුතින් ගහලා තිබ්බා.සමාජ මාධ්‍ය සංසරණය වුනා මේක.සභාපතිතුමා,මන්ත්‍රීමණ්ඩලය,කාර්ය මණ්ඩලය සියළුදෙනා අපහසුතාවයට පත්වුනා.අපි කරන ඉල්ලීම් වලට කුඩම්මගෙ සැලකිලි හම්බ වෙන්නෙ.කෝබ්‍රා පහන් දාන්න කිව්වා දැම්මෙ නැ. නමුත් ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා.දැන් කම්කරුවො පාලනය කරන්න වැඩ පරිපාලකයෙක් බඳවාගන්න යෝජනාව සම්මත වුනා.අපි වැසිකිලි ඇතුලට ගියා. ඇතුලට යන්න බැ. අහුමුළු වල කුඩු කාරයෝ ගංජාකාරයෝ හැසිරෙනවා.මේවා හරියට පාලනය වෙන්නනම් වෙළඳ සංකීර්ණයට පරිපාලක කෙනෙක් ඉන්න ඕන.දකින්න සුදුසු නැති දර්ශනයක් අපි ඇස් දෙකෙන් දැක්කෙ.මං ඉල්ලීමක් කරනවා සභාපතිතුමා කරුණාකරලා ගිහින් බලන්න.වැසිකිළි දෙකේම ඇතුළට යන්න බැ.කාමරවල තියෙන්නෙ මනාලියන් හැඩ ගැන්වීම හැබැයි සැලුන් වලින් ඇදගන්න යන ළමයින්ට ආපහු බහින්න වෙන්නෙ ලිස්සලා වැටිලා.මොප් කරන්නෙ නැ.මේක හිටපු මන්ත්‍රීවරයෙක් දාලා තියෙන්නෙ. ඒකයි කණගාටුව. සමාජ මාධ්‍යයෙන් සංසරණය වෙන්නෙ නිවැරදි දෙයක් වෙන්න ඕන.නමුත් තිබුන දර්ශනය ඊට වෙනස්.මකුළුදැල් වලින් පිරිච්ච, මොප් කරලා නැති කඩකාමර තමයි දකින්න තිබුනෙ.මං ඉල්ලීමක් කරනවා මේක මොප් කරන්න සනිපාරක්ෂක කම්කරුවො දෙන්නෙක් දවසකට සැරයක් දාන්න මුළු සම්පූර්ණ පරිශ්‍රයට ශුද්ධ පවිත්‍ර කිරිම සඳහා.ඒක අධීක්ෂණය කරන්න කෙනෙක් දාන්න.කාන්තා ටොයිලට් එකට යන්න බැ.වතුර ලීක් වෙනවා.කළුපාට පැල්ලම් පිරිලා.පරවියො නොඑන්නත් සිවිලිම ඇතුලට රසායනික ද්‍රව්‍ය ගහන්න පුළුවන්.මං ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා කම්කරු පරිපාලකවරයෙක් පත් කරන්න.ඒ කම්කරු පරිපාලකවරයට සතියට දවසක් මේක භාර දෙන්න.සනිපාරක්ෂක කම්කරුවො දවසක් හැර දවසක් ක්ලිනින් පද්ධතියට සම්පූර්ණයෙන් යොදවන්න.සිවිලිම අලුතින් ගහද්දි තිබුන අපද්‍රව්‍ය තමයි මේ ෆොටෝ එක ගන්න ඇත්තෙ.තව විඩියෝ එකක් ගියා බෝගොල්ල පාර ගැන.මං මේ පිලිබඳ යෝජනාව දැම්මෙ මන්ත්‍රීවරු 38 දෙනෙක් ඉන්නවා.ඒ 38 දෙනාටම මඩ ගහලා තිබ්බා.

**<u>ගරු සභාපති වයි.ජී. සංජීව කරුණාසාගර මහතා</u>**

මේ යෝජනාව මමම ස්ථිර කරා.හැබැයි මට ඒකෙදි ඔබතුමාට ඉදිරිපත් කරන්න ඕන කරුණු කිපයක් තියනවා.එක තමයි මම කලිනුත් මේක කිව්වා අපි මේකට පය ගහනකොට අඩිය තියන්න බැරි තත්වයක් තමයි තිබුනෙ.දැන් යම් මට්ටමකට හොඳයි.ඔබතුමා අර කියපු මොප් කරන වැඩේ දවසක් ඇර දවසක් නෙමේ දවස ගානෙම සිද්ධ වෙනවා.ඒකට අපි කෙනෙක් දාලා ඉන්නෙ.දවස ගානෙම වැඩේ සිද්ධ කරනවා.ඊට පස්සෙ නගරයේ බස්ටෑන්ඩ් එකේ කුණු දාන එකටත් අපි වැඩපිලිවෙලක් හදන්න ඕන කම තියෙනවා.ඒක මෙතනදිම අපි යෝජනා සම්මත කර ගමු.

**ඒ අනුව ගරු මන්ත්‍රී ආර්.එච් රංජිත් උපාලි මහතා විසින් ගරු සභාවට ඉදිරිපත් කර ඇති නගරයේ බස්නැවතුම්පොල පවතින ස්ථානයේ වෙළඳ සංකීර්ණයේ කඩ කාමරවල පවතින අපිරිසිදුභාවය හා**

**පරිපාලනයේ ගැටළු තත්වය මඟ හැරීම සඳහා මෙහි වැඩ කටයුතු හා කළමණාකාරීත්වය යාවත්කාලීනව පවත්වාගෙන යාම සඳහා සුදුසු වැඩපිලිවෙලක් ක්‍රියාත්මක කිරීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ එදින පැමිණි සිටි සභිකයන් විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදි.**

**(ඉ) <u>XX. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එම් නන්දසිරි මහතා විසින් කරනු ලබන අංක 6.(ඉ). XX දරණ යෝජනාව</u>**

**<u>ගරු මන්ත්‍රී කේ.එම්. නන්දසිරි මහතා - ( ස.ජ.බ)</u>**

ගරු සභාපතිතුමනි, ගරුසභාපතිතුමා ඇතුළු මන්ත්‍රි මණ්ඩලයෙන් අවසරයි. ලේකම්තුමිය ඇතුළු කාර්ය මණ්ඩලයෙන් අවසරයි. නිකපිටිය ගනේගම ප්‍රධාන මාර්ගය තාවකාලිකව හෝ ඒබීසී දමා පිලිසකර කර දෙන මෙන් මම සභාවට යෝජනා කරනවා.

**<u>ගරු මන්ත්‍රී එම්. කේ.ආර්. හුසේයින් මහතා - ( ස.ජ.බ)</u>**

එම යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

**<u>ගරු මන්ත්‍රී කේ.එම්. නන්දසිරි මහතා - ( ස.ජ.බ)</u>**

- ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රිනි ඊ.ඒ.ඉරාෂි ප්‍රියදර්ශනී මහත්මිය ප.ව.13.40 ට පමණ ගරු සභාවෙන් බැහැරට ගියා.
- ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රිනි නිමල්කා කොටඹගේ මහත්මිය ප.ව.13.40 ට පමණ ගරු සභාවෙන් බැහැරට ගියා.

මං හදිසි යෝජනාවක් හැටියට ඉදිරිපත් කරා අද.මේක ගැන මං මීට සභාවාර කිපයකට ඉහතදිත් කතා කරා.හෙට්ටිපොල නගරය ගත්තහම ගරු සභාපතිතුමනි, ඒ වගේම සතිපොල ගත්තහම වැඩිම ආදායමක් එන මාර්ගයක් තමයි මේ නිකපිටිය මාර්ගය. මේ මාර්ගයේ තමයි නිකවැරටියෙ දැදුරුඔය ගාව ඉදන් ගත්තහම ගම්මාන 30,40 කම ගොවිතැන් කරන මිනිස්සු එළවළු අරන් එන්නෙ මේ හෙට්ටිපොල සතිපොලට. සතිපොලට වැඩිම ආදායමක් ගේන මාර්ගය. හැමදාම අපිට මිනිස්සුන්ගෙ දුක් ගැනවිලි එන්නෙ මේ මාර්ගයෙ පුටි සයිකලයක්වත් මේ වෙනකොට යන්න බැරි තත්වෙට පත්වෙලා තියෙන්නෙ.දියීවා සුළි කුණාටුවෙන් හානි වු මාර්ග ප්‍රතිසංස්කරණය කරන්න මුදල් ආවත් ඔබතුමාලට මේපාරට කියක්වත් යොදවන්න බැරිවුනා.හැබැයි ඔබතුමා සභාවෙ මුදලින් පහුගිය සභාවෙදි ලක්ෂ 30 ක් මේ පාරට දාලා තියනවා.අනුමත වෙලා ඇවිල්ලද නැද්ද කියලා මං දන්නෙ නැ. හැබැයි ගරු සභාපතිතුමනි, ඔබතුමාට මං හැමතිස්සෙම මතක් කරා ලොකු වපසරියක් තියෙන මාර්ගයක්. තාවකාලිකව හරි ඒබීසි ටිකක් දාලා මේපාර යන්න පුළුවන් තත්වයට පත් කරන්න කියලා. ඔබතුමාගෙන් මං ඉල්ලන්නෙ. අහිංසක මිනිස්සු අපිට යම් ආදායමක් ගෙනත් දෙනවනම් සතිපොලට, නගරයට, සභාව දියුණු වෙන්න වරිපනම් ගෙවනවනම් අපේ යුතුකමක් හා වගකිමක් තියනවා මේ මිනිස්සුන්ට ගමනාගමනය හරියට හදන්න.දැන් මේ වෙනකොට පුටි සයිකලයක්වත් යන්න බැරි තත්වයකට උදාවෙලා තියෙන්නෙ.මං ඔබතුමාගෙන් ඉල්ලනවා.කවදා මේක අනුමත වෙලා එයිද දන්නෙ නැ.පඬුවස්නුවර ප්‍රාදේශීය සභාවේ සල්ලි තියනවා.එනිසා තාවකාලික විසඳුමක් වශයෙන් හරි ඒබිසි ටික දාලා තියන ලොකු වලවල් ටික වහලා දෙන්න පුළුවන්නම් ලොකු පිනක්. පොසොන් එකට ලොකු පෙරහැරකුත් තියනවා.ඒ පාරෙත් වළවල් ටික මකා ගන්න වෙනවා.

**<u>ගරු මන්ත්‍රී එම්. කේ.ආර්. හුසේයින් මහතා - ( ස.ජ.බ)</u>**

ඉතාමත්ම වැදගත් යෝජනාවක්.ඒ මාර්ගෙ එදිනෙදා වැඩ කටයුතුවලදි රෝහලට ඉතාමත්ම දුෂ්කර විදිහට ගමන් කරන්නෙ.බයික් එකක ගමන් කරනවනම් විතරයි විනාඩි 5 කින් විතර යන්න පුළුවන්.ඒ වුනාට වාහනේක රෝගියෙක් එක්ක යනවනම් අපිට පැයක් විතර යනවා.ඉතින් මේක ඉතාමත්ම වැදගත් මාර්ගයක්.මං සභාපතිතුමා ඇතුළු සියළු දෙනාගෙන් ඉල්ලන්නෙ හැකිතාක් ඉක්මනින් මේ මාර්ගය සංවර්ධනය කරන්න සහය දක්වන්න කියලා මං ඉල්ලා සිටිනවා.

**<u>ගරු සභාපති වයි.ජී. සංජීව කරුණාසාගර මහතා</u>**

- ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රිනි ඊ.ඒ.ඉරාෂි ප්‍රියදර්ශනී මහත්මිය ප.ව.13.44 ට පමණ ගරු සභාවට පැමිණියා
- ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රිනි නිමල්කා කොටඹගේ මහත්මිය ප.ව.13.44 ට පමණ ගරු සභාවට පැමිණියා

බොහොම ස්තුතියි.මේ මාර්ගෙ තියන වටිනාකම නන්දෙ මන්ත්‍රීතුමා කිව්වා වගේම අපිත් දකිනවා. මොකද මේක ප්‍රධාන මාර්ගයක්.මේ මාර්ගය මීට වඩා හොඳට හදන්න ඕන.සහ කාපට් කරලා හදන්න ඕන පාරක්.නමුත් ප්‍රාදේශීය සභාව සතුව තියන නිසා මේකෙ ගැටළුවක් තියනවා.ඉදිරියේදි මේක පලාත් සබාවට වගේ පවරා ගත්තනම් වඩා හොඳයි.මෙතුමා ඉල්ලන්නෙ මේ මාර්ගය ඉදිකරනකම් ඒබීසි වත් දාලා මේක ඉදිකරලා දෙන්න කියලා.ඒක සභා අරමුදලින් 2025 වෙන්කරලා තියෙන මුදල් වලින් මාර්ගය අළුත්වැඩියා කටයුතු සඳහා ලක්ෂ 30 ක් ,නිකපිටිය මදුල්ල මාර්ගය වෙල මැද පැති බැම්ම සඳහා ලක්ෂ 20ක්, ඊට පස්සෙ දියීවා හානිය නිසා ලක්ෂ 50 ක්, පලාත් නිශ්චිත වලින් ඉල්ලලා තියනවා.දැනට 40 ක් ලැබිලා තියනවා.ලක්ෂ 90 ක මුදලක් දැනට තියෙනවා.ඉතුරු 10 ත් අපි ගන්න තමා උත්සාහ කරන්නෙ.ඇස්තමේන්තු කරලා තමයි වැඩ පටන්ගන්න වෙන්නෙ.

**ඒ අනුව ගරු මන්ත්‍රී කේ එම් නන්දසිරි මහතා විසින් ගරු සභාවට ඉදිරිපත් කර ඇති නිකපිටිය ගනේගම ප්‍රධාන මාර්ගය තාවකාලිකව හෝ ඒබීසී දමා පිළිසකර කිරීම සුදුසු බවට ගරු සභාවේ එදින පැමිණි සිටි සභිකයන් විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදි.**

**(ඊ). කාරක සභාවල වාර්තා සහ එම වාර්තා එවෙලේම සලකා බැලීමට ප්‍රාදේශීය සභාව තීරණය කරන්නේ නම් මිස ඒවා සලකා බැලීම සඳහා දිනයක් නියම කිරීම.**

**(ඊ). I. 2026.03.27 දින පැවති මුදල් සහ ප්‍රතිපත්ති සැකසීමේ කමිටුවේ වාර්තාව සලකා බැලීම සඳහා මහා සභාවට ඉදිරිපත් කිරීම.**

**<u>ගරු මන්ත්‍රී ආර්. එච්. රංජිත් උපාලි මහතා - (ස්වාධීන)</u>**

ගරු සභාපතිතුමා මේ කමිටු වාර්තාවල පැහැදිලි කිරීම් ටිකක් තියනවා කරගන්න. පලවෙනි එක අංක 1.RE -8933 ට්‍රැක්ටරය අලුත්වැඩියා කිරීම

ඒ ට්‍රැක්ටරයේ රු.10,550.00 ක මුදල ගෙවීම එම්.එන්.එම්.නව්ෂාඩ් මහතාට අළුත්වැඩියාව සඳහා කියලා තියෙන්නෙ මේ නව්ෂාඩ්ට තියෙන්නෙ සර්විස් ආයතනයක් මේක ගරාජයක් හැටියට ලියාපදිංචි වෙලාද .2026 සැපයුම්කරුවන්ගේ ලේඛනයේ මේක ගරාජයක් හැටියට ලියාපදිංචි වෙලාද

**<u>ගරු සභාපති වයි.ජී.සංජීව කරුණාසාගර මහතා</u>**

දෙකටම ලියාපදිංචි වෙලා තියෙන්නෙ.

**<u>ගරු මන්ත්‍රී ආර්. එච්. රංජිත් උපාලි මහතා - (ස්වාධීන)</u>**

ගරාජයක් හැටියට එන්.එම්.බී.ඔටෝ සර්විස් ආයතනය විතරද ලියාපදිචි වෙලා තියනවා.

**<u>ගරු සභාපති වයි.ජී.සංජීව කරුණාසාගර මහතා</u>**

ඔය මන්ත්‍රීතුමා ධාවනය වන අවස්ථාවේදී වුන අනතුරක්.තව දෙයක් කියන්න ඕන.ඔය ගරාජ් ප්‍රශ්නය මතු කරද්දි ඇත්තටම ගැටළු තියාගෙන තමයි සමහර මිල තීරණ ගැනීමේදී කලින් සර්විස් වලට 55,000.00, 60,000.00 තිබුන සර්විස් දැන් යන්නෙ රු.17,000.00.ඒ නිසා ඒවා වෙනස් කිරීමේ ව්‍යායාමය සාර්ථක වෙලා තියනවා.වාර්තාව අවුරුද්ද අවසානෙ ඉදිරිපත් කරන්නම්.

**<u>ගරු මන්ත්‍රී ආර්. එච්. රංජිත් උපාලි මහතා - (ස්වාධීන)</u>**

එතකොට මෙතන තියනවා අංක 16 ආදාහනාගාරයට ලිට්‍රෝ ගෑස් මිළදී ගැනීම කියලා කිලෝ ග්‍රෑම් 37.5 රු.170,640.00 ක මුදලක් ගෙවීමටත්, 17 යටතේ ආයෙත් ආදාහනාගාරයට ලාෆ් ගෑස් මිළදී ගැනීම කියලා ශාන්ති ස්ටෝර්ස් එකෙන් රු.17,064.00 ක මුදලක්.මේක පැහැදිලි කරන්න කියලා ඉල්ලීමක් කරනවා. එකම ප්‍රමාණෙ ගෑස් සිලින්ඩර් ආයතන දෙකකින් මිළදී ගැනීම පිලිබඳව

**<u>ගරු සභාපති වයි.ජී.සංජීව කරුණාසාගර මහතා</u>**

සභාවෙ මෙච්චර කාලයක් ලාෆ් ගෑස් හා ලිට්රෝ ගෑස් කියන දෙකම මිලදී ගන්නවා. ඔය සමාගම් දෙකෙන්ම මිලදී ගන්න ඕන නිසා සමාගම් දෙකම පවත්වාගෙන යා යුතුයි කියන අදහසින් ඔය දෙකම පාවිච්චි කරනවා.

**ගරු මන්ත්‍රී ආර්. එච්. රංජිත් උපාලි මහතා - (ස්වාධීන)**

ලේකම්තුමිය මුදල් පොතේ 6 ඉඳන් 21 දක්වා අතිකාල ගෙවීම් සම්බන්ධව තියනවා.මේ අතිකාල ගෙවද්දි අතිකාල ගෙවන්නෙ කොච්චර දවසකටද, පැය කීයක්ද මේ ගොල්ලො සේවය කරලා තියෙන්නෙ.අතිකාල සේවය පිලිබඳ පැහැදිලි කිරීමක් අවශ්‍ය වෙනවා මන්ත්‍රීවරු සියළුදෙනාට.අතිකාල කියලා කියන්නෙ තමන්ගේ සේවා කාලයට අමතරව කරපු සේවයට කරපු ගෙවීම.අතිකාල ගෙවීම සම්බන්ධව ගතකරපු පැය සහ විස්තරය කමිටුවට අවශ්‍යයයි.

- ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එස්.එච්.මාලක අරුණ කුමාර මහතා ප.ව.14.00 ට පමණ ගරු සභාවෙන් බැහැරට ගියා.
- ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී කේ.එම් නන්දසිරි මහතා ප.ව.14.00 ට පමණ ගරු සභාවෙන් බැහැරට ගියා.
- ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එම් අශෝක හේරත් මහතා ප.ව.14.00 ට පමණ ගරු සභාවෙන් බැහැරට ගියා.

**(ඊ). II. 2026.03.27 දින පැවති ප්‍රසම්පාදන කමිටුවේ වාර්තාව සලකා බැලීම සඳහා මහා සභාවට ඉදිරිපත් කිරීම.**

**(ඊ). 111. 2026.04.09 වන දින පැවති කාර්මික සේවා කමිටුව සඳහා සහභාගී නොවූ මන්ත්‍රීවරුන්ගේ නිවාඩු නිවාඩු සලකා බැලීම.**

**ගරු මන්ත්‍රිනී අයි.සද්නා දිල්හානි ප්‍රනාන්දු මහත්මිය - (ශ්‍රී.ල.පො.පෙ)**

සභාපතිතුමා, 04.09 කාර්මික සේවා කමිටු වාර්තාව අනුමත වෙලා තියෙන්නෙ 04.09. 04.09 කමිටු වාර්තාවෙ තියනවා 1- සිට 32 දක්වා පාරවල් ප්‍රමාණයක්.ඒ පාරවල් 32 ඇතුලෙ මං කියන්නෙ එතනදි මේ පාරවල් මගේ කොට්ඨාශෙ පාරවල් ටික ගැන මං කථා කරන්නෙ. සමහර ඒවට ඒබීසී, කොන්ක්‍රිට්ගල් සපයලා තිබ්බට පස්සෙ තමයි මේ මුදල් කමිටුවෙ අනුමත වෙන්නෙ.ඒක එහෙමද දන්නෙ නෑ. දැන් කරන්නෙ.මේ කියන පාරවල් මේ කියන විදිහට අනුමත වුනා කිව්වට.

**ගරු සභාපති වයි.ජී.සංජීව කරුණාසාගර මහතා**

ඔබතුමිය කියන්නෙ මේකෙ බඩු මුට්ටු ටික ඔක්කොම ගෙනත් ඊට පස්සෙ කමිටු වාර්තාව ආවා කියලනෙ.

**ගරු මන්ත්‍රිනී අයි.සද්නා දිල්හානි ප්‍රනාන්දු මහත්මිය - (ශ්‍රී.ල.පො.පෙ)**

මේකෙ තියනවා අංක 23 තිඹිරිවැව ගම මැද මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම කියලා. ඒකෙ රු.350,000.00ක් වෙන් කරලා තියනවා.එතෙන්ට ඒ වෙන් කරලා තියන එක අනුමත වෙන්නෙ 2026.04.09 දින පැවැත්වූ කාර්මික සේවා කමිටු තීරණ අංක 23 යටතේ තමයි තීරණය කරන්නේ මේ අනුමැතිය ලැබෙන්නෙ.මට තියන ගැටළුව තමයි ඒ වෙද්දි ඒ කොට්ඨාශෙ අහල් ටික කපලා.

**ගරු සභාපති වයි.ජී.සංජීව කරුණාසාගර මහතා**

මන්ත්‍රීතුමිය මේ ඇස්තමේන්තුව ගේන්නෙ.ඔබතුමිය වීඩියෝ එකකුත් යවලා තිබුනා.ඒ කානු කපලා කානු පද්ධතිය සකසලා පාර බොරළුදාන මට්ටමට කලින් යෝජනා සම්මත කරලා ඇස්තමේන්තු කරලා ඒ අස්තමේන්තු අනුව කටයුතු කරලා ඒවට මුදල් ගෙවලා තියනවා.මේ තියෙන්නෙ අර ප්‍රශ්නෙ විසඳන්න අපි මුදල් වෙන් කරලා බොරළු දාන්න.

**ගරු මන්ත්‍රී ඩී.ඩී.එස්.පද්මලාල් මහතා - (සර්ව ජන බලය)**

සභාපතිතුමා මේකෙ අංක 15 තියනවා දොළහමුන 04 වන මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම යටතේ , එම ඇස්තමේන්තුවට අනුව සෘජු ඉදිකිරීම මඟින් අදාල කර්මාන්තය ඉටු කිරීම කියලා. ඒකෙ තේරුම. අදාල කර්මාන්තය කියන්නෙ.

- ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එස්.එච්.මාලක අරුණ කුමාර මහතා ප.ව.14.02 ට පමණ ගරු සභාවට පැමිණියා
- ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී කේ.එම් නන්දසිරි මහතා ප.ව.14.02 ට පමණ ගරු සභාවට පැමිණියා
- ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එම් අශෝක හේරත් මහතා ප.ව.14.03 ට පමණ ගරු සභාවට පැමිණියා

**ගරු සභාපති වයි.ජී.සංජීව කරුණාසාගර මහතා**

අදාල කර්මාන්තය කියන්නෙ පාර කියන එක මන්ත්‍රිතුමා.

**(ඊ). IV. 2026.04.27 දින පැවති මුදල් සහ ප්‍රතිපත්ති සැකසීමේ කමිටුවේ වාර්තාව සලකා බැලීම සඳහා මහා සභාවට ඉදිරිපත් කිරීම.**

**ගරු මන්ත්‍රිනී අයි.සද්නා දිල්හානි ප්‍රනාන්දු මහත්මිය - (ශ්‍රී.ල.පො.පෙ)**

මේ වාර්තාවෙ 27 යටතේ ජංගම වෙළඳ කුටි ලබා දීම සම්බන්ධව ආපසු භාර දීමේ සහ ජංගම කුටි ඉල්ලීම් ලැයිස්තුවක් තියනවා.ඒ ගොල්ලො නැවත ඉල්ලීමක් කරන්න ඕනද.එයාලගෙ තොරතුරු අනුව දෙන්න කොහොමද කටයුතු කරන්නෙ.

**ගරු සභාපති වයි.ජී.සංජීව කරුණාසාගර මහතා**

දෙන්න කටයුතු කරපු විදිහ මං කියන්නම්. ගත්තු අය පවත්වගෙන යන්න බෑ ආපහු භාර ගන්න කියලා ඉල්ලීම් කරලා තිබ්බා.එතකොට ඒ වගේම නැවත වෙළඳ කුටි ඉල්ලලා 35 ක් විතර දීලා තිබුනා.42 ක් තියනවා.ඒ 42 අතරින් අපි හොයලා බැලුවා දැනට යම් මට්ටමකට හරි කරගෙන යන අය කව්ද කියලා. ඒ අය බලලා තමයි ඔය දීලා තියෙන්නෙ.ඒකත් කමිටුවෙන් තමයි තීරණය කරලා තියෙන්නෙ.

**ගරු මන්ත්‍රිනී අයි.සද්නා දිල්හානි ප්‍රනාන්දු මහත්මිය - (ශ්‍රී.ල.පො.පෙ)**

ඒ අය සභාව හරහා දැනුවත් කරනවද?

**ගරු සභාපති වයි.ජී.සංජීව කරුණාසාගර මහතා**

දැනුවත් කරනවා.

**(ඊ). V.2026 මාර්තු මස අභ්‍යන්තර විගණන පරීක්ෂණ වාර්තාව සලකා බැලීම සඳහා මහා සභාවට ඉදිරිපත් කිරීම.**

**ගරු මන්ත්‍රිනී ඩී. නිමාලි දිල්හානි මෙනවිය - ( ස.ජ.බ)**

සභාපතිතුමා මම ඔබතුමාගෙන් අහන්නෙ අභ්‍යන්තර විගණන පරීක්ෂන වාර්තාව 2026 මාර්තු විගණිත ක්ෂෙත්‍රය,අතිකාල ලේඛණය, කෙටි නිවාඩු ලේඛණය රාජකාරි නිවාඩු ලේඛණය,වාහන බැහැර යාමේ ලේඛණය, බැහැර යාමේ ලේඛණය, පැමිනීමේ ලේඛණය මේකෙ වාහන බැහැර යාමේ ලේඛණ පරීක්ෂාව යටතේ තියනවා .විගණිත දිනය 2025.04.20 වන විට පඩුවස්නුවර ප්‍රාදේශිය සභාවේ වාහන බැහැර යාමේ ලේඛණය පරීක්ෂා කිරීමේදී සභාවේ බොහෝ වාහන බැහැර යෑම සිදු වී ඇත්තේ නිර්දේශයක් හෝ අනුමැතියක් ලබා ගැනීමෙන් තොරව බවත් තවද බැහැර යන සියලු වාහන, වාහන බැහැර යාමේ ලේඛනයේ සටහන් කිරීමක් සිදු නොවන බව නිරීක්ෂණය විය කියලා. සභාපතිතුමා මේ රජයේ දේපල සභාවෙන් පිටට යන එන වෙලාව ගැන සටහන් විය යුතුමයි. මේ ගැන වැඩපිලිවෙලක් හදන්න වෙනවානේද ඉක්මනින්.

**ගරු සභාපති වයි.ජී.සංජීව කරුණාසාගර මහතා**

ලේකම්තුමියත් මමත් එකම කාලේ වගේ තමයි ආවේ. දැන් මේ දේවල් ක්‍රමවත් කරන්න වැඩ සකසමින් යනවා.

**(ඊ). VI.2026 අප්‍රේල් මස අභ්‍යන්තර විගණන පරීක්ෂණ වාර්තාව සලකා බැලීම සඳහා මහා සභාවට ඉදිරිපත් කිරීම**

**(ඊ). VII.2026 වර්ෂයේ පළමු කාර්තුවට අදාල විගණන හා කළමනාකරණ කමිටුවේ වාර්තාව**

## (උ) ලැබීම් හා වියදම් පිලිබඳ මාසික ප්‍රකාශ, එකතු කළ ආදායම පිලිබඳ ප්‍රගති වාර්තා සහ ප්‍රාදේශිය සභාවට ඉදිරිපත් කිරීමට නියමිත වෙනත් ලේඛන ඉදිරිපත් කිරීම හා සලකා බැලීම

**(උ) I. 2026 මාර්තු මස ප්‍රා.ස.14 (මාසික ඒකාබද්ධ වැය සාරාංශය) වාර්තාව සලකා බැලීම සඳහා මහා සභාවට ඉදිරිපත් කිරීම.**

**උපලේඛන 01 සඳහා අනිත් පිට බලන්න**

## පඬුවස්නුවර ප්‍රාදේශීය සභාව

ප්‍රා.ස-14

### මාසික ඒකාබද්ධ වැය සාරාංශය - 2026 මාර්තු

| අය විෂය අංකය | වැය විෂය නාමයන් | 1 පොදු පරිපාලනය | 2 සෞඛ්‍ය සේවා | 3 භෞතික සැලසුම් මංමාවත් ඉඩම් | 4 ජල සේවා | 5 වනත් උපයෝගි සේවා | 6 සුභසාධක සේවා | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|
| 1 | වැටුප් හා දීමනා | 3233441.69 | 1445982.90 | 1852306.85 | 73632.73 | 191176.93 | 4919350.52 | 11715891.62 |
| 2 | ගමන් වියදම් | 21540.00 | 0.00 | 0.00 | 0.00 | 29120.00 | 0.00 | 50660.00 |
| 3 | සැපයුම් හා උපකරණ | 404925.00 | 643750.00 | 372488.00 | 1585.00 | 40000.00 | 42180.00 | 1504928.00 |
| 4 | ප්‍රාග්ධන වත්කම් අලුත්වැඩියා හා නඩත්තු | 90950.00 | 58050.00 | 956344.15 | 1500.00 | 603000.00 | 2600.00 | 1712444.15 |
| 5 | ප්‍රවාහන, සම්බන්ධතා ආවශ්‍යක හා වෙනත් සේවා | 158436.48 | 31381.77 | 11100.00 | 16997.63 | 24268.63 | 10185.54 | 252370.05 |
| 6 | පොළී ගෙවීම්, ලාභාංශ හා ප්‍රසාද මුදල් | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 |
| 7 | ආධාර මුදල් ,දායක මුදල් හා සහනාධාර | 14000.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 4500.00 | 18500.00 |
| 8 | විශ්‍රාම වැටුප් විශ්‍රාම ප්‍රතිලාභ හා පාරිතෝෂික | 0.00 | 30595.72 | 0.00 | 0.00 | 0.00 | 4285.71 | 34881.43 |
| | පුනරාවර්ථන වැය එකතුව | **3923293.17** | **2209760.39** | **3192239.00** | **93715.36** | **887565.56** | **4983101.77** | **15289675.25** |
| | ප්‍රාග්ධන වියදම් | | | | | | | |
| 9 | ප්‍රාග්ධන වැය | 0.00 | 0.00 | 0.00 | 39913.50 | 0.00 | 0.00 | 39913.50 |
| 10 | ණය ආපසු ගෙවීම් | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 |
| | **ප්‍රාග්ධන වැය එකතුව** | **0.00** | **0.00** | **0.00** | **39913.50** | **0.00** | **0.00** | **39913.50** |
| | **පුනරාවර්ථන වැය හා ප්‍රාග්ධක වැය එකතු** | **3923293.17** | **2209760.39** | **3192239.00** | **133628.86** | **887565.56** | **4983101.77** | **15329588.75** |
| | තැන්පත් | 335136.28 | | | | | | 335136.28 |
| | වැට් | 0.00 | | | | | | 0.00 |
| | ජාතිය ගොඩනැගීමෙ බද්ද | 0.00 | | | | | | 0.00 |
| | මුද්දර බද්ද | 0.00 | | | | | | 0.00 |
| | සේවක ණය | 814691.00 | | | | | | 814691.00 |
| | අත්තිකාරම් | 87534.48 | | | | | | 87534.48 |
| | ණයහිමි | 8116193.81 | | | | | | 8116193.81 |
| | සමුච්චිත අරමුදල | 0.00 | | | | | | 0.00 |
| | ආයෝජන | 0.00 | | | | | | 0.00 |
| | අගරු චෙක් | 0.00 | | | | | | 0.00 |
| | මුදල් මාරු | 0.00 | | | | | | 0.00 |
| | වෙනත් | 0.00 | | | | | | 0.00 |
| | **මුළු එකතුව** | **9353555.57** | | | | | | **24683144.32** |

**(උ) II. 2026 මාර්තු ප්‍රා.ස.16 (මාසික ඒකාබද්ධ ලැබීම් සාරාංශය) වාර්තාව සලකා බැලීම සඳහා මහා සභාවට ඉදිරිපත් කිරීම.**

**උපලේඛන 02 සඳහා අනිත් පිට බලන්න**

| පඬුවස්නුවර ප්‍රාදේශීය සභාව | | | | | | | ප්‍රා.ස-16 |
|---|---|---|---|---|---|---|---|
| මාසික ඒකාබද්ධ ලැබීම් සාරාංශය - 2025 මාර්තු | | | | | | | |
| අය විෂය නාමයන් | පොදු පරිපාලනය | සෞඛ්‍ය සේවා | භෞතික සැළසුම් මංමාවත්/ඉඩම් හා ගොඩනැගිලි | ජල සේවා | වෙනත් උපයෝගී සේවා | සුභ සාධක සේවා | එකතුව |
| | 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 |
| 10 වරිපනම් හා බදු | 243112.08 | 341800.00 | 5000.00 | | | 48000.00 | 637912.08 |
| 20 කුලී | | | 1243235.00 | | 2818094.50 | 116200.00 | 4177529.50 |
| 30 බලපත්‍ර ගාස්තු | 0.00 | 225250.00 | | | | 16360.00 | 241610.00 |
| 40 සේවා සඳහා ගාස්තු | 0.00 | 504000.00 | 275348.72 | 0.00 | | 3165.00 | 782513.72 |
| 50 වරෙන්තු ගාස්තු හා දඩ | 0.00 | | 20520.00 | | 8872.00 | 455.00 | 29847.00 |
| 60 වෙනත් ආදායම් | 185816.24 | 159630.00 | 0.00 | 51345.00 | 71025.36 | 9160.00 | 476976.60 |
| 70වෙනත් ආධාර | 3962660.13 | 1280391.42 | 2721463.29 | 101160.00 | 172108.80 | 8134438.77 | 16372222.41 |
| **පුනරාවර්තන ආදායම් එකතුව** | **4391588.45** | **2511071.42** | **4265567.01** | **152505.00** | **3070100.66** | **8327778.77** | **22718611.31** |
| **ප්‍රාග්ධන ආධාර** | | | | | | | |
| 80 මූලධන ලැබීම් | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 |
| **පුනරාවර්තන ආදායම් හා ප්‍රාග්ධන ආදායම්වල එකතුව** | **4391588.45** | **2511071.42** | **4265567.01** | **152505.00** | **3070100.66** | **8327778.77** | **22718611.31** |
| තැන්පත් | 868691.58 | | | | | | 868691.58 |
| වැට් | 0.00 | | | | | | 0.00 |
| ජා.ගො.බද්ද | 0.00 | | | | | | 0.00 |
| මුද්දර බදු | 31482.00 | | | | | | 31482.00 |
| සේවක ණය | 594411.40 | | | | | | 594411.40 |
| අත්තිකාරම් | 38390.00 | | | | | | 38390.00 |
| ණය ගැති | 722332.75 | | | | | | 722332.75 |
| සමූ: අරමුදල | 0.00 | | | | | | 0.00 |
| ආයෝජන | 0.00 | | | | | | 0.00 |
| අගරු චෙක් | 0.00 | | | | | | 0.00 |
| මුදල් මාරු | 0.00 | | | | | | 0.00 |
| ශීර්ෂ බැර | 43225.00 | | | | | | 43225.00 |
| **මුළු එකතුව** | **2298532.73** | | | | | | **25017144.04** |

**(උ) I11. 2026 මාර්තු මස ප්‍රා.ස.07 (හිඟ ආදායම් වාර්තාව) වාර්තාව සලකා බැලීම සඳහා මහා සභාවට ඉදිරිපත් කිරීම.**

උපලේඛන 03 සඳහා අනිත් පිට බලන්න

## පඬුවස්නුවර ප්‍රාදේශීය සභාව ප්‍රා.ස. 07 වාර්තාව - 2026 වර්ෂය මාසය:-මාර්තු

| අනු අංකය | අය විෂය | මාසය මුලදී හිඟය 1 | මාසය මුලදී ඉදිරියට ලැබීම් 2 | මාසය තුළ බිල් කිරීම් 3 | ලැබිය යුතු මුළු ආදායම 4 | මාසය තුළ ලද ආදායම 5 | මාසයට අදාල කලින් ලැබූ ආදායම 6 | ඉදිරියට ගෙන යන කලින් ලැබූ ආදායම 7 | මාසය තුළ ලද ආදායමින් ඉදිරියට ලැබූ ආදායම 8 | මාසය තුළ ලද ආදායමින් අය වූ හිඟය 9 | ඉදිරියට ගෙන යන හිඟය 10 | ඉදිරියට ලැබීම් 11 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | (1+3) | | | ( 2-6) | | | 4 - (5+6)+8 | (7+8) |
| 1 | වරිපනම් බදු 1/11 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 241,987.08 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 |
| 2 | අක්කර බදු 1/12 | 0.00 | 17,952.60 | 0.00 | 0.00 | 1,125.00 | 0.00 | 17,952.60 | 0.00 | 0.00 | 0.00 | 17,952.60 |
| 3 | කඩ කුලී 3/22 | 377,500.00 | 34,250.00 | 1,144,200.00 | 1,521,700.00 | 1,201,950.00 | 17,500.00 | 16,750.00 | 17,500.00 | 0.00 | 319,750.00 | 34,250.00 |
| 4 | වත්කම් බදු 5/23 | 1,553,877.00 | 34,677.50 | 1,545,124.50 | 3,099,001.50 | 1,546,184.50 | 20,057.50 | 14,620.00 | 5,852.50 | 0.00 | 1,538,612.00 | 20,472.50 |
| 5 | ජල ගාස්තු 4/62 | 31,642.00 | 15,668.00 | 52,318.00 | 83,960.00 | 25,070.00 | 4,742.00 | 10,926.00 | 3,046.00 | 0.00 | 57,194.00 | 13,972.00 |
| 6 | ව්‍යාපාර බදු 2/16/2 | 0.00 | 0.00 | 328,800.00 | 328,800.00 | 328,800.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 |
| 7 | කර්මාන්ත බදු 2/16/1 | 0.00 | 0.00 | 10,000.00 | 10,000.00 | 10,000.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 |
| 8 | ඇතම් ව්‍යාපාර බදු 2/16/3 | 0.00 | 0.00 | 3,000.00 | 3,000.00 | 3,000.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 |
| 9 | වෙළඳ බලපත්‍ර 2/31 | 0.00 | 0.00 | 164,000.00 | 164,000.00 | 164,000.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 |
| 10 | විශේෂ බලපත්‍ර ගාස්තු2/31 -II | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 |
| | එකතුව | **1,963,019.00** | **102,548.10** | **3,247,442.50** | **5,210,461.50** | **3,522,116.58** | **42,299.50** | **60,248.60** | **26,398.50** | **0.00** | **1,915,556.00** | **86,647.10** |

**(උ) IV.  2026 මැයි මාසික ආදායම් පුරෝකථන වාර්තාව සලකා බැලීම සඳහා මහා සභාවට ඉදිරිපත් කිරීම.**

**උපලේඛන 04 සඳහා අනිත් පිට බලන්න**

# මාසික අදායම් පුරෝකථන වාර්තාව - පඩුවස්නුවර ප්‍රාදේශීය සභාව

මාසය :- 2026 මැයි

| අනු අකය | ආදායම් ශීර්ෂය | වාර්ෂික ආදායම් ඇස්තමේන්තුව 2026 | | | මාසික ආදායම් පුරෝකථනය | | | අය වී ඇති ආදායම 2026 මාර්තු | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | අය - වැය ලේඛනය අනුව (1) | පරිපූරක මඟින් (2) | එකතුව3(1+2) | පෙර මාසය දක්වා (4) | මාසය තුළ(5) | එකතුව6(4+5) | පෙර මාසය දක්වා (7) | මාසය තුළ (8) | එකතුව 9 (7+8) |
| 1 | වරිපණම් ( 1/11) | 4,700,000.00 | 0.00 | 4,700,000.00 | 3,762,500.00 | 100,000.00 | 3,862,500.00 | 2,358,626.42 | 241,987.08 | 2,600,613.50 |
| 2 | අක්කර බදු ( 1/12 ) | 30,000.00 | 0.00 | 30,000.00 | 5,000.00 | 1,000.00 | 6,000.00 | 1,545.00 | 1,125.00 | 2,670.00 |
| 3 | කසල බදු(2/13) | 30,000.00 | 0.00 | 30,000.00 | 7,500.00 | 2,500.00 | 10,000.00 | 0.00 | 0.00 | 0.00 |
| 4 | කර්මාන්ත බදු(2/16/ii) | 60,000.00 | 0.00 | 60,000.00 | 20,000.00 | 5,000.00 | 25,000.00 | 25,000.00 | 10,000.00 | 35,000.00 |
| 5 | ඇතැම් ව්‍යාපාර බදු(2/16/x) | 3,000.00 | 0.00 | 3,000.00 | 3,000.00 | 0.00 | 3,000.00 | 6,000.00 | 3,000.00 | 9,000.00 |
| 6 | ව්‍යාපාර බදු ( 2/16/i ) | 1,500,000.00 | 0.00 | 1,500,000.00 | 1,125,000.00 | 45,000.00 | 1,170,000.00 | 872,400.00 | 328,800.00 | 1,201,200.00 |
| 7 | බලපත්‍ර ගාස්තු ( 2/31/i) | 1,400,000.00 | 0.00 | 1,400,000.00 | 900,000.00 | 200,000.00 | 1,100,000.00 | 332,584.30 | 164,000.00 | 496,584.30 |
| 8 | විශේෂ බල:ගාස්තු(2/31/x) | 320,000.00 | 0.00 | 320,000.00 | 5,000.00 | 155,000.00 | 160,000.00 | 0.00 | 0.00 | 0.00 |
| 9 | කඩ කුළී ( 3/22 ) | 12,192,000.00 | 0.00 | 12,192,000.00 | 4,064,000.00 | 1,016,000.00 | 5,080,000.00 | 2,008,900.00 | 1,201,950.00 | 3,210,850.00 |
| 10 | ජංගම අලෙවි කුටි( 3/22-i) | 303,600.00 | 0.00 | 303,600.00 | 101,200.00 | 25,300.00 | 126,500.00 | 99,000.00 | 26,400.00 | 125,400.00 |
| 11 | පූජාභූමි වෙළඳ කුටි(3/22-ii) | 720,000.00 | 0.00 | 720,000.00 | 240,000.00 | 60,000.00 | 300,000.00 | 0.00 | 0.00 | 0.00 |
| 12 | ත්‍රි රෝද රථ නැවතුම් ගාස්තුව (03/43Xv) | 150,000.00 | 0.00 | 150,000.00 | 50,000.00 | 12,500.00 | 62,500.00 | 15,600.00 | 0.00 | 15,600.00 |
| 13 | ජල ගාස්තු(4/62/i,i) | 680,000.00 | 0.00 | 680,000.00 | 211,668.00 | 52,917.00 | 264,585.00 | 76,412.00 | 25,070.00 | 101,482.00 |
| 14 | සතිපොල බදු (5/22/i/iii/iV ) | 11,400,000.00 | 0.00 | 11,400,000.00 | 3,800,000.00 | 950,000.00 | 4,750,000.00 | 1,909,690.00 | 1,089,070.00 | 2,998,760.00 |
| 15 | බදු කුළී ( 5/23 ) | 20,000,000.00 | 0.00 | 20,000,000.00 | 6,294,000.00 | 1,958,000.00 | 8,252,000.00 | 1,722,517.50 | 1,546,184.50 | 3,268,702.00 |
| 16 | සතිපොල බහු.කාර්.ගොඩ 5/25/1/ii | 50,000.00 | 0.00 | 50,000.00 | 20,000.00 | 0.00 | 20,000.00 | 0.00 | 0.00 | 0.00 |
| 17 | විනෝද බදු ( 6/15 ) | 750,000.00 | 0.00 | 750,000.00 | 250,000.00 | 62,500.00 | 312,500.00 | 58,000.00 | 48,000.00 | 106,000.00 |
| 18 | ප්‍රජා ශාලා/ක්‍රීඩා පි(6/25/ii/v) | 100,000.00 | 0.00 | 100,000.00 | 50,000.00 | 0.00 | 50,000.00 | 56,000.00 | 49,500.00 | 105,500.00 |
| | එකතුව | **54,388,600.00** | **0.00** | **54,388,600.00** | **20,908,868.00** | **4,645,717.00** | **25,554,585.00** | **9,542,275.22** | **4,735,086.58** | 14,277,361.80 |

**(උ) V. 2026 මාර්තු මාසික වියදම් පුරෝකථන වාර්තාව සලකා බැලීම සඳහා මහා සභාවට ඉදිරිපත් කිරීම.**

**උපලේඛන 04 සඳහා අනිත් පිට බලන්න**

# මාසික වියදම් පුරෝකථන වාර්තාව - 2026 මාර්තු

| අනු අංකය | වැය ශීර්ෂය | වාර්ෂික වියදම් ඇස්තමේන්තුව | | | වියදම් පුරෝකථනය | | | වැය කල මුදල | | | අතිරික්තය/ ඌනතාවය |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | අයවැය ලේඛනය | වැය ශීර්ෂ මාරු කිරීම / පරිපූරක | එකතුව | මාසය මුලදී | මාසය තුලදී | එකතුව | මාසය මුලදී | මාසය තුලදී | එකතුව | |
| 1 | වැටුප් දීමනා | 155,557,000.00 | | 155,557,000.00 | 25907000 | 12,950,000.00 | 38,857,000.00 | 21,318,196.14 | 11715891.62 | 33,034,087.76 | 5,822,912.24 |
| 2 | ගමන් වියදම් | 935,000.00 | | 935,000.00 | 105,000.00 | 50,000.00 | 155,000.00 | 137,565.00 | 50660.00 | 188,225.00 | (33,225.00) |
| 3 | සැපයුම් හා උපකරණ | 18,846,500.00 | | 18,846,500.00 | 1,850,000.00 | 2,100,000.00 | 3,950,000.00 | 819,529.00 | 1504928.00 | 2,324,457.00 | 1,625,543.00 |
| 4 | ප්‍රාග්ධන වත්කම් අළුත් වැඩියාව හා නඩත්තුව | 26,306,000.00 | | 26,306,000.00 | 60,000.00 | 2,000,000.00 | 2,060,000.00 | 956,230.99 | 1712444.15 | 2,668,675.14 | (608,675.14) |
| 5 | ප්‍රවාහන සම්බන්ධතා , අවශ්‍යතා හා වෙනත් සේවා | 7,587,000.00 | | 7,587,000.00 | 700,000.00 | 300,000.00 | 1,000,000.00 | 201,786.80 | 252370.05 | 454,156.85 | 545,843.15 |
| 6 | පොලී ගෙවීම් , ලාභාංශ සහ ප්‍රසාද මුදල් | - | | - | - | - | - | - | 0.00 | - | - |
| 7 | ආධාර මුදල් ,දායක මුදල් හා සහනාධාර | 8,681,000.00 | | 8,681,000.00 | 400,000.00 | 500,000.00 | 900,000.00 | 38,542.81 | 18500.00 | 57,042.81 | 842,957.19 |
| 8 | විශ්‍රාම වැටුප් ,විශ්‍රාම ප්‍රතිලාභ හා පාරිතෝෂිත | 532,500.00 | | 532,500.00 | 88,750.00 | 44,375.00 | 133,125.00 | 29,027.03 | 34881.43 | 63,908.46 | 69,216.54 |
| 9 | උපකරණ වැය | 52,025,000.00 | | 52,025,000.00 | 2,500,000.00 | 4,100,000.00 | 6,600,000.00 | 93,816.28 | 39,913.50 | 133,729.78 | 6,466,270.22 |
| 10 | ණය ආපසු ගෙවීම් | - | | - | - | | - | - | | - | - |
| | **එකතුව** | 270,470,000.00 | | 270,470,000.00 | 31,610,750.00 | 22,044,375.00 | 53,655,125.00 | 23,594,694.05 | 15,329,588.75 | 38,924,282.80 | 14,730,842.20 |

**(උ).  රැස්වීම කැඳවීමේ දැන්වීමේ වෙනත් කාරණා කිසිවක් දක්වා ඇත්නම්, ඒ කරුණු එහි දක්වා ඇති අනුපිළිවෙලට හෝ විශේෂ හේතු නිසා ප්‍රාදේශීය සභාව විසින් තීරණය කරන අනුපිළිවෙලට - නැත.**

න්‍යාය පත්‍රානුකූලව ගරු සභාවේ කටයුතු අවසන් වූ බවත්,සභාවේ කටයුතු සාර්ථක කර ගැනීම සඳහා දායක වූ සැමට ස්තූතිය පිරිනමන බවත් ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ප.ව.2.20 ට පමණ ගරු සභාවේ කටයුතු අවසන් කරන ලදී.

2026.05.12 දින පැවති මහා සභා රැස්වීම් වාර්තාව ගරු සභාවේ  එදින පැමිනි සිටි සභිකයන් විසින් සභා සම්මත කරන ලදි.

.